ධරණී
ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2022 මැයි 11 වන බදාදා
දෙවන කාණ්ඩය විසි තුන්වන කලාපය
මිල රු. 70 යි




## කළු කුමාරයා සොයා දෙන්නෙකුට ගෑස් සිලින්ඩරයක් නොමිලේ

## ජනාධිපති කරන්නේ පිහියෙන් ඇනලා සමාව ඉල්ලනවා වගේ වැඩක්

\- මන්ත්‍රිනී සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ

## කතා නොකරන ජෝඩු පහක් හිතේ හැටියට මගුල් කෑ හැටි

## සාරියෙන් කලිසමට බැස කාර්යාල බිමේ වගා කරන රාජ්‍ය සේවිකාව

## අලිමංකඩ දී දෙතනට එරුණු කිරි පොළවට හැලූ යුද හමුදාවේ විශ්‍රාමික නිලධාරිණියක් කියන කතාව

හර්ෂි අංජුමාලා

■ ඡායාරූපය - සමන් අබේසිරිවර්ධන

# සරල සුන්දර බටහිර මනාලියක්









මේකප්, මල්, පළඳනා ඉස්මතු නොවී මනාලියගේ රුව ඉස්මතු කරන්න උත්සාහ දැරුවා

මල්කළඹ සඳහා යොදාගෙන තිබෙන්නේ රෝස, බේබිස්බ්‍රෙත්, මුතු සහ කොළ කීපයක්

ගවුම මසා තිබෙන්නේ නෙට් සහ ජිපියෝ ලේස් මැටීරියල් එක එකතු කරගනිමින්

ගවුම පුරාවටම විහිදී යන ලෙස ස්ටෝන්ස් අල්ලලා තිබෙනවා. වේල් එක තරමක් දිගට දමා තිබෙනවා



අද අපි ඉදිරිපත් කරන්නේ ගවුමකින් සැරසුණ සුන්දර මනාලියක්. ජාඇල බෝපිටියේ ‘විජිතා සැලෝන්’හි රූපලාවන්‍ය ශිල්පිනී විජිතා ජයනෙත්තියි ඇයව හැඩගන්වා තිබෙන්නේ. විශේෂත්වය වන්නේ මේ බටහිර මනාලිය ලෙස ඇය හැඩ කරන්නේ ඇගේම දියණිය වීම.

“ගවුම මසා තිබෙන්නේ නෙට් සහ ජිපියෝ ලේස් මැටීරියල් එක එකතු කරගනිමින්. ගවුම පුරාවටම විහිදී යන ලෙස ස්ටෝන්ස් අල්ලලා තිබෙනවා. වේල් එක තරමක් දිගට දමා තිබෙනවා.

මනාලිය පැහැපත් සමකින් යුක්ත නිසා මේකප් එක සරලව යොදා තිබෙනවා. ස්වභාවික මේකප් එකක් තමයි භාවිතා කරලා තියෙන්නේ.

කොණ්ඩා විලාසිතාව මගේම නිර්මාණයකට අනුවයි දමා තිබෙන්නේ. ඇයගේ වරලස දිගු නිසා එයින් ප්‍රයෝජනයක් ගෙන කන දෙපස කොටසින් ටිකක් රැගෙන රාත්‍රියේ ස්ප්‍රේ භාවිතා කරමින් ඔතා රොඩ් ආකාරයෙන් ක්ලිප් කර තබාගත්තා. හිසේ පිටුපස කොටස බන් එකක් ආකාරයට සකස් කරමින් හිස් මුදුන කොටස බැක්කෝම් කර මදක් උස් ආකාරයට රඳවා බන් එකට වේල් එක රැඳෙව්වා. බන් එක වැහෙන්න මල්කිනිති දෙකක් කොණ්ඩයට ගසා තිබෙනවා. හිස් මුදුනේ ඔටුන්නක් තබා ඔතාගත්තු කොණ්ඩ කොටස ගලවා කර්ල් කර තිබෙනවා.

මල්කළඹ සඳහා යොදාගෙන තිබෙන්නේ රෝස, බේබීස්බ්‍රෙත්, මුතු සහ කොළ කීපයක්. මෙයත් මාගේ නිර්මාණයක්.

ආභරණ ගැන කියනවා නම් සරල මුතු පොටක් දෙකට නවා පැළඳ සිටින පෙන්ඩනයට එය දමා කරට දමා තිබෙනවා. අතට වළල්ලක් පළඳවා තිබෙනවා.

සීයට සීයක්ම සරල මනාලියක් ලෙස ඇයව දකින්නයි මට අවශ්‍ය වුණේ. මේකප්, මල්, පළඳනා ඉස්මතු නොවී මනාලියගේ රුව ඉස්මතු කරන්න නිතරම මම උත්සාහ කරනවා.”



මනාලිය හැඩගැන්වීම - රූපලාවන්‍ය ශිල්පිනී
විජිතා ජයමාන්න
විජිතා සැලෝන්

ඡායාරූප -
ප්‍රශංග රත්නායක

සම්බන්ධීකරණය -
ක්‍රිෂාන්ත පුෂ්පකුමාර
0763113839



අද අපිට ඩොලරුත් නැහැ, රුපියලුත් නැහැ

# ජනාධිපති කරන්නේ පිහියෙන් ඇනලා සමාව ඉල්ලනවා වගේ වැඩක්

## පාර්ලිමේන්තු මන්ත්‍රිනී, විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ

රට මුහුණදෙමින් සිටින ආර්ථික අර්බුදයේ තරම මේ වනවිට කිසිවෙකුටත් රහසක් නොවේ. ඒ සඳහා විසඳුම් සෙවීමේදී මූලිකත්වයේලා සැලකිය යුතු කරුණු ගැනත්, බත් මුට්ටිය පිසගැනීමේ සිට සාමාන්‍ය ජනතාව මුහුණදෙන දුෂ්කරතා ගැනත් පාර්ලිමේන්තු මන්ත්‍රිනී, විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය සමඟින් කළ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරින් මෙම ලිපිය සැකසේ.

**අපේ රට අද බරපතළ ආර්ථික ප්‍රපාතයකට ඇදවැටී අවසන්. ගෘහනියක්, මවක් හැටියට මේ පිළිබඳව ඔබේ කියැවීම කෙබඳුද?**

ඇත්තටම ඉතාම බරපතළ ඒ වගේම දුක්ඛිත තැනකටයි රට ගමන් කරමින් තිබෙන්නේ. විශේෂයෙන් අම්මලා කියන්නේ ආහාර සුරක්ෂිතතාව ගැන ගොඩක් කල්පනා කරන කොටසක්. අපි දන්නවා ඉස්සර අපේ අම්මලා උයන්න ගන්න හාල් ටිකෙන් මිටක් වෙනම මුට්ටියක දලා ඉතිරි කරනවා. ඒ මොනයම් හරි ආපදා දවසක් ආවොතින් එදාට පරිභෝජනයට ගන්න. ඒ අම්මගේ දැක්මට වඩා එහා ගිය ආර්ථික දැක්මක් රට කරවන දේශපාලනඥයා සතුවිය යුතුයි. ඒ වෙන්න ඕන වගකීම ඉටු නොවීම හමුවේ අද අපිට ඕන ආහාර ටික නැහැ. බඩු මිල අහස උසට නැගලා. එක්දහස් හාරසියයට තිබුණු ගෑස් එක රුපියල් පන්දහක් වෙලා. දරුවන්ගෙ අධ්‍යාපනය කඩා වැටිලා. බෙහෙත් ටික නැති වුණාමත් වද විඳින්න වෙන්නේ අම්මලාටයි. අපි දීර්ඝ කාලයක් තිස්සේ ණය අරගෙන කාපු කතාව ඇත්ත. ඒත් මේ වර්තමාන අර්බුදයට නම් වගකිව යුත්තේ පැහැදිලිවම මේ ආණ්ඩුවයි.

**ඇයි ඔබ එහෙම කියන්නේ? ඔබත් එම ආණ්ඩුවේ කොටස්කාරිනියක් නේද?**

ඔව්. මමත් ඇතුළුව පක්ෂ විපක්ෂ හැම දේශපාලනඥයෙක්ම, ආර්ථිකය සම්බන්ධව තීන්දු තීරණ ගත් හැමදෙනෙක්ම ඊට වගකිව යුතුයි. ඇත්තටම වර්තමාන මුදල් ඇමති අලි සබ්‍රි මහත්තයා මේ ඇත්ත රටට පෙන්නලා දුන්නට ස්තූතිවන්ත වෙන්න ඕන. ඒ කතාව හරියට ඇහුවනම් අපි වැටිලා ඉන්න ආර්ථික ප්‍රපාතයේ තරම මොනතරම්ද කියනෙක පැහැදිලි වෙනවා. ඔහු එම කතාවෙදි කියනවා, අපට මේ ආර්ථික අගාධයෙන් ගොඩ එන්න අවුරුදු දෙකක් යාවිද ඊට වඩා කාලයක් යාවිද කියලා කියන්න බැහැ කියලා. ඇත්තටම අද වෙනකොට රට හමුවේ තියෙන යථාර්ථය ඒකයි. මේවා බලධාරීන් නිලධාරීන් කලින් දැකිය යුතු දේවල්. මේ තත්ත්වය අපි දැක්කා. වාහනයක් ප්‍රපාතයට යන එක වළක්වා ගන්න නම් තිරිංග තද කරලා අල්ලගන්න ඕන. ආර්ථිකයත් ඒ වගේ. මම කොවිඩ් පාලන රාජ්‍ය අමාත්‍යවරිය විදියට ඉඳිද්දි ඖෂධ හිඟය ගැන කියලා විදෙස්ගත ධානපතියන්ගෙන් ඖෂධ ටික ඉල්ලුවම ඒකට ඇතැමුන් මට හිනාවුණා. අද අත්‍යවශ්‍ය ඖෂධ රැසක් රට තුළ නැහැ. බොහොමයක් සැත්කම් කරනෙක කල්දලා ජනතාවගේ ජීවිත අනතුරේ හෙළලා.

මම සියලු කොළ, පළා වර්ග ටික මගේ ගෙවත්තේ වගා කරලා තියෙනවා.

**කොරෝනා කාලේ ගඟට මුට්ටි දැම්මා. දැන් ඉන්දියාව ඖෂධ ගන්න දුන් මුදල්වලින් ආණ්ඩුව යකඩ බට අරන් ස්ථිර මාර්ග බාධක හදනවා කියලා චෝදනාවක් තියෙනවා?**

ඒ චෝදනාව ගැන නම් මම හරියටම කියන්න දන්නේ නැහැ. කොහොම නමුත් රටකට ආහාරපාන ටික වගේම ඖෂධත් අත්‍යවශ්‍යයි. මුට්ටි දන මිථ්‍යාව ඇතුළේ නෙවෙයි ඇත්තට මුහුණ දෙන්න අපිට හොඳටම කාලය තිබුණා. මම නැවතත් කියන්නේ මේ ආණ්ඩුව මේ අර්බුදයට වගකිව යුතුයි. ජනතාව අද ජීවත්වෙන්නේ මහා ලොකු අස්ථාවර බවක් එක්ක. හෙට දවස මොනවා වේවිද කියන බය හැමෝටම තියෙනවා.

**රසායනික පොහොර ප්‍රශ්නෙදි, තමන්ට වැරදුණා ඒ ගැන සමාවෙන්න කියනෙක ජනාධිපතිවරයා කිව්වා. හැබැයි ඒ ප්‍රශ්නෙටත් තවම විසඳුමක් නැහැ? ගොවියෝ ගොවිතැනින් ඉවත්වෙමින් ඉන්නවා.**

අද එකිනෙක ගැටගැහුණු ප්‍රශ්න වැලක අපි ඉන්නේ. පොහොර ගැන ගත් තීන්දුව වැරදියි. ඊට සමාවෙන්න කිව්වට වැඩක් නැහැ. ඒක මිනිහෙකුට මැරෙන්න පිහියෙන් ඇනලා ඇවිත් සමාවෙන්න කියලා කියනවා වගේ වැඩක්.

කොවිඩ් පාලන රාජ්‍ය ඇමති කාලේ ධානපතියන්ගෙන් ඖෂධ ඉල්ලුවහම සමහරු මට හිනාවුණා

අද ඒ තීරණය නිසා මිලියන විසිදෙකක ජනතාවක් පීඩා විඳිනවා. මට මතකයි 70-80 ලෝකෙම ආහාර අර්බුදයක් ඇතිවුණ කාලේ සිරිමාවෝ මැතිනිය පාසල් පිට්ටනිවල පවා අල බතල වගා කරන්න කියලා කිව්වා. එහෙමයි එදා ආහාර සුරක්ෂිතතාව ඇති කළේ. අපිටත් අද ප්‍රශ්නයක් තියෙන බව ජනතාව දන්නවා. ගෙදර තියෙන පුංචි ඉඩේ හරි මොනවාහරි වගා කරගන්න එක වැදගත්. මොකද අපිට මේ අර්බුදයට මූණ දෙන්නම වෙනවා.

**ඔබේ ගෙවත්තේ එවැනි ආදර්ශයක් තියෙනවද?**

මම සියලු කොළ, පළා වර්ග ටික මගේ ගෙවත්තේ වගා කරලා තියෙනවා. ඒක මම කළේ අද ඊයෙක නෙවෙයි. වස විස නැති එළවලු, කොළ, පලා ටික කෑම වැදගත් නිසයි එහෙම කළේ. මම කොළ, පළා වවද්දි මගේ තව ඥාතියෙක් එළවලු වවනවා. අපි ඒවා හුවමාරු කරගන්නවා.

උයන්න ගෑස් එක ගන්න එක අද හුඟදෙනෙකුට ප්‍රශ්නයක්. එහෙමයි කියලා අම්මා කෙනෙකුට දරුවෝ බඩගින්නේ තියන්න බැහැ. ගමේ නම් දර ලිපක්, පොල්කටු අඟුරු දන ලිපකට හරි යන්න වෙනවා. තරුණ දරුවෝ අරගල, හර්තාල් කරලා සැබෑ නායකත්වයක් හොයද්දි පුළුවන් විදියට අපි අපේ දායකත්වය දෙන්න ඕන. රට අස්ථාවර කිරීම තවදුරටත් සුදුසු නැහැ. හැමෝම වරප්‍රසාද අයින් කරලා මේ වෙලාවේ රට ගැන හිතන්න ඕන. IMF යන්නත් රටේ ස්ථාවර බවක් තියෙන්න ඕන. ඒ අතරේ අරගල කළාට කමක් නැහැ. හැබැයි රට තව තවත් අස්ථාවර වුණොත් ඒ ගැඹුරින් ගොඩ එන්න අපට සෑහෙන කාලයක් යනවා.

**ඒ ස්ථාවරය ඇති කරන්න මේ ආණ්ඩුවට පුළුවන්ද?**

කොහෙත්ම නැහැ. පාර්ලිමේන්තුවේ ඉන්න සියල්ලන්ම මෙය අවබෝධ කරගත යුතුයි. අද අපට ඩොලරුත් නැහැ. රුපියලුත් නැහැ. ජනතාව ඉල්ලන දේශපාලන වෙනස ඉක්මනින් වෙනවා නම් හොඳයි. රට ස්ථාවර කරගන්න එය හේතුවක්. අපට එසේ ඉක්මනින් යා යුතු ගමනක් දැන් තියෙන්නේ. මේ ආණ්ඩුවට ඉල්ලා අස්වෙන්න කාලේ හරි. සර්ව පාර්ෂික හෝ ඊට සමාන විසඳුමක් ගෙනෙන දේශපාලන විසඳුමකට යා යුතුයි.

එතැනදි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අපි, අපි ගැන හිතලා නෙවෙයි තීන්දු තීරණ ගන්න ඕන. රට ගැන හිතලයි. ඒ නායකත්වය තුළ අපිට IMF කලින් යන්න තිබුණා. එහෙම වුණානම් අද මේ තත්ත්වය වෙන්නේ නෑ කියන එක නෙවෙයි නායකත්ව දැක්ම කියන්නේ. අපි ඉතා ඉක්මනින් මේ රට නිවැරදි දිශානතියට ගත යුතුයි. තරුණ දරුවෝ ඒ වෙනුවෙන් දේශපාලනඥයන්ට පීඩනයක් එල්ල කිරීම වරදක් නොවෙයි.

දීපා වසන්ති එදිරිසිංහ



# සමහරු ඩොලර් එක වගේ ගණන් උස්සද්දී රුපියලක් තරමටවත් බාල්දු නොවී ඉන්න ඉගැන්නුවට පිං අම්මේ...

ගමේ ගොඩේ ගෑනියෙක් වෙලත් මගේ සතුට උගහට නොතියා නම්බුව නම් මොන බම්බුවද කියලා හිතන්න උඹට පුළුවන් වුණු එකම මට කොච්චර සැනසීමක්ද අම්මේ...

මැක්සිම් ගෝර්කිගෙ පොතේ කියන විදියට රුසියානු විප්ලවයට සම්බන්ධ වුණු පාවෙල්ගෙ අම්මාට වැඩිය උඹේ හිත හයියයි කියලා අද මට හිතෙනවා

## අම්මාට ලියමි,

මං පොඩි එකී කාලෙම අප්පච්චි නොඑන ගමන් ගියාම, නොකිව්වට මොකද උන්දෑ නැති අඩුව මහමෙරක් වගේ මට දැනුණේ. හැබැයි මයෙ අම්මේ, ඒ ගැන උඹට නොකීවේ උන්දැගෙ මළගමින් පස්සේ බත් මුට්ටි උඩින් යන්නෙ නැති ගෙදරක උඹ වෙනදට වඩා සැනසීමෙන් ඉන්නවා මේ ඇස් දෙකට දැකපු නිසා.

අම්මට සිංහලේ තියෙන නොසරුප්ම වචනවලින් බැණ්නට මොකද උන්දෑ කවදත් මට කට ඇරියෙ 'රත්තරන් පුතේ' කියලානේ. එහෙව්වට ඉඳපු අප්පච්චි එකපාර හොරු අරන් ගියා වගේ නැති වුණාම මයෙ අම්මපල්ලා ඒ කාන්සිය මකාගන්න පුංචිකමට මාත් නොකරපු දෙයක් නෑ. වෙලාවකට මං අඟුරු කෑලි අරගෙන උන්දැව බිත්තියෙ ඇන්ද. තව වෙලාවකට පිටු පිරෙන්න හිතට එන හැමදේම ලිව්වා. හැබැයි ටිකක් කරදැඩු උස්මහත් වෙනකොට මං ඒ ඔක්කොම පැත්තක තියලා උන්දෑ වගේ මිනිහෙක් හෙව්වා.

මං හිතුවෙ කවදහරි මාව සහේට ගන්න මිනිහා අප්පච්චි වගේ මාව රකින එකෙක් වෙන්න ඕන කියලා. කොන්දේසි විරහිතව උන්දෑ වගේ මට ඇඟෑලුම්කම් පාන්න ඕන කියලා. උන්දෑ කටගොන්නක් බීගෙන ඇවිල්ලා උඹේ කෙහෙවල්ලෙන් ඇදලා තඩිබාපු විදියට මට අත උස්සන්නෙ නැති එකෙක් වෙන්ඩ ඕන කියලා. ඒ වගේම පිටස්තර ගෑනු නිසා අප්පා අම්මට ගිනි දුන්නු විදි යට මට ගිනි නොදෙන එකෙක් වෙන්න ඕන කියලා.

ඔහොම කාලෙ ගතවෙද්දී උන්දැගෙ මතකෙත් එක්කම ජීවත් වුණු නිසාද කොහෙද අප්පච්චිගෙ වගේ රැවුලක් තියෙන එකෙක් දැක්කත් මං වහවැටුණා. උන්දැගෙ උස මහත තියෙන, උන්දැ වගේම ආදර බස් තෙපලපු සමහර පිරිමින්ට මං රැවටුණා. රත්තරන් කියලා කඩු තුඩු පපුවට ඇනගන්නැහේ උඹ එපා කියද්දි වරින් වර ජීවිතේට වද්දගනිපු මිනිස්සු නිසා මට පාර වැරදුණා.

එහෙම වෙලාවට අනේ අප්පච්චි හිටියනම් කියලා හූල්ල හූල්ල හිටියා මිසක් මං වෙනුවෙන් ජීවත් වුණු උඹට පිං කියලා කියන්න මට අමතක වුණා අම්මේ. හීනවලින් ඇහැරිලා හිතේ හැටියට අඬන්න ඕන වුණාමයි මට ආපහු උඹව මතක් වුණේ. ඒත් එහෙම වෙලාවට නාඩා ඉන්න මං හිත හදගත්තේ උඹ ගහක් ගලක් වගේ හිත තද කරගෙන ජීවත් වුණු විදිය ගැන හිතලා.

මැක්සිම් ගෝර්කිගෙ පොතේ කියන විදියට රුසියානු විප්ලවයට සම්බන්ධ වුණු පාවෙල්ගෙ අම්මාට වැඩිය උඹේ හිත හයියයි කියලා අද මට හිතෙනවා. පිරිමි දරුවෙක් එක්ක මාලිගාවක තනිවෙච්ච රාහුල මාතාවට වඩා ගෑනු දරුවෙක් එක්ක පැල්පතක තනිවෙච්චි උඹට ආපු කරදර, අභියෝග වැඩියි. ගතින් විතරක් නෙවෙයි හිතින්වත් උඹ අප්පච්චිව ඉක්මවලා ගියේ නැති බව මං දන්නවා. හැබැයි මිනිහා මැරිච්ච ගෑනි කියන ලේබලෙත් ගහගෙන ගමේ එකාලා කියන කයි කතන්දරත් ඔක්කොම අහගෙන ඉඳපු උඹට නකුල මාතාවට වගේ ප්‍රශස්ති ගායනා තිබුණෙ නෑ.

දරුවන්ගේ සතුට වෙනුවෙන් තමන්ගේ සතුට දන්දෙන්න හැම අම්මා කෙනෙකුටම බෑ. කසාද ජීවිත ඇතුළෙ අටෝරාශියක් දුක් විඳින දූවරු දැක දැකත් ගුටි කකා හරි ඉඳපන් කියලා සමහර අම්මලා කියන්නේ සනුහරේ නම්බුව ගැන හිතලා. හැබැයි ගමේ ගොඩේ ගෑනියෙක් වෙලත් මගේ සතුට උගහට නොතියා නම්බුව නම් මොන බම්බුවද කියලා හිතන්න උඹට පුළුවන් වුණු එකම මට කොච්චර සැනසීමක්ද අම්මේ...

අනිත් එක තමයි ගමෙන් කොළඹට ආපු ගොඩක් කෙල්ලන්ට වැරදුණේ උන් ආපු කාරණාව අමතක කරලා අනිත් හැමදේටම කලියෙන් කොළඹට පෑහෙන්න ගියපු හින්ද. හැබැයි මේ නන්නාඳුනන නගරේ ඉංගිරිසියෙන් කතා කරන විතරක් නෙවෙයි කන බොන, ඇවිදින උන් අස්සේ ඉහ ගහගෙන ඉන්න මට පුළුවන් වුණේ විශ්වවිද්‍යාලෙකින් ඉගෙනගත්තට වඩා උඹ කියාදීපු ජීවිත පාඩම් නිසා. එක පාරක් පච්චයක් කොටාගෙන, කොණ්ඩෙත් පාට කරගෙන කොළඹ ඉඳලා ගමට ආවට පස්සේ ගමේ එකාලා කට කැඩිච්ච කතා කිව්වට උඹ මොකුත්ම නොකිව්වේ උන්ගෙ හිත්වලට වඩා උඹේ හිත ලොකු හින්දද බර වැඩි හින්දද කියන්න මම දන්නෙ නෑ. හැබැයි එහෙම තහංචි නොදී ජීවිතේ විඳින්න දීපු නිදහස හින්දයි ලොකු ගෑනියෙක් විදියට මට මේ සමාජෙට නිරාවරණය වෙන්න පුළුවන් වුණේ කියලා මම අදටත් විශ්වාස කරනවා.

වෛවාරණ විච්චූර්ණ මොනවා කළත් නූල කැඩිච්ච සරුංගලයක් වගේ ඉබාගාතෙ පාවෙන්න නොදී මේ මහ සංස්කෘතිය ඇතුළෙ පැළවෙච්ච සංස්කෘතික ගෑනියෙක් විදියට ජීවත් වෙන්න කියාදුන්නට උඹ ගැන මට තියෙන්නෙ ආදරේට වඩා ලොකු ගෞරවයක්.

ඒ කොයි එකටත් වඩා අලි දෙන්නම්, කොටි දෙන්නම්, පණ දෙන්නම් කියලා ආපු එවුන් ඩොලර් එක වගේ ගණන් උස්සද්දී රුපියලක් තරම්වත් බාල්දු නොවී, යන උන්ට යන්න දෙන්න ඕන කියලා මං ඉගෙනගත්තෙ පතපොතින් නම් නෙවෙයි. ඒ නිසා කවුරු ඇතත් නැතත්, කවුරු ආවත් ගියත් ඔලුව කෙළින් තියාගෙන ජීවත් වෙන්න කියලා දුන්නට නම් මැරෙනතුරාවටම මං උඹට ණයගැතියි අම්මේ...

පොඩ්ඩී

සුරා



# සමහර කලාකාරයෝ කඩේ ගියපු යෑමට අරගල බිමට එන්න ලැජ්ජා ඇති

## දුලීකා මාරපන

**දුලීකා මාරපන කියන්නේ අපේ රටේ ඉන්න ජනප්‍රිය සහ ජ්‍යේෂ්ඨ රංගන ශිල්පිනියක්. අපි සමහර වෙලාවට කතාවටත් කියනවනේ 'කට කෑවත් කියන්න තියෙන දේ කියනවා' කියලා. දුලීකාත් ඒ වගේ කෙනෙක්. ඒ නිසා ඉන්නෙ අරගල භූමියේ බව දැන දැනත් අපි දුලීකාට කතා කළේ ඒ පැත්තෙ විස්තර ටිකක් දැනගන්න.**

**දුලීකා මේ දවස්වල අරගලය නිසා රඟපෑම අතෑරලාද? නැත්නම් ඇතෑරිලද?**

ඔය දෙකෙන් එකක්වත් වෙලා නෑ. රටේ සමස්තය කඩාගෙන වැටිලයි තියෙන්නේ. ටෙලිනාට්‍ය කලාවට වගේම චිත්‍රපටි කලාවටත් ඒක අදාළයි. මේ රටේ හැමෝටම තියෙන ගැටලුව කලාකාරයො විදියට අපිටත් බලපාලා තියෙනවා. හැබැයි මම රංගනය අතෑරලා හෝ මට රංගනය ඇතෑරිලා නෑ.

**අරගල බිමට ඔබ එන්නේ අවංකවමද? නැත්නම් නාවොත් ප්‍රතික්ෂේප වෙයි කියන බයටද?**

එහෙම එන අය කවුද කියලා ලේසියෙන්ම අඳුරගන්න පුළුවන්. ඒත් මං එන්නේ අවංකවමයි. මොකද මං කවදාවත් කිසිම පුද්ගලයෙක් හෝ පක්ෂයක් වෙනුවෙන් පෙනී හිටපු කෙනෙක් නෙවෙයි. දුලීකා මාරපන කියන්නේ හැමදාම ජනතාව පැත්තේ හිටගත්ත කෙනෙක්. ඒක එදත් එහෙමයි අදත් එහෙමයි හෙටත් එහෙමයි.

**කෙළින් කතා කරන එක පුංචි කාලේ ඉඳන් තිබුණු පුරුද්දක්ද?**

ඔව්. මං කවදාවත් පිටිපස්සට ගිය කෙනෙක් නෙවෙයි. හැංගිලා හිටපු කෙනෙකුත් නෙවෙයි. මගේ දෙමව්පියෝ මට පුංචි කාලේ ඉඳන්ම කියලා දුන්නේ වැරැද්දක් දැක්කම ඒ දැකපු වෙලාවෙම නැගී සිටින්න කියලා.

**හැබැයි පහුගිය දවසක එක්තරා අමාත්‍යවරයෙක් ඉලක්ක කරගෙන ඔබ කියපු කතාවකට ගොඩක් අයගේ හිත් රිදුණා?**

ඒ ගැන ඕන කෙනෙක්ට ඕන දෙයක් කියන්න පුළුවන්. මං කවුරුත් රිදෙව්වේ නෑ. ඒත් මං කියපු කතාවේ සමහර වචන අරන් ඇතැම් අය රිද්දගත්තා. ඒ ගැන මම පස්සේ තේරුම් කළා. ආයෙත් ඒකේ එල්ලිලා ඉන්න මට උවමනාවක් නෑ. ඒක එතැනින් ඉවරයි.

**ඔබට නම් ජනප්‍රිය නිළියක් නිසා තෙල් පෝලිම්වල, ගෑස් පෝලිම්වල ඉන්න වෙන්නේ නැතුව ඇති නේද?**

මං නිළියකගේ භූමිකාවේ ඉන්න රඟපාන වෙලාවට විතරයි. ගෑස් පෝලිමේදි, තෙල් පෝලිමේදි මං මේ රටේ සාමාන්‍ය පුරවැසියෙක්. ඒ නිසා අදටත් මං ඔය තියෙන හැම පෝලිමකම රැයක් දවාලක් නැතුව ඉඳලා තියෙනවා.

> **දුලීකා මාරපන කියන්නේ හැමදාම ජනතාව පැත්තේ හිටගත්ත කෙනෙක්. ඒක එදත් එහෙමයි අදත් එහෙමයි හෙටත් එහෙමයි**



> **මං කවුරුත් රිදෙව්වේ නෑ. ඒත් මං කියපු කතාවේ සමහර වචන අරන් ඇතැම් අය රිද්දගත්තා**

**ගොඩාක් කලාකරුවෝ මේ වෙනකොට අරගල බිමේ වුණාට තවත් කලාකරුවන් පිරිසකට තාමත් එහි රස්නය දැනිලා නෑ වගේ නේද?**

ඒ අය කඩේ ගියපු යෑමට රස්නෙ දැනුණත් අරගල බිමට එන්න ලැජ්ජා ඇති. මං නම් කියන්නේ කලාකරුවා ජනතාව පැත්තෙයි හිටගන්න ඕනේ. කඩේ යන එක කලාකරුවෙකුට සුදුසු දෙයක් නෙවෙයි.

**අපි දැක්කා ඔබේ ක්ෂේත්‍රයේම එක්තරා චරිතයක් කියලා තිබුණා අරගල බිමේ කලාකරුවෝ රඟපානවා කියලා. ඒ ගැන මොකද කියන්නේ?**

රඟපාන කෙනා අරගලය කළ යුත්තේ රඟපෑමෙන්. ගීත ගයන කෙනා අරගලය කළ යුත්තේ ගීත ගායනයෙන්. චිත්‍ර අඳින කෙනා අරගලය කළ යුත්තේ චිත්‍ර ඇඳීමෙන්. ඒ ඒ විදිහට තම තමන්ගේ වෘත්තියේ ඉඳනුයි මේ අරගලය කරන්න ඕනේ. සාමකාමී අරගල එහෙමයි.

**ඔබ පෞද්ගලිකව හිතන විදිහට ලංකාවට වැරදුණේ කොතැනද?**

මේ රටට සර්වජන ඡන්ද බලය ලැබුණේ කවද්ද එදා ඉඳන් අපේ රටට වැරදුණා. කක්කුස්සි පෝච්චියට, ටකරං තහඩුවට රැවටෙන මිනිස්සු ටිකක් හැදුනේ ඒකයි. ඒ නිසා ව්‍යවස්ථාව වෙනස් විය යුතුයි. පුද්ගල වන්දනාව වෙනුවට මේ රටේ ප්‍රතිපත්ති වන්දනාවක් බිහිවිය යුතුයි කියන තැන මං ඉන්නවා.

**මේ වෙනකොට අරගලය යම්තාක් දුරකට හරි ජයග්‍රහණය කරලා තියෙනවා කියලා ඔබ හිතනවද?**

දැනටමත් අපි අරගලයෙන් ජයග්‍රහණ අරගෙනයි තියෙන්නේ. ආයෙත් කිසිම පාලකයෙකුට ජනතාවට බොරු කරන්න බෑ. හොරකම් කරන්න බෑ. කක්කුස්සි පෝච්චියට, ටකරං තහඩුවට රැවටුණු යුගයක් ආයෙත් එන එකක් නෑ. ඉතින් ඒක ජයග්‍රහණයක් නෙවෙයිද?

**ඔබේ රසික රසිකාවියෝ කවදා හරි ඔබට දේශපාලනයට එන්න කියලා ඉල්ලීමක් කළොත් ඔබ එනවද?**

රසික රසිකාවියෝ කාලෙක ඉඳන් ඔය ඉල්ලීම මගෙන් කරනවා. ඒත් කවදාවත් දේශපාලනේට එන්න මගේ කැමැත්තක් නෑ. ඒත් පොඩි මිනිහට වැරැද්දක් වෙන්නේ කොතැනද අසාධාරණයක් වෙන්නේ කොතැනද මං එතැන ඉන්නවා.

භාතිය වෙඩිවර්ධන

සියලුම මානසික රෝගවලට ලක්වූවන් සහ වැඩිහිටි පුද්ගලයන් සඳහා
වෛද්‍ය ප්‍රතිකාර - පහසුකම් සහිත නේවාසිකාගාර - මානසික වර්ධන ක්‍රියාකාරකම්
අපේක්ෂා මානසික පුනරුත්තාපන හා උපදේශන මධ්‍යස්ථානය - හොරණ
රජයේ ලි.ප. ආයතනය W.H.M 1696
AMDCC
අපේක්ෂා මානසික පුනරුත්තාපන හා උපදේශන මධ්‍යස්ථානය | විමසීම්: 0756046535 / 0715531404



# කතා නොකරන ජෝඩු පහක් හිතේ හැටියට මඟුල් කෑ හැටි







ඒ පසුගිය අප්‍රේල් 29 වෙනිදය. එදින බණ්ඩාරවෙල නාමල් හෝටල් පරිශ්‍රය පේවෙමින් තිබුණේ විවාහ මංගල්‍යයකටයි. එහෙත් වෙනත් මඟුල් ගෙවල්වල නැති මොකක්දෝ අමුතු නිහඬ බවක් එහි තිබූ බව ඒ මඟුල් ගෙදරට ගිය සියල්ලන්ටම දැකගන්නට ලැබුණි. එක් පසෙක අසාමාන්‍ය දිගකින් යුතු මංගල පෝරුවකි. අනෙක් පස එකක් වෙනුවට මඟුල් කේක් කීපයකි. ඒ අසළම ගජරාමෙට හැඳ පැළඳගත් හැඩකාර මනාල යුවළ පහකි. මංගල්‍යයේ විවාහ චාරිත්‍ර සිදුවූයේද අමුතුම පන්නකටය. ඒ හස්ත සංඥාවලිනි. මඟුල් ගෙදර ආරාධිතයන්ට අමුතුම අත්දැකීමක් වූ එහි මුදු පැළඳවීමේ පටන් මනාලියන්ට සුදුවත ඇන්දීම, දෑඟිලි බැඳීම, අතපැන් වැඩීම යනාදී සියලුම පෝරුවේ චාරිත්‍ර සිදුවූයේද එසේය. ඊට හේතුව මේ මනාල ජෝඩු පහම කථන හා ශ්‍රවණාබාධිත සහිත තරුණ තරුණියන් වීමයි.

කථන හා ශ්‍රවණාබාධ සහිත මංගල යුවළ පහක් එකම පෝරුවකට නග්ගවා හස්ත බසින් සියලු මංගල චාරිත්‍ර ඉටුකර කසාද බැන්දවීම පිටුපස වැඩිම බරක් ඉහිලුවේ බණ්ඩාරවෙල සිංහ සමාජයේ ලේකම් විමලසිරි ආරියවංශ මහතාය.

**"අපි මුලින්ම කළේ ඒ තරුණ තරුණියන්ගේ දෙමව්පියන් එක්ක කතාබහ කරපු එක. මොකද එයාලගේ අකමැත්තෙන් අපිට මෙහෙම දෙයක් කරන්න බෑනේ. හැබැයි අපේ අරමුණ මොකක්ද කියලා තේරුම්ගත්ත එයාලා අපේ වැඩේට එකපයින්ම කැමති වුණා."**

මෙලෙස විවාහ කරවූයේ බණ්ඩාරවෙල ආබාධිත පුහුණු ආයතනයේ පුහුණු සහතික ලබා දැනට පෞද්ගලික අංශයේ සමාගම් කීපයකම රැකියාවේ නියුතු තරුණ තරුණියන් දසදෙනෙකි.

**"ඔයා හරියන්නේ මෙයාට වගේ කියලා අපිට කැමති කෙනෙක් ඒ ඒ අයට තෝරලා දෙන්න බෑනේ. ඒක නිසා අපි හිතුවා ඒ ඒ ළමයි කැමති අයම විවාහ කරවන්න. ඉතින් අපි කළේ ළමයින්ව වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයට කැඳවලා තම තමන්ට කැමති සහකරු සහකාරිය තෝරගන්න අවස්ථාවක් ලබාදුන්නු එක."**

තම තමන්ගේ මනාපය පරිදි සහකරු සහකාරිය තෝරගත් පසු ඊළඟ ලොකුම රාජකාරිය වූයේ විවාහ මංගල්‍යයක් පවත්වන එකය. රට යන අතත් පවතින ආර්ථිකයත් හමුවේ එය පොඩි පහේ සෙල්ලමක් නොවේ. නමුත් කවදත් අභියෝගවලට බය නොවූ විමලසිරි මහතා ප්‍රමුඛ බණ්ඩාරවෙල සිංහ සමාජය ඊට අතගැසුවේම සිංහ සෙයියාවෙනි.

**"විවාහ මංගල්‍යයක තියෙන්න ඕන හැමදේම අඩුපාඩුවක් නැතුව කරන්නයි අපට ඕන වුණේ. ඒක නිසා හොඳ නැකතක් බලලා විවාහ මංගල්‍යයට දවසක් ද ගත්තා. එහි සුන්දරම වැඩ ටික කළේ මගේ දුව. ඇය අතින් තමයි මනාලියෝ පවා හැඩවුණේ."**

විමලසිරි මහතා එසේ කියද්දී අප හැරුණේ ඔහුගේ දියණිය වූ ප්‍රවීණ රූපලාවණ්‍ය ශිල්පිනී නිලූකා කොඩිකාර දෙසටය. ඒ මොහොතේ ඇය දැඩි වෙහෙසකර කටයුත්තකින් පසු පුංචි විවේකයක් ලබා විවාහ මංගල්‍යයේ සිරි අසිරි විඳගනිමිනුයි සිටියේ.



මව්පිය ආශීර්වාදය

**"එයාලා කවදවත් රූපලාවණ්‍ය කරපු ගෑනු ළමයි නෙවෙයි. අඩුම තරමේ ක්‍රීම් ටිකක් ෂැම්පු ටිකක් ගාන්නවත් එයාලට තේරුමක් නෑ. ඉතින් ඇහිබැම් හදන එකේ ඉඳන් හැමදේම අපිට කරන්න වුණා. සාරි අන්දන්න කලින් නාවන්න පවා සිද්ධවුණා."**

වරක් සිනාසෙමින් එහෙම කිව්වේ නිලූකාය. ඇයට මනාලියන් ඇන්දවීම අමුතු රාජකාරියක් නොවුණාද විශේෂ අවශ්‍යතා සහිත මෙම තරුණියන් මනාලියන්ට ඇන්දවීම නම් නිලූකාට හිතූ තරම් පහසු වූයේ නැත.

**"එයාලට අන්දන්න තමයි ගොඩාක් අමාරු වුණේ. මොකද එයාලා කියන දේ අපට තේරුම් ගන්න බෑ. අපිට ඒ අයත් එක්ක කතා කරන්න තේරෙන්නේ නෑ. ගොඩාක්ම ඔය හේතුව නිසා ළමයින්ට අන්දන්න සෑහෙන වෙලාවක් ගියා. මට මතක විදිහට පාන්දර 2.00 විතර ඉඳන් උදේ 8.00 වගේ වෙනකල් ඇන්දුවා. ඇස් දෙකට මේකප් දලා වහන්න එහෙම කිව්වට එයාලට තේරුමක් නෑ. ඉතින් එයාලා ඇස් අරිනවා. එතකොට ඇහේ හැමතැනම මේකප් ගෑවෙනවා."**



රූපලාවණ්‍ය ශිල්පිනී
නිලූකා කොඩිකාර

**එයාලා කවදාවත් රූපලාවණ්‍ය කරපු ගෑනු ළමයි නෙවෙයි. අඩුම තරමේ ක්‍රීම් ටිකක් ෂැම්පු ටිකක් ගාන්නවත් එයාලට තේරුමක් නෑ. ඉතින් ඇහිබැම් හදන එකේ ඉඳන් හැමදේම අපිට කරන්න වුණා. සාරි අන්දන්න කලින් නාවන්න පවා සිද්ධවුණා**

ඒ මොහොතේ ඇය අතින් හැඩවූ මනාලියන් දෙස ඈ සිනාමුසු මුහුණුන් බලා සිටියද නිලූකා පවසන්නේ ඇයට ඒ වෙනුවෙන් කීපදෙනෙක්ම උදව් කළ බවකි.

**"මේ වැඩේ ගැන කිව්වම රුචිරා ලියනගමගේ සාරි කීපයක් දුන්නා. නිෂී හඳුන්නෙත්තිගෙන් සාරියක් ලැබුණා. නදී ඉහළනායක ජුවලරි සෙට් එකක් දුන්නා. ක්‍රිෂාංගනී සහ නීෂා මට අන්දන්න උදව් කළා. ඔය වගේ අපට උදව් කරපු පිරිසකුත් හිටියා."**

රූපලාවණ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකුට වුවද තනිවම මනාලියක් ඇන්දවීම හිතන තරම් පහසු නැත. ඊට අනිවාර්යයෙන්ම මනාලියට අඳින තරුණියගේ සහාය අවශ්‍යය. එහෙත් නිලූකලා හස්ත සංඥාවන් ගැන දන්නේ නැත. මනාලියන්ට නිලූකලා කියන දෙයක් තේරුම් යන්නේ නැත. එනිසා දෙගොල්ලන්ටම මෙය අලුත්ම අත්දැකීමක් වූවාය.

**"අමාරුවෙන් හරි අපිට එයාලගේ හස්ත භාෂාවට යම්තාක් දුරකට පුරුදු වෙන්න සිද්ධ වුණා. මොකද ඒ ළමයින්ට පොඩ්ඩක් ඇත්නම් හරියට කේන්ති යනවා. ඉතින් අපිට එතැනදි ගොඩාක් ඉවසන්න පවා සිද්ධ වුණා."**

විවාහයේ සියල්ල සිදුවූයේ නොමිලේය. නිලූකා පවසන ආකාරයට මනාලියකට පිටින් ඇන්දුවා නම් ඒ එක් අයෙකුට යන මුදල පමණක් ලක්ෂ තුන හතරකි. එහෙත් සල්ලි යන්න ජීවිතයම නොවන බැව් දන්නා මිනිසුන් නිසා විශේෂ අවශ්‍යතා සහිත අහිංසක තරුණ තරුණියන්ට මංගල සීනු හැඬවුණේ එහෙමය.

**"විවාහ වුණු ළමයින්ගේ ගෙවල්වලට මේ වෙනුවෙන් කිසිම වියදමක් ගියේ නෑ. මුදු පැළඳවීම, සුදුවත ඇන්දීම, දෑඟිලි බැඳීම, අතපැන් වැඩීම ඇතුළු පෝරුවේ චාරිත්‍ර අඩුවක් නැතුව කළා. මං හිතන්නේ එදා හාරසීයක විතර පිරිසක් හිටියා. ඒ හැමෝටම කෑමබීම පවා දුන්නා."**

මේ ගෙවෙමින් තිබෙන්නේ කාටත් අමාරු කාලයකි. මෙවන් කාලයක මෙවන් කටයුත්තකට අතගැසීමම අගය කළ යුත්තකි. එහෙත් කෙනෙක්ට මෙහි කුමන හෝ යටි අරමුණක් තිබේද යන්න පැනයක් මතුවිය හැකිය. මේ ඊට නිලූකාගෙන් ලැබුණු පිළිතුරයි.

**"ඇත්තටම අපි මේක කළේ සමාජ සත්කාරයක් විදිහට. මොකද විශේෂ අවශ්‍යතා සහිත ළමයි සමාජයෙන් කොන්කරලයි තියෙන්නේ. ඒකයි ඇත්ත. සමහර ගෙවල්වල එහෙම දරුවෝ දංවැල් දලා බැඳලා හිටපු අවස්ථාවන් පවා මං අහලා තියෙනවා. මොකද ගෙවල්වල මිනිස්සුට ලැජ්ජයි ඒ ළමයි සමාජය විසින් දකීවි කියලා. ඉතින් ඒ ළමයි අසරණයි. කොච්චර අසරණද කිව්වොත් එයාලට ඒ වේදනාව කෑ ගහලා පිටකර ගන්නවත් විදිහක් නෑ. ඒ නිසා අපි එහෙම දරුවන්ට විශේෂ සැළකිල්ලක් දක්වන්න ඕනේ. අපි කරපු මේ විවාහ මංගල්‍යය දැකලා හරි තව කෙනෙක් ඒකෙන් ආදර්ශයක් ගත්තොත් සතුටුයි."**

සුන්දර මිනිසුන් පිරිසකගේ මැදිහත්වීමෙන් මේ විවාහ වූයේ ජීවිතයේ කිසිම මොහොතක ප්‍රේමණීය හැඟීම් අතර තනිවෙන්නට සමාජය වරම් අහිමිකළ අහිංසක තරුණ තරුණියන්ය. ඔවුන්ට කියාගන්නට බැරි ඒ සතුට නිලූකා වචන කළේ මෙහෙමය.

**"එයාලගේ සතුට දැකලා අපිට සතුටට ඇඬුණා. විවාහ මංගල්‍යය අවසාන වෙනකොට එයාලා අපිට වැඳලා එයාලට තේරෙන විදිහට පිං දුන්නා. සමහරු කතා කරන්න බැරි නිසා ලියලත් පෙන්නුවා. අන්තිමේ අපිව බදාගෙන ඇඬුවා. මං හිතන්නේ එයාලා ජීවිතේ වින්ද ලොකුම සතුට ඒ මොහොත වෙන්න ඇති."**


විවාහ මංගල්‍යය පුරාවටම ඔවුන්ට තේරෙන අපට නොතේරෙන සන්නිවේදන කටයුතු සිදුකළේ ආබාධිත පුද්ගල උපදේශිකා රෝහිනීය. පෝරුවේ චාරිත්‍ර ගුරු උපදේශක තිලකරත්න සහ පාඨශාලාචාර්ය උපුල් සීලවංශ අතින් සිදුවිය.

**"අපි මේ වැඩේ මෙතැනින් නතර කරන්නේ නෑ. ලබන සැරේ අපි මෙවැනිම තරුණ තරුණියෝ පනහක් විවාහ කරන්න හිතාගෙන ඉන්නවා."**

මිනිසුන් කවුද, මිනිසුන් අතර සිටින දෙවියන් කවුද යන්න තේරුම් ගැනීමට ඔවුන්ගේ ඒ සිතුවිල්ලත් ඇතිය. ඉතින් කොතැනකදී හෝ අපේ සමාජයට මඟහැරී ගිය විශේෂ අවශ්‍යතා සහිත තරුණ තරුණියන්ට ඒ සිතුවිල්ල උඩ නුදුරේදීම යළිත් මංගල සීනු හැඬවෙනු ඇත.

රුවන් එස්.සෙනවිරත්න

කෙටිකතාව



# මුල අමතක කරන්න පුළුවන්නම් ඕවත් වැඩද?

**මතකද ඒ දවස්වල ඔයා වැඩ කළා එක්ස්පෝර්ට් කම්පැනි එකක? හවසට මීට් වුණාම ඔයා වැඩියෙන්ම කරන්නේ අඬන එක. මම වැඩියෙන්ම කරන්නේ ඔයාව සනසන එක. ඒ තරමටම එතන හිටිය බොස් ඔයාට වද දෙනවනේ අඩුපාඩු හොය හොයා, බැන බැන. ඒ තරම් දුක් කාලයක් ගත කරපු ඔයාට ඒ දුක අමතක වුණු එකනේ පුදුමේ.'**

**"මොකද්ද උමාලි මේ කරලා තියෙන්නේ? හරියට වැඩක් කරගන්න තේරෙන්නේ නැද්ද? මම ඊයෙත් කියලා දුන්නනේ මේක කරන හැටි."**

වන්දනා තරහෙන් බැන වදිද්දී උමාලි හිටියේ බයවෙලා.

**"යමු අනේ ලන්ච් ගන්න. මට නම් මේ තොත්ත බලාලා ට්‍රේන් කරලා ඇතිවෙලා."**

ඊළඟට වන්දනා හැරුණේ තමන්ගේ මිතුරිය, සුවින්දී දිහාවට.

**"පව් බන් අලුත් කෙල්ල. පොඩ්ඩක් හෙමීට කියලා දීපන්කො."**

සුවින්දී කිව්වේ බත් පත අනන ගමන්.

**"පව් කියන්නේ? මම ඊයෙත් කියලා දුන්නනේ. එපා වෙනවනේ හරියට වගකීමක් නැති විදිහට වැඩ කරද්දී. තරහ යන්නේ නැද්ද?"**

**"ඔව් ඉතින්."**

**"මතකනේ ඊයෙත්. ඩොකියුමන්ට් එකක් වැරදි ෆයිල් එකකට දලා තිබ්බ හැටි. ඔහොම පුළුවන්ද වැඩ කරන්න? මොන සිහියෙන් ඉන්නවද මන්ද. මට නම් ඔහොම වගකීමක් නැති මිනිස්සු පේන්න බැහැ."**

වන්දනා දවල් ආහාරය ගන්නා තුරුම කළේ උමාලිගේ අඩුපාඩු ගැන කිය කියා බැනපු එක.

මේ අතරේ උමාලි හිටියේ වැරදුණු කාර්යය නැවත නිවැරදි කරන ගමන්. කාර්යාලයේ අනිත් සගයන් දිවා ආහාරය ගන්න ගියාට උමාලිට නැගිටලා යන්න බය හිතුණා. වන්දනා ආයෙමත් ඇවිත් වැරදුණු කාර්යය ගැන විමසලා බනීවි කියන බය නිසා ඇය කුසගින්නේම පවරපු වැඩේ ඉවර කළා.

දිවා ආහාරය සඳහා ගෙන ආ බත් පත නරක් වී ඇති බව දැනුණු උමාලි ඊළඟට තවත් අසරණ වුණා. බත් පාර්සලය අකුළලා කුණු කූඩයට දපු උමාලි බයෙන් වගේ වන්දනාට කිට්ටු වුණා.

**"මිස් මම ටිකක් එළියට ගිහින් එන්නද?"**

**"එතකොට මේ තියෙන වැඩ කරන්නේ මමද?"**

වන්දනා ආපස්සට ඇසුවේ හේතුවවත් අහන්නේ නැතුව.

**"අනේ මිස් මම ගෙනාපු කෑම එක නරක් වෙලා. විසි කරන්න වුණා."**

උමාලි කීවේ හැඬුම්බර හඬින්.

වන්දනා හිස ඔසවා උමාලි දෙස බැලුවේ කරදරකාරී බැල්මක්.

**"හා. හා."**

ඇය අවසර දුන්නේ නොදී බැරිකමට වගේ.

සවස්වරුවේ වන්දනා දිව ගොස්, තමාව රැගෙන යාමට පැමිණි සැමියා වූ රසිතගේ මෝටර් රථයට ගොඩ වුණා.

රථය මද දුරක් ඇදෙද්දී වන්දනාගේ නෙත නැවතුණේ පාර අයිනෙන් ඇවිද යන උමාලි අසල.

**"රසිත අර ඉන්නේ අපේ ඔෆිස් එකට අලුතින් ආපු ළමයා."**

**"ආ... එයත් යන්නේ හංදියටද? වාහනය නවත්තන්නද?"**

රසිත විමසුවේය.

**"අපෝ ඕනේ නැහැ. එයා ඔය යන විදිහකට ගියදෙන්. අද මගෙන් හොඳටම බැනුම් අහලා ඔය ඉන්නේ."**

වන්දනා කීවේ අහක බලාගන්න ගමන්.

**"ඒ මොකද?"**

රසිත විමසුවේ කුතුහලයෙන්.

**"කියා දුන්නට වැඩක් නැහැ අනේ වරද්දනවා. මට නම් තේරෙන්නේ නැහැ එක පාරක් කියා දුන්නම තේරුම් ගන්න තරම් මොළයක් නැත්තේ ඇයි කියලා. ඩිග්‍රී එකකුත් තියෙනවලු. අත උස්සලාද කොහෙද කැම්පස් ගිහින් තියෙන්නේ. කිසි ප්‍රායෝගික දැනුමක් නැති පාටයි. ඒ මදිවට වැඩ අස්සේ එළියට යනවා දවල්ට කන්න කියලා. ගෙනාපු කෑම එක නරක් වෙලාලු. ඇයි දෙයියනේ අනිත් අය කන වෙලාවට කන්න දැනගන්න එපැයි. බොරු කියනවද කොහෙද එළියට පැනගන්න තියෙන උවමනාවට."**

වන්දනා කීවේ නොරිස්සුමෙන්.

**"ඒ ළමයා ඔෆිස් එකට ඇවිත් කොච්චර කාලයක්ද දැන්?"**

**"සතියයි දවස් තුනක් විතර."**

රසිත සුසුමක් හෙලමින් වන්දනා දිහාවට හැරුණා.

**"මට මතක් වෙනවා අපි යාළුවෙලා හිටිය දවස්."**

රසිත කියද්දී වන්දනා රසිත දිහා බැලුවේ පුදුමයෙන්.

**"ඒ මොකද?"**

**''මතකද ඒ දවස්වල ඔයා වැඩ කළා එක්ස්පෝර්ට් කම්පැනි එකක? හවසට මීට් වුණාම ඔයා වැඩියෙන්ම කරන්නේ අඬන එක. මම වැඩියෙන්ම කරන්නේ ඔයාව සනසන එක.**

**ඒ තරමටම එතන හිටිය බොස් ඔයාට වද දෙනවනේ අඩුපාඩු හොය හොයා, බැන බැන. ඒ තරම් දුක් කාලයක් ගත කරපු ඔයාට ඒ දුක අමතක වුණු එකනේ පුදුමේ."**

රසිත කියද්දී වන්දනාට දැනුණේ පොළොව පලාගෙන යන තරමේ ලැජ්ජාවක්. පසුතැවිල්ලක්.


ඉන්පසුව ගෙවුණේ දිග නිහැඬියාවක් සහිත විනාඩි කීපයක්.

**"අනේ මට තියෙන ස්ට්‍රෙස් එකත් එක්ක මම ලොකු වරදක් උමාලිට කළේ. හෙට ඉඳන් මම එයාට හොඳින් සලකනවා."**

අවසානයේ වන්දනාම නිහඬ බව බිඳ දමමින් කිව්වා.

**සමාධි ඩයස්**

දීගායු කේෂ ප්‍රබෝධිනී
ස්වාභාවික හිස තෙල
ප්‍රබෝධමත්. දිදුලන. කාලවර්ණ දිගු වරලසක හිමිකම..!!!




සෑම යුවතියකගේම සනාතනික සිහිනයයි.
කේශ පෝෂණීය ආයුර්වේද හරිත ශාක 9 ක සාන්ද්‍ර යූෂ හා ශීර්ෂ සාමක ආයුර්වේද ඔසු 9 ක් සමග සුපිරිසිදු නැවුම් පොල්තෙල් සංකලනයෙන් ආයුර්වේද තෛල සංස්කරණ පරිභාෂාවට අනුකූලව විශිෂ්ට ප්‍රමිතියෙන් නිෂ්පාදිත
දීගායු කේශ ප්‍රබෝධිනී
ස්වාභාවික හිස තෙල
කේශ පෝෂණීය ආයුර්වේද හරිත ශාක 9 හි ගුණයෙන්
- අකලට පැසීම හා කෙස් ගැලවීයාම වළකයි.
- තඹ පැහැවීම හා කෙස් අග පැලීම වළකයි.
- හිසකෙස් සිහින් වීම හා දුර්වර්ණ වීම වළකයි.
- හිසකෙස් ඝනව හා දික්ව වැඩීමට උපකාර කරයි.
- හිස් හොරි හා අනෙකුත් ක්ෂුද්‍ර ජීවීන් වළකයි.
ශීර්ෂ සාමක ආයුර්වේද ඔසු 9 හි ගුණයෙන්
- කිවිසුම් යාම, ඇස් දැවිල්ල, වළකයි.
- හිසරදය හා පීනස වළකයි.
- හිසෙහි බර ගතිය ඉවත් කරයි.
ස්නානයට (නෑමට) පැය දෙකකට පමණ පෙර හිස් කබල මත ආලේප කර කෙස් මුල විනාඩි 10 ක් සම්බාහනය කරන්න.
පැරෆින් තෙල් හෝ රසායනික වර්ණකාරක අඩංගු නැත. 100% නැවුම් පොල්තෙලින් නිෂ්පාදිතයි.
මිලි ලීටර 100ක ඇසුරුමක් රු.290/ ක් පමණයි. ඇසුරුම් 3 ක් කූරියර් සේවයෙන් ඔබ නිවසටම රු.1350/- පමණක් ගෙවා ගෙන්වා ගැනීමට 0332297399, 0332297644, 0710397399 , 0710397644 අමතන්න.
ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සූත්‍ර කමිටුව විසින් 2012 වසරේ අනුමත කර අංක 02/01/PE/12/410 යටතේ ලියාපදිංචි කර ඇත.
සියලු ආපිකෝ සුපිරි සැල් හා ආයුර්වේද ඔසුසල් වලින්ද ලබාගත හැක.
Download
ANDROID APP ON Google play
Google Play Store මගින් "Deegayu Global" App බාගත කරගෙන සියලු දීගායු හෙළ ඔසු පිරිවිතර ඔබගේ සුහුරු දුරකතනයෙහි තබා ගන්න.
නිෂ්පාදනය හා බෙදාහැරීම :
සීමාසහිත දීගායු ආයුර්වේදික් ඇන්ඩ් බොටැනිකල් ප්‍රොඩක්ට්ස් (පෞද්ගලික) සමාගම
අංක 62/C/18, මෝසෙස් ඇවනිව්, අලුත්ගම - බෝගමුව, කලගෙඩිහේන.
WhatsApp - 076 096 6161
E Mail: sales.deegayu@gmail.com / Web: www.deegayu.com



මුලතිව් වෙල්ලිමුල්ලිවයික්කාල් බිමේදී එල්.ටී.ටී.ඊ. නායක ප්‍රභාකරන් මරා දමා තිස් වසරක් පුරා පැවති යුද්ධය ජයග්‍රහණය කිරීමේ 13 වන සංවත්සරය යෙදී ඇත්තේ මැයි 19 වැනිදාටය. මේ ලිපිය සැකසෙන්නේ ඒ නිමිත්තෙනි.

# අලිමංකඩ හිරවෙලා ඉඳිද්දි මිරිකලා මම

## විශ්‍රාමික ලුතිනන් කර්නල්

පිරිමින්ගේ ගොරෝසු අත්වලට වඩා ගෑනුන්ගෙ අත් හරි පුංචියි. ඒ වගේම සියුමැලියි. හැබැයි ඒකෙන් අදහස් වෙන්නේ නැහැ ඒ අත් හයිය නැතිබව. ඒ අත් හයියයි. අත්වලටත් වඩා ගෑනුන්ගේ හිත් හයියයි. ඒ බව ඔප්පු කරලා පෙන්නපු ඉතිහාසයක් අපිට තියෙනවා. රට වෙනුවෙන් ජීවිතේ මුහුදට බිලිදෙන්න ඉදිරිපත් වුණ විහාරමහාදේවියත් ඒකට හොඳ උදාහරණයක්.

ශ්‍රී ලංකා යුද හමුදා කාන්තා බළකායේ සිටින්නෙත් විහාරමහාදේවියගේ පරපුරේම කාන්තාවන්. ඒ බව සංකේතවත් කරන්න තමයි කාන්තා බළකා ලාංඡනයේ විහාරමහාදේවිය සිත්තම් වෙන්නේ.

හැබැයි මේ වීරවරියන්ට හැප්පෙන්න වුණේ මහමුහුද එක්ක නෙමෙයි. ඊට වඩා ම්ලේච්ඡ සහ ලෝකයේ දරුණුතම කොටි නායකයා විදිහට හැඳින්වුණු වේළුපිල්ලේ ප්‍රභාකරන් ප්‍රමුඛ කොටි සංවිධානය එක්ක. ඒ කටුක ගමනේ නොදන්න තැන් ගැන අද වගේ දවසක කතා නොකර ඉන්නෙ කොහොමද? ඒ නිසයි යුද හමුදා කාන්තා බළකායේ ලංකාවේ පුහුණුව ලැබූ මුල්ම නිලධාරිනී කණ්ඩායමේ වීරවරියක් එක්ක මේ කතාබහට අපි සම්බන්ධ වුණේ. ඇය විශ්‍රාමික ලුතිතන් කර්නල් මන්ත්‍රී කොස්වත්තයි.

හමුදා කාන්තා බළකායක් මුලින්ම පිහිටුවීමේ අවශ්‍යතාව මතුවෙලා තියෙන්නේ එවකට යුද හමුදපති ධුරය දැරූ ලුතිතන් ජනරාල් ඩෙනිස් පෙරේරාට. ඒකටත් විශේෂ හේතුවක් තිබිලා තියෙනවා. 1949 ශ්‍රී ලංකා යුද හමුදවේ ආරම්භයේ ඉඳලම ආරක්ෂක කටයුතුවලට අමතරව ලිපිකරු, දුරකතන ඇමතුම් මෙහෙයවීමේ කටයුතු ආදිය පැවරිලා තිබුණොත් යුද හමුද සෙබළුන්ටය. ඉතින් ඔවුන්ව ඒ සේවයෙන් නිදහස් කිරීමේ අරමුණු ඇතිව තමයි 1979 සැප්තැම්බර් 01 වැනිද ශ්‍රී ලංකා යුද හමුද කාන්තා බළකාය ආරම්භ කරලා තියෙන්නෙ.

ඒ අනුව පළමු සම්මුඛ පරීක්ෂණයට අයැදුම්පත් 200-250ක් විතර ලැබිලා තියෙනවා. කෙඩෙට් නිලධාරිනියන් විදිහට පුහුණු කරන්න තෝරගෙන තියෙන්නේ ඒ අතරින් හයදෙනෙක් විතරයි. රමණී කංගනාආරච්චි, කුමුදිනී වීරසේකර, ප්‍රියංගනී සිල්වා, මානෙල් විජේගුණවර්ධන, වජිරා පෙරේරා සහ නිශානි කරුණාරත්න යන අය තමයි ලංකාවේ යුද හමුද කාන්තා බළකායේ මුල්ම නිලධාරිනියන් වුණේ. එවකට නිලධාරිනියන් පුහුණු කරන්න ලංකාවේ යුද පුහුණු පාසලක් නොතිබුණු නිසා මේ කණ්ඩායම පුහුණුව සඳහා එංගලන්තයේ කැට්බරි ප්‍රදේශයේ තිබුණු රාජකීය යුද හමුද කාන්තා විද්‍යාලයකට පිටත් කරලා තියෙනවා. මේ නිලධාරිනියන් හයදෙනාට අමතරව අධිකාරි නොලත් නිලධාරිනියන් 10ක් හා සෙබළියන් 150කුත් පළමු කණ්ඩායමට තෝරගෙන තියෙනවා.

**"මුල් කාලේ ඉතින් කාන්තා බළකාය කිව්වම හැමෝටම පුදුමයි. මමත් පුංචි කාලේ ඉඳලාම ක්‍රීඩාවලට කැමති කෙනෙක්. ඉතින් පුහුණුව ලැබූ ඉහත කී කණ්ඩායම්වල ඡායාරූප එහෙම දැක්කම, යුද හමුදවට බැඳෙන්න මටත් හරි ආස හිතුණා. අනික රට වෙනුවෙන් සේවය කරන්න ලැබෙන එක ලොකු අභිමානයක් විදිහටයි මම දැක්කේ. ඒ අනුව 1983දී නොවැම්බර් මාසෙදී මම යුද හමුද කාන්තා බළකායට බැඳුණා. එතකොට මට අවුරුදු විස්සයි."**



යුද හමුදා කාන්තා බළකායේ ධජය



යාපනය ,තිරුනල්වේලි හි ත්‍රස්ත ප්‍රහාරයකට ගොදුරු වූ ලංකා යුද හමුදා කාන්තා ( නිත්‍ය) බළකායේ ලාන්ස් කෝප්‍රල් ඊ.එන්.ද සිල්වා



රට වෙනුවෙන් දිවි දුන් පළමු කාන්තා සෙබළිය ලාන්ස් කෝප්‍රල් එම් රූපවතී

**ඒ වෙනකොට මම විශ්වවිද්‍යාල ප්‍රවේශයටත් සුදුසුකම් ලබලයි හිටියේ. මම විශ්වවිද්‍යාලයට නොයා හමුදාවට ගියා. අටදෙනෙක්ගේ කණ්ඩායමක් තේරුණා කිව්වනේ. එතැනින් දෙන්නෙක් පුහුණුවෙන් පස්සේ ආවේ නැහැ. ඉන් එක්කෙනෙක් තමයි පාර්ලිමේන්තු මන්ත්‍රිනී තලතා අතුකෝරල**



ලුතිතන් කර්නල් මන්ත්‍රී කොස්වත්ත ඇතුළු කාන්තා යුද හමුදා බළකායේ තෙවන කණ්ඩායම

ඇය අයැදුම් කරන්නේ කාන්තා නිලධාරීන් බඳවාගැනීමේ පාඨමාලා අංක තුනේ කණ්ඩායමට. එවලා තිබුණු අයැදුම්පත් දෙලොස්දහක් අතරින් නිලධාරින් අටදෙනෙකුගේ කණ්ඩායමට ඇයවත් තේරෙනවා.

**"අධ්‍යාපන සුදුසුකම්, පෞරුෂය, ශාරීරික යෝග්‍යතාව වගේ දේවල් තමයි බැලුවේ. ඒ වෙනකොට මම මියුසියස් විදුහලෙන් උසස් පෙළ කරලා විශ්වවිද්‍යාල ප්‍රවේශයටත් සුදුසුකම් ලබලයි හිටියේ. මම විශ්වවිද්‍යාලයට නොයා හමුදවට ගියා. අටදෙනෙක්ගේ කණ්ඩායමක් තේරුණා කිව්වනේ. එතැනින් දෙන්නෙක් පුහුණුවෙන් පස්සේ ආවේ නැහැ. ඉන් එක්කෙනෙක් එයාගේ අයියා මැරුණට පස්සේ දේශපාලනයට ඇවිත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් වුණා. ඇය තමයි රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිනී තලතා අතුකෝරල. අපේ කණ්ඩායම පුහුණුවට බ්‍රිතාන්‍යයට යැව්වේ නැහැ. දියතලාව ශ්‍රී ලංකා යුද හමුද විද්‍යා පීඨයේදි මාස නවයක් පුහුණු කළා."**



# දෙතනට එරුණු කිරි පොළොවට හැලුවා

## මන්ත්‍රී කොස්වත්ත



යුද සේවයට බැඳෙන කාන්තාවකට කරන්න වෙන පළමුවෙනි දරදඬු කැපකිරීම තමයි යුද පුහුණුව ලබන එක. මොකද යුද හමුද පුහුණුව කියන්නේ ලේසි පහසු එකක් එහෙම නෙමෙයිනේ. ඉතින් අර අවුරුදු විස්සේ සියුමැලි අත්වලට මේ පුහුණුව සැර වැඩිවුණු තැනුත් තිබුණාලු.

**"පුහුණුවේදි අපිට පුහුණු කාලේ දෙන ඇඳුම (ඕ.පී. ඇඳුම) එක්ක සායකුයි, ටීෂර්ට් එකකුයි, ඔලිව්ග්‍රීන් පැහැයේ ඇඳුමකුයි දුන්නා. උදේ පහට අඳින ඇඳුම හවස් වෙනකල් ආයේ ගලවන්න බැහැ. ඉතින් දඩියත් එක්ක ඇඟට හරි අමාරුයි. නිතර පිරිසිදුවට ඉන්න ලැබෙන්නෙ නැහැ. රෙදි කෑල්ලක් තෙමලා පූසෝ වගේ ඇඟ පිහගත්ත වෙලාවල් අනන්තයි.**

**පුහුණුවට යනකොට මම ටිකක් මහත කෙල්ලෙක්. හැබැයි පළමුවෙනි නිවාඩුවට ගෙදර යනකොට මම ඇටසැකිල්ලක් වෙලා. පුහුණුව එච්චර දුෂ්කරයි. ඔය පුහුණුවේදි පුංචි පුංචි වැරදිවලට පවා අපිට ටිකක් සැර දඬුවම් ලැබුණා. ඒ දේ වලින් අපේ දරාගැනීම මුවහත් වුණා. දියතලාවේ ඉන්න කාලේදි දෙසැම්බර් මාසේ දවසක රැයක් එළිවෙනකල් සීතලේ වෙව්ල වෙව්ලා කුණු වළක් කැපුවා මට තාම මතකයි. මම විතරක් නෙමේ යුද හමුදවේ හැම කාන්තාවක්ම අදටත් ඔය කැපකිරීම් කරනවා. කොහොම හරි ඔය පුහුණුවෙන් පස්සේ දෙවන ලුතිතන් කෙනෙක් විදිහට අධිකාරිය ලබලා යුද නොවන පරිපාලන කටයුතුවලට ගියා."**

ඊළාම් යුද්ධය ආරම්භ වෙලා මාස කීපයක් ගත වෙනකොට ත්‍රස්ත ක්‍රියාකාරකම් තරමකට පාලනය කරගන්න යුද හමුදවට පුළුවන් වුණාලු. හැබැයි ඔය කාලේ දකුණේ හිරවෙලා හිටපු දෙමළ ජනතාව දැඩි ආහාර හා ඖෂධ හිඟකමකින් පෙළිලා තියෙනවා. ඉතින් ඒකට විසඳුම විදිහට වහලා තිබුණු වව්නියාව නගරය විවෘත කරලා ඔවුන්ගේ අවශ්‍යතා සපුරන්න එවකට රජය තීරණය කරලා. වව්නියාව නගරයට කිලෝමීටර තුනකට විතර මෙහායින් තමයි හමුදවේ අවසාන ආරක්ෂක වළල්ල තිබිලා තියෙන්නේ. ඉතින් වව්නියාව නගරයට ඇතුළු වෙන සාමාන්‍ය දමිළ කාන්තාවන් පරීක්ෂා කරන එක මෙතැනදි යුද හමුදවට විශාල ගැටලුවක් වුණා. ඒකට විසඳුමක් විදියට යුද හමුද සෙබළියන් ක්‍රියාන්විත ප්‍රදේශවලට අනුයුක්ත කරන්න රජය තීරණය කළා.

**"අවශ්‍ය වෙලාවට විතරක් අපි යටතේ හිටි සෙබළියන්ව ඒ රාජකාරිවලට අනුයුක්ත කරන්න අපිට සිද්ධවුණා. හැබැයි 1995 වගේ වෙනකොට එකපාර යුද්දේ වැඩි වුණා. හරි හරියට හමුද සෙබළුන් මැරෙන්න ගත්තා. ඒ නිසාම හමුදවට බැඳෙන්න තරුණයන් අදිමදි කළා. ඒ වනවිට තිබුණේ පළමුවැනි කාන්තා බළකාය විතරයි. ඊටපස්සේ රජය දෙවන කාන්තා බළකාය කියලා ඒකකයක් ස්ථාපිත කළා. ඔවුන්ව ගත්තෙම ක්‍රියාන්විත ප්‍රදේශවල සේවය කරන්න. කඳවුරු සහ බංකර ආරක්ෂා කිරීම සහ මාර්ග බාධකවලදී හමුවන කාන්තාවන් පරීක්ෂා කිරීම තමයි ඔවුන්ට පැවරුණේ.**



ලුතිතන් කර්නල් මන්ත්‍රී කොස්වත්ත සේවයේ සක්‍රීයව සිටියදී

**බංකරවල හිටියත් යුද හමුදා සෙබළියන් පුංචි කණ්ණාඩි කෑල්ලකින් මූණ බලන්න, මූණට පියරු චුට්ටක් තවරන්න එහෙමත් අමතක කරන්නේ නැහැ**

**මමත් ඔය කණ්ඩායමේ දෙවන අණදෙන නිලධාරිනිය විදිහට පත්වුණා. ඒ වෙනකොට මම විවාහවෙලයි හිටියේ. මගේ සැමියා මේජර් ජෙනරාල් විජිත නිර්මාල් කොස්වත්ත (විශ්‍රාමික). අණදෙන නිලධාරිනියක් විදිහට අලිමංකඩට යන්න කියලා කියනකොට මට දරුවා ලැබිලා අවුරුද්දයි. රාජකාරි පීඩනය නිසා එයට කලිනුත් මගේ දරුවෙක් ගබ්සා වුණා. ඒ නිසා දරුවා දලා ඒ ගමන යන්න මට ලොකු කැමැත්තක් තිබුණේ නැහැ. ඉතින් කරන්න දෙයක් නැතිම තැන මම දරුවවත් අරගෙනම උතුරට ගියා.**

**දරුවව එයාව බලාගන්න හිටි කාන්තාවත් එක්ක වවුනියාවේ තියලා මම ගුවන්යානයෙන් අලිමංකඩ ගියා. ඒ පහුවෙනිද දරුවා ගාවට යන බලාපොරොත්තුවෙන්. ඒත් එද යුද්දේ වැඩිවුණු නිසා මාව දවස් දහයකට අලිමංකඩ හිරවුණා. දරුවට කිරි දෙන්න නැතුව මගේ පපුව ගල් ගැහිලා. මම කිරි මිරික මිරිකා පොළොවට හැලුවා. දරුවගෙන් මාව ඈත්කළ නිසා ඒ වෙලාවේ මට ත්‍රස්තවාදීන් ගැන ලොකු තරහක් ඇතිවුණා."**

**නිලයෙන් අඩු සෙබළුන් පවා කාන්තාවන්ට සැලියුට් කරන එක මදිකමක් විදිහට දැක්ක තැන් තිබුණා**

උතුරේ රාජකාරියට යාම හේතුවෙන් හමුද ඉතිහාසයේ පූර්ණභූමි පදක්කමට හිමිකම් කියන මුල්ම නිලධාරිණිය වන්නේද ඇයය.

ඇයට පමණක් නොව යුද හමුදවට බැඳුණු ගොඩක් කාන්තාවන්ට තමන්ගේ දරුවන්ගෙන් වෙන්වෙලා ඉන්න සිද්ධ වුණා. හරි පවුල් ජීවිතයක් ගත කරන්න බැරිවුණු නිසා බහුතරයකගේ පවුල් ජීවිත අසාර්ථක වුණාලු. හැබැයි ඔවුන් ඒ කැපකිරීම් කළේ අපි නිසා බව මේ වෙනකොටත් බොහෝදෙනාට අමතක වෙලා.

**"යුද්දේ කාලෙදි රට වෙනුවෙන් දිවි පිදුව ස්වේච්ඡා බළකායේ පළමු කාන්තා සෙබළිය ලාන්ස් කෝප්‍රල් එම්.රූපවතී දැකුම්කලු හුරුබුහුටි යුවතියක්. රූපවතී ඇතුළු පිරිස නීර්වේලි බංකරයක ඉන්නකොට මේ අයගේ ටී56 තුවක්කු හොරකම් කරන්න මහ රෑක කොටි ඇවිල්ලා. එතැනදි ඇතිවෙච්ච වෙඩි හුවමාරුවකදී ඇයට වෙඩි කිහිපයක්ම වැදිලා තිබුණා. ඔය ආරංචිය එද්දි මම හිටියේ වව්නියාවේ. ආරංචිය ආව හැටියේ මම තිරප්පනේ ඇයගේ ගෙදරට ගියා. ඇය අහිංසක ගොවි පවුලක දුවෙක්. යමක් කමක් තියෙන මිනිස්සුන්ගේ ළමයින්ට වඩා අහිංසක ගැමි ජනතාවගේ දරුවෝ තමයි මේ රටට හැමදම සේවය කළේ."**

යුද හමුද නිත්‍ය බළකායෙන් දිවි පිදූ ප්‍රථම සෙබළිය වෙන්නේ ඊ.එන්. ද සිල්වා ය. ඇය යාපනය තිරුනල්වේලිහි රාජකාරියේ යෙදිලා ඉන්නකොට ත්‍රස්ත ප්‍රහාරයකට ගොදුරු වුණා. රට වෙනුවෙන් අපි වෙනුවෙන් එතෙක් මෙතෙක් ජීවිත පූජා කළ යුද හමුද සෙබළියන් ගණන 28ක්. වැඩි කතාබහකට ලක්නොවුණාට සෙබළියන් හයක් පමණ ආබාධිත තත්ත්වය පත්වෙලා තියෙන බව සංවේගයෙන් කියන්න ඕනේ.

**"උතුරේ දෙමළ මිනිස්සු හිතාගෙන හිටියේ සිංහලයා කියන්නේ යක්ෂයෙක් කියලා. කොටි ත්‍රස්තවාදීන් ඒ තරමට ඒ ඔළු වෙනස් කරලයි තිබුණේ. ඉතින් ගොඩක් දෙමළ මිනිස්සු මඩු පල්ලියේ හැංගිලා හිටියා. රජය ඔවුන්ගේ හිත් දිනාගන්න මනෝ ක්‍රියාන්විත කියලා ක්‍රියාන්විතයක් පටන් ගත්තා. එතැනදි අපි රේඩියෝ සේවා ඔස්සේ දෙමළ ජනතාව අමතලා අපි බොහොම සුහද ජාතියක් බව එයාලට පැහැදිලි කළා. ඔන්න කාලයක් යද්දි සිවිල් ජනතාව හමුදව ඉන්න ප්‍රදේශවලට එන්න පටන්ගත්තා. දවසක් එක අතකින් දරුවෙක් වඩාගෙන කුසෙත් දරුවෙක් දරාගෙන ඉන්න අවුරුදු දසයක විතර ගෑනු දරුවෙක්ව මම දැක්කා. ඇයව දැක්කම මගේ පපුව පිච්චිලා ගියා. ඒ දුවගේ සැමියටත් අවුරුදු දහතයි. මේ අයව කසාද බැන්දුවේ ඇයි කියලා මම ඒ දෙමව්පියන්ගෙන් ඇහුවා. යුද්දේ පටන්ගත්තු මුල්ම කාලේ කසාද බැඳපු අයව කොටි හමුදවට බඳවගත්තේ නැහැලු. ඒ නිසා වැඩිහිටි උදවිය ගොඩක් දරුවන්ව කටේ කිරි සුවඳ යන්නත් කලින් බන්දලා දනවලු. අපි වගේම ඒ මිනිස්සුත් හරියට දුක් වින්ද බව අපි නම් ඇස්වලටම දැක්කා."**

ගෑනු හරිම සංවේදීනේ. දරුණු අවි ආයුද එක්ක මොන පුහුණුව දුන්නත් ගෑනු හිතක තියෙන මව්හත් ගුණය මරලා දන්න බැරි බවට උදහරණ නෙමෙයිද මේ?

**"අපේ කණ්ඩායමට ග්‍රෙනේඩ් බෝම්බ විසිකිරීමේ පුහුණුවක් දුන්නේ නෑ. ඒ නිසා දවසක් මම වෙනත් කණ්ඩායමක පුහුණුවීමක් බලන්න ගියා. බෝම්බයක් පුපුරනකොට රාස්සිගේ අච්ච වැටිලා වගේ හරි එළියයි. ලස්සනට එළියට තිබුණට බෝම්බ ගැන මම අමුතුවෙන් කියන්න ඕනේ නෑනේ. ඔය පුහුණුවීමේදි ඉතින් මගේ නිකටට බෝම්බ කෑල්ලක් විසි වුණා. ඒ වෙලාවේ දැනුණු වේදනාවට සමාන කරන්න පුළුවන් වේදනාවක් මගේ ජීවිත කාලෙටම මම විඳලා නැහැ. බෝම්බ කෑල්ලක් වැදුනම ඒක අපේ හම කඩාගෙන ඇඟ ඇතුළට යනවා. එද මගේ නිකටට වැදුණු බෝම්බ කෑල්ල හොයාගත්තෙ කන ගාවින්. එද මට සැත්කමක් කළා. පහුවෙනිද මූණ බලද්දි මගේ මූණ විකෘති වෙලා. එද මම යටිගිරියෙන් කෑගැහුවා. ගෑනු ළමයෙක්ට මූණතරම් වටින තවත් දෙයක් තියෙනවද?"**

මූණේ කුරුලෑවක් ආවත් ගෑනු උදවිය වද වෙනවා. ඒ හැටි. එහෙව් එකේ මූණට බෝම්බයක් වදිනවා කියන්නේ කාන්තාවකට ඉවසන්න පුළුවන් දෙයක් නොවන බව නම් පැහැදිලියි. බංකරවල හිටියත් යුද හමුද සෙබළියන් පුංචි කණ්ණාඩි කෑල්ලකින් මූණ බලන්න, මූණට පියරු චුට්ටක් තවරන්න එහෙමත් අමතක කරන්නේ නැහැ කියලා ඇය කිව්වා.

**"ඉතින් පස්සේ මූණ ටිකෙන් ටික සුව වුණා. ප්ලේන්වල එහෙට මෙහෙට යද්දි බෝම්බ වැදිලා ඇඟේපතේ කෑලි කැඩිලා ප්‍රතිකාරවලට ගෙනියන සෙබළුන්ව මුණගැහෙනවා. ඒ අය මහා හයියෙන් විලාප තියනවා. පුංචි බෝම්බ කෑල්ලට අච්චර රිදුනානම් මේ අයට කොච්චර රිදෙනවා ඇද්ද කියලා ඉතින් එවෙලෙට මම කල්පනා කරනවා."**

නිලධාරිනියන් හැමකෙනෙක් දිහාම කරුණාබරිතව සමානාත්මතාවයෙන් බැලුවත් යුද හමුදවේ ඇතැම් පිරිමි නිලධාරින්ගෙන් කාන්තා නිලධාරීන්ට නිසි ගෞරවයක් නොලැබුණු අවස්ථාත් තිබුණාලු. හමුද පිළිවෙත අනුව සිය උසස් නිලධාරියාට ආචාර කිරීමේදී ගෑනු පිරිමි භේද සලකන්නේ නැත. නමුත් මුල් කාලේ සෙබළුන් නිලධාරිනියන් ගනන් ගත්තේ නැත.

**"නිලයෙන් අඩු සෙබළුන් පවා කාන්තාවන්ට සැලියුට් කරන එක මදිකමක් විදිහට දැක්ක තැන් තිබුණා. 'ඔයාලටත් ඉතින් අපේ පඩියම හම්බෙනවනේ' කියලා මගේ මූණටම කිව්ව පිරිමි නිලධාරින් හිටියා. හමුද ක්‍රියාන්විතවලදි පිරිමි සෙබළුන්, නිලධාරින් කළ සේවය අගය කරන්නම ඕනේ. හැබැයි අපිත් ඒ සමානවම කැපකිරීම් කළ බව බොහෝ දෙනාට අමතකයි. රජයෙන්වත් අපිට නිසි ඇගයීමක්, උපහාරයක් ලැබෙන්නේ නැහැ. මේ වෙනකොට මම විශ්‍රාම ගිහිල්ලා අවුරුදු විස්සක් වෙනවා. යුද හමුද විශ්‍රාමික කාන්තා සංගමයේ සභාපතිනිය විදිහට කටයුතු කරනවා. එතැනදි විශ්‍රාමික හමුද නිලධාරිනියන්ට සුබසෙත සලසන එක තමයි අපේ අරමුණ. ඉදිරියේදි ඔවුන් වෙනුවෙන් උපහාර උළෙලක් පවත්වන්නත් අපි සූදනම් වෙනවා."**

තොටිල්ල නැලවූ අත අවි දැරූ හැටි ඇය අපි එක්ක කිව්වේ ඔහොම.

කවුරු කොහොම කිව්වත් රට රකින්න පෙරමුණට ගිය ලක්මවගේ වීර දියණියන්ව අපිට අමතක නැති නිසා තමයි අද 'ධරණී' පිටු අතර ඔවුන් වෙනුවෙන් මේ ඉඩ වෙන්වුණේ.

**රට වෙනුවෙන් දිවි පරදුවට තියා කැපවුණු ඒ වීරවරියන්ට අපේ ප්‍රණාමය!**

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**

# සාරියෙන් කලිසමට මාරු වී කාර්යාල බිමේ වගා කරන රාජ්‍ය සේවිකාව ඉන්දිරා



මේ වගාව දැකලා මිරිස් පැළයක් හරි හිටවන්න දරුවෙකුට, ගුරුවරයෙකුට හිතෙනවා නම් මම බලාපොරොත්තු වෙන දේ ඒකයි

කාර්යාල කාර්ය සහායිකාවක ලෙස පත්වීම් ලද ඉන්දිරා, 2014 වසරේ සේවය කරමින් සිටියේ කළුපහන කනිෂ්ඨ විද්‍යාලයේයි. ළමුන් තුන්සියයක් පමණ ඉගෙනුම ලැබූ එම පාසලේ කාර්යාලය පවිත්‍ර කිරීමත්, ලිපිගොනුවක් එහා මෙහා ගෙනයාමත් හැරුණුකොට ඉන්දිරාට ලොකු වැඩක් නොතිබුණි.

**"මට දවසේ වැඩි කාලයක් කරන්න වැඩක් තිබුණේ නැහැ. ඒක හරියට හිතට දැනුණා. ඒ වගේම කම්මැලියි. දවසක් මම පාසලේ කෙටි තාප්පයෙන් ඈත බලාගෙන ඉඳිද්දී, කැලෑවට ගිහින් තිබුණු ඉස්කෝලේ ඉඩම දැක්කා. ඒ ඉඩම අක්කර හයක් විතර ඇති. මට හිතුණා ඒ ඉඩම එළිකරලා වගාවක් දැම්මා නම්, ඒක හරි ප්‍රයෝජනවත් වෙයි කියලා."**



කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ඩී.එල්.වී.කේ. ජාසිංහ

ඒ සිතිවිල්ල දින කිහිපයක් හිතේ එහා මෙහා වෙමින් තියෙද්දී, ඇය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වූ විමල් ගුණරත්න මහතාගෙන් ටිකක් අමුතු ඉල්ලීමක් කළාය.

**"මම එතුමට කිව්වා මට සාරියක් ඇඳන් ඇවිත් ඉස්කෝලේ කරන්න ලොකු වැඩක් නැහැ. කලිසමකුයි, ටීෂර්ට් එකකුයි ඇඳන් එන්න ඔබතුමා අවසර දුන්නොත් මට ඉස්කෝලෙ වත්ත එළිපෙහෙළි කරලා වගාවක් කරන්න පුළුවන් කියලා."**

ඉන්දිරාගේ එම ඉල්ලීමට යහපත් ප්‍රතිචාර ලැබිණි. ඇය එම ඉඩම එළිපෙහෙළි කර, බෝග වගාවක් ඇරඹුවාය. එළවලු වර්ග, කොළ, පළා වර්ග බොහෝ අපූරුවට වැවෙනු දැකීමට ඇය මහත්සේ ඇලුම් කළාය.

**"කළුපහන ඉස්කෝලේ වගාව පටන් අරගෙන ටික දවසක් යද්දි, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමත් ආවා වගාව බලන්න. එතුමා එද්දි කාර්යාලය ඉස්සරහා ලබු වැලකුත් වවලා තිබුණේ. ඒකේ ගෙඩිත් හැදිලා. ඒ වගේම අනෙක් බෝගවලත් පලදාව ඒ වෙද්දි තිබුණා. හරිම හොඳ වැඩක් කරලා තියෙන්නේ කියලා එතුමා මට ප්‍රශංසා කළා."**

ඉන්දිරා ලිලානි කාර්යාල කාර්ය සහායිකාවක ලෙස පළමු පත්වීම ලබන්නේ 2006 වසරේදීයි. ඒ මීවනපලාන, මාපුටුගල විද්‍යාලයටය. ඇය උසස් පෙළ සමත් වූයේද එම විදුහලිනි. කලක් එහි සේවය කළ ඇය ඊළඟට පත්වීම් ලබන්නේ, බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවටය. මේ කොතැන සේවය කළත් ගන්නා වැටුපට, සාධාරණයක් ඉටු කළ යුතු යැයි හැඟීම මුල සිටම ඉන්දිරා තුළ තිබිණි.

මම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට කිව්වා සාරියක් ඇඳන් ඇවිත් මට ඉස්කෝලේ කරන්න දෙයක් නෑ කියලා

**"අපේ ගෙදර ඉඩම ලොකුවට ඉඩකඩ තියෙන ඉඩමක් නෙවෙයි. ඒ කාලේ බටු පැළයක්, මිරිස් පැළයක් හිටෙව්වට වඩා සාර්ථකව පලදාවක් ගන්න පුළුවන් වගාවකට මොන වගේ කැපවීමක් කරන්න ඕනද කියලා මම දැනගෙන හිටියේ නැහැ. එය අවබෝධ වුණේ කළුපහන පාසලේ වගාබිම ආරම්භ කළාට පස්සේ. උදේට ඒ වගේ ගහක කොළක පලදාව දකිද්දී දැනෙන සතුට දවසෙම හිතේ තියෙනවා."**



ඉන්දිරා වගාකටයුතුවල නියැලෙමින්

ඒ සතුට වාගේම ඉන්දිරාගේ උත්සාහයට ඇගයීමක්ද ලැබිණි. ඒ එවකට ක්‍රියාත්මක වූ තිරසර සංවර්ධන වැඩසටහන යටතේ බස්නාහිර පළාතේ පළමු ස්ථානය කළුපහන කනිෂ්ඨ විද්‍යාලයේ වගාබිමට ලබාදෙමිනි. ලංකාවෙන් හයවැනි තැනද එවර එම වගාවට ලැබුණි.

එසේ කාලය ගෙවෙද්දී 2019 වසරේ ඇයට ස්ථාන මාරුවක් ලැබෙන්නේ හොරණ කලාප අධ්‍යාපන කාර්යාලයටයි. එහි ගිය මුල් කාලයේම වගාව ගැන අදහසක් තිබුණත් කොරෝනා සමඟ එම අදහස ක්‍රියාත්මක කරන්නට ඇයට කලක් බලා සිටින්නට සිදුවිය.

**"ඇත්තටම මේ භූමියේ ලොකුවට ඉඩකඩ නැහැ. හැබැයි ඉඩ තියෙන තැන, ගල් බොරලු අයින් කරලා පාත්ති හදගන්න පුළුවන් ඉඩක් මම දැක්කා. ඒ වගේම ගෙදරට හාල් ගේන කවරවලට පස් පුරවලා වගා කරන්නත් පුළුවන්. ඉතින් මේකටත් අවසර ගන්න ඕන. මුලින්ම මං ඒ අදහස ගිණුම් අංශයේ කටයුතු කරන සම්පත් මල්ලිකාරත්න මහත්තයට කිව්වා. එළවලු වගාවක් පටන්ගන්න පුළුවන් නේද කියලා. ඔහු ඊට කැමැත්ත දුන්නා. ඊටපස්සේ මම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ඩී.එල්.වී.කේ. ජාසිංහ මහතාගෙන් අවසර අරගෙන වගා කටයුතු මෙහි කිහිපදෙනෙකුගේ සහයෝගයෙන් පටන්ගත්තා. දැන් මේ වගාබිමට මාස තුනක්."**


ඇය අවදිවන්නේ පාන්දර හතරටය. නිවැසියන් වෙනුවෙන් ආහාර පිස, උදේ හයට ඇය ගෙදරින් පිටත්වන්නේ කාර්යාල බිමේ ඇගේ සත්කාර ලබන්නට එළවලු ගස්, වැල්, කොළ, පළා ගස් වර්ග ආදරයෙන් බලා සිටිනා බව දන්නා නිසාය.

**"මම ගෙදරින් හයට ආවම හයයි තිහ වෙද්දි ඔෆිස් එකේ. පැය දෙකක් විතර මම වගාවට වතුර දනවා. සාත්තු කරනවා. අඩුපාඩු තැන් බලලා අලුත් පැළ හිටවනවා. හවසටත් එහෙමයි. ඕෆ් වෙලා පැය එකහමාරක් දෙකක් මම වගාබිමේ ඉන්නවා. හැමෝම ගියාට පස්සේ තමයි මම ගෙදර යන්නේ."**

වැඩි කාලයක් කලාප කාර්යාල භූමියේ







සිටියත්, ඇය අතිකාල දීමනාවක් හෝ වෙනත් දීමනාවක් ඒ වෙනුවෙන් ලබාගන්නේ නැත. තමා ගන්නා වැටුපට වැඩියෙන් සේවයක් කරන්නට ඇය නිතර සිතන්නීය.

**"මේ කලාප අධ්‍යාපන කාර්යාලයට කලාපයේ ගුරුවරු හාරදහසක් පමණ යනවා එනවා. දරුවෝ එක්ලක්ෂ ගාණක් එනවා යනවා. ඒ අය මේ වගාබිම දැක්කම අපිටත් එළවලු පැළයක්, මිරිස් පැළයක්, කොළ පළා ගහක් හිටවන්න පුළුවන් නේද කියලා අදහසක් ගන්නවා. අද කෑම අර්බුදය ගැන අපි නිතරම කතා කරනවා. ඉතින් මම කියන්නේ, ගෙදර තියෙන පුංචි ඉඩේ හරි මෙහෙම වගාවක් කරනවා නම් එළවලු ප්‍රශ්නය හරි විසඳගන්න පුළුවන්නේ."**

ඕනෑම දෙයක් කරන්නට ඕනෑ කරන්නේ, ඕනෑකම පමණි. ඊටපසු එයට ඕනෑ කරන කාලය හදගත හැකි බව ඉන්දිරා කියන්නීය.

මම උදේ හයට වැඩට යනවා. වගාව නිසා රස්සාවේ වගකීම් පැහැර හරින්නේ නැහැ

**"මට ගෙදරත් පොඩි කොරටුවක් තියෙනවා. මගේ ගෙදර වත්තේ ඉඩ ගොඩක් නැහැ. ඒ වගේම මම පාරේ තුවාල වෙලා අතරමං වුණු බල්ලෝ හයදෙනෙක් ගෙදර හදනවා. ඒ නිසා කොළ පළා වර්ග වගා කරන්න මගේ ගෙවත්තේ බැහැ. මේ හින්ද මගේ සහෝදරියගේ ඉඩමේ කොටසක අපි කොරටුවක් කරනවා. මගේ මහත්තයා රැකියාවක් විදියට කරන්නේ ශාන්තිකර්ම කටයුතු. ඔහුත් නිවාඩු වෙලාවට මාත් එක්ක කොරටුවට යනවා. බණ්ඩක්කා, මෑ, දඹල අපේ කොරටුවේ තියෙනවා. කොළ පළා ටික තියෙනවා. ඒවා කඩාගෙන ඇවිත් උයලා පහුවදට කාර්යාලයට ගිහින් කෑම එක දිගහරිද්දී දැනෙන සතුට කියලා නිම කරන්න බැහැ."**

ඉන්දිරා කියන්නේ ඇයගේ කටයුතුවලට සැමියාගෙන් ලැබෙන සහයෝගය නිසා කාර්යාල බිමේ වගා කරන්නට වුව කාලය සාදගත හැකිව ඇති බවයි. ඒ වාගේම ඇයට විසිහය හැවිරිදි පුතෙක් සිටිනා අතර, ඔහු පෞද්ගලික ආයතනයක රැකියාවක නියුතුය.

**"මම පැළයක් හිටවන්නේ 'සබ්බ පාපස්ස අකරණං' ගාථාව කියලා. ඒ වාගේම වියළි දණ්ඩක් හිටෙව්වත්, එය පැළවෙන අත්ගුණයක් මට තියෙනවා කියලා මම හිතනවා. වගා කටයුතු කරද්දී මට අනෙක් අයගේ සහයෝගය ලැබිලා තියෙනවා. හැබැයි, පැළයක් සිටුවද්දී මමම පස සැකසීමේ කාර්යය ඉඳන් කරන්න ලොකු ඕනෑකමක් තියෙනවා."**

ඇය කියන්නේ සතුටිනි. බිරිඳක මවක ලෙස වාගේම, රජයේ තමා කරන රැකියාවට අසාධාරණයක් නොවන්නට ඇය තම කාලය කළමනාකරණය කරගනිමින් සෙසු අයටද ලබාදෙන ආදර්ශය වැදගත්ය.

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ඩී.එල්.වී.කේ. ජාසිංහ මහතා කියන්නේ මහජනතාවගේ බදු මුදලින් වැටුප් ගන්නා ඉන්දිරා වැනි සේවකයින් රටට ණය නැති බවත්, එවැනි රාජ්‍ය සේවකයින් ජාතියටද වාසනාවක් බවයි. හොරණ කලාප අධ්‍යාපන භූමිය තුළ මේ වනවිට තක්කාලි, බණ්ඩක්කා, රතුලූනු, පතෝල, වැටකොළු, මිරිස්, කොළ පළා වර්ග වාගේම සලාද කොළ ද සොබාදහම හා හිනැහෙමින් තිබේ. ඒ හිනාව හැම ගෙමිදුලකම දකින්නට ලැබේ නම් එවන් සතුටක් තවත් නැති වග ඉන්දිරා කියන්නීය.

**දීපා වසන්ති එදිරිසිංහ**

# ශිෂ්‍යත්වය ලෙහෙසියෙන් ජය ගන්න

## කිරණ මාසික අධ්‍යාපනික පුවත්පත් 3

මැයි කලාපයන් දැන් වෙළෙඳපොළේ



## 5 කිරණ පත්තරෙන් ශිෂ්‍යත්වයට ඉලක්ක ප්‍රශ්න පත්තර හතරක්...

- කනට ඇහෙන ගීත
- සිංහල - ගණිතය - පරිසරය - දෙමළ - ඉංග්‍රීසි පාඩම් -
- රූප කොළ
- තෑගි ලැබෙන ප්‍රහේලිකා
- පුංචි ඔයාලගෙ කවි - කතන්දර ඇතුළු විශේෂාංග රැසක් සමඟින්

## දිවයින පුරා පුවත්පත් නියෝජිතයින්ගෙන් හා පොත්හල්වලින් දැන් මිලදී ගත හැක

කිරණ ශිෂ්‍යත්ව පුවත්පත හා සමගාමීව පැවැත්වෙන
fmG දෙරණ ශිෂ්‍යත්වය හරි ලේසියි
පාඩම් මාලාව
සෑම සතියේ දිනකම
පෙරවරු 6.00 සිට 7.00 දක්වා

ශිෂ්‍යත්වය හරි ලේසියි
fmG KIDS
YouTube
සම්මන්ත්‍රණ මාලාව
මැයි 21 වැනිදා සිට
සෑම සෙනසුරාදාවකම
පෙරවරු 8.00 සිට 12.00 දක්වා



# කට්ටඬියෙක් නොවුණට මාත් මාතර මිනිහෙක් කියලා යකාට කියන්න

ගම්පහ දිස්ත්‍රික්කයේ නගරබද ප්‍රදේශයක ජීවත්වන අවුරුද්දකුත් මාස තුනක් වයසැති පිරිමි දරුවෙකුට ඔහුගේ මියගිය මුත්තණුවන් හෙවත් පියාගේත් පියාගේ බැල්ම වැටී ඇතැයි පැවසෙන පුවතක් මීට මද කලෙකට ඉහත මට අසන්නට ලැබිණ. එම තොරතුරින් පැවසුණේ ඒ බිලිඳු දරුවාගේ මුත්තණුවන් අදෘශමානව පැමිණ බිලිඳාගේ ගෙල සිර කරන බවකි. එවිට ඒ දරුවා දරුණු වේදනාවකට පත්ව උගුරෙන් අමුතු හඬක් නංවමින් හඬා වැටෙයි.

මාතර ප්‍රදේශයේ ඉපිද හැදී වැඩී ඒ ප්‍රදේශයේ ප්‍රමුඛතම විද්‍යාලයකින් ඉගෙනුම ලැබූ බිලිඳු පුතුගේ පියා මේ වනවිට නාවුක නිලධාරියෙක් වශයෙන් රැකියාව කරයි. මීට සිව් වසරකට පෙර ඔහු ගම්පහ දිස්ත්‍රික්කයේ තරුණියක හා විවාහ වී එම ප්‍රදේශයේම මධ්‍යම පාන්තික නිවාස යෝජනා ක්‍රමයකින් නිවසක් මිලට ගෙන තිබේ.

බිරිඳගේ මව ජීවතුන් අතර නොමැති නිසා නව නිවස මිලට ගැනීමෙන් පසු ඇගේ තනි නොතනියට ළඟ හිඳ ඇත්තේ සැමියාගේ මවය. එමෙන්ම ඇය තම කුළුඳුල් දරු උපත සිදුකරන විට සැමියා මහ සයුරේ නාවික වෘත්තියේ යෙදී සිටි බැවින් ඒ කටයුතු සොයා බලා සිදුකර ඇත්තේද සැමියාගේ මව විසින්මය.

සැමියා නැවත සමුදුරු ජීවිතයෙන් මිදී මව්බිමට පැමිණෙන විට බිලිඳගේ වයස මාස හයකි. ඉන්පසු ඔහු යළි නැව් නැග ඇත්තේ බිලිඳගේ පළමු උපන්දින උත්සවය සැමරීමෙන් මාසයකට පසුවය. ඒ දක්වා දවසේ මුළු කාලයම තම බිලිඳු පුතු සුරතල් කිරීමට ඔහුට හැකි වී ඇත්තේ තමන් මව්බිමට පැමිණීමත් සමඟ මව මාතර මහගෙදර පදිංචියට යාම නිසාය.

ඔහු මෙවර නැව් නැගීමට පෙර නව නිවසේ ඉවුම් පිහුම් සහ බිලිඳු දරුවා බලාගැනීම පිණිස ගෘහ සේවිකාවකගේ අවශ්‍යතාව මතුවී තිබුණද එවැන්නියක සොයාගැනීමට නොහැකි වී ඇත. ඉන්පසු තරුණ බිරිඳට ඇගේ නිවස වසා දමා කුඩා දරුවාද සමඟ මාතර මහගෙදරට යාමට සිදුව ඇත්තේ සැමියාගේ මව ඇතුළු ඒ පවුලේ ඥාතීන්ගේ පෙරැත්තය නිසාය.

**“මාතර ගෙදරට අරන් ගිය දවසේ ඉඳලා පුතා එහෙම් පිටින්ම වෙනස් වුණා. ඊට පහුවෙනිද ඉඳලම හුස්ම හිරවෙන ගතියක් තිබුණා. ඒ එක්කම හැමතිස්සෙම හොටු ගලන්න පටන්ගත්තා. පුතා හිටපු ගමන් අමුතුම විදියකට ගෙදර වටපිටාව බලනවා. ඊටපස්සේ යටිගිරියෙන් බෙරිහන් දෙනවා. අපි සති දෙක තුනක් තිස්සේ පුතාව ඩොක්ටර්ස්ලා කීපදෙනෙකුටම පෙන්නුවා. ඒ අය බේතුත් දුන්නා. නමුත් පුතාගේ තත්ත්වය එන්න එන්නම වැඩි වුණා මිසක් කිසි අඩුවක් වුණේ නැහැ.”**

**ඒක අවුරුදු පනහකට වැඩිය පරණ ගෙයක්**

මගේ හිතවතෙකු මගින් දැන හඳුනාගත් දරුවාගේ මව දුරකතනයෙන් කියා සිටියාය.

පසුව තම දරුවාගේ රෝගී තත්ත්වය නිරන්තරව පැවතීම මත සිය නැන්දනිය ශාස්ත්‍ර ඇසීමකට ගොස් ඇති අතර, එම නිවසට මියගිය ඥාතියකුගේ බැල්ම වැටී ඇති බවත් පවුලේ කිසියම් සාමාජිකයෙකු තමන් වෙතට ඇද ගැනීමට ඒ මියගිය ඥාතියා වෙහෙසෙන බවත් ඒ ශාස්ත්‍රයට කියැවී තිබේ. පසුව ඒ ප්‍රාණකාරයා මීට වසර කිහිපයකට ඉහත මියගිය තම සැමියා බවත් ඔහු තමන් සමීපයට කැඳවාගැනීමට වෙර දරන තම පවුලේ සාමාජිකයා ඒ බිලිඳු දරුවා බවත් නැන්දනිය තම ලේලියට කියා ඇත.

මේ වනවිට මළ යකෙකු වී සිටින මියගිය ඥාතියා මන්ත්‍ර බලයෙන් බැඳ මහ මුහුදට දැමීම පිණිස තොවිලයක් කළ යුතු බවට ඒ වනවිට තීරණය වී තිබිණි. ඒ වනවිට තොවිලයේ ඇස්තමේන්තුගත වියදම රුපියල් ලක්ෂ අටක් වශයෙන් ගණන් බලා තිබිණ.

ඔය අතරවාරයේ අමනුෂ්‍ය දෝෂය සම්බන්ධ යම් අර්ථකථනයක් දිය හැකිද? යනුවෙන් එම පවුලේ ඥාතීන් ම'වෙතින් කළ ඉල්ලීමකට අනුව නිවස සම්බන්ධ ස්ථානීය පරීක්ෂාවක් සඳහා මම පසුගිය දිනයෙක මාතර ගියෙමි. එය මීට පනස් වසරකට පමණ පෙර ඉදිකොට ඇතැයි සැළකිය හැකි පැරණි නිවසකි. පරිසරය එතරම් නාගරික නොවුවද අවට පරිසරයේ තුරුලතා දුලබ වීම මත හාත්පස නිතර දුහුවිලි නැංවෙන තත්ත්වයක් මට නිරීක්ෂණය කළ හැකි විය.

**ගෙදර වැඩට ගෑනු කෙනෙක් හොයාගන්න බැරිවුණු නිසා තමයි මහගෙදර ගිහින් තියෙන්නෙ**

එමෙන්ම එම බිලිඳු රඳවා තිබුණේද නොයෙකුත් බඩු මුට්ටුවලින් පිරීගත් කාමරයක.

වයස මාස හයේ සිට අවුරුද්ද තෙක් කාලයක් තිස්සේ තම පියාගේ රූපයට, කටහඬට හුරුවී සිටි එම දරුවාට එක්වරම එය අහිමි වීමත්, ඒ සමඟම පිරිසිදු වාතාශ්‍රයක් සහිත නවීන නිවසක අවුරුද්දකට වැඩි කාලයක් ජීවත් වූ ඔහුට එක්වරම දුහුවිලි ආදියෙන් පිරීගත් පැරණි නිවසක විසීමට සිදුවීමත් මත ඔහුට වින කරන ඒ **‘මළගිය ප්‍රාණකාරයා’** නිවැරදිව හඳුනාගැනීමට මට හැකිවිය.

ළමා රෝග සහ ආසාත්මිකතා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය අජිත් අමරසිංහ දිගු කලෙක සිට මා හා කුළුපග ඇසුරක් පවත්වන හිතවතෙකි. එබැවින් එම මාතර නිවසේ සිටම ඔහුට දුරකතන ඇමතුමක් දුන් මම ඒ අමනුෂ්‍ය දෝෂයට ඉවහල් වන යථාර්ථවාදී පසුබිම ඔහුට විස්තර කළෙමි.

**“අපොයි, අපොයි ඔහොම සල්ලි ගරන එක මොන අපරාධයක්ද? ඔය ළමයව මගේ ළඟට අරන් එන්න කියන්න. මම ඔය ලෙඩේට හේතු විස්තර කරලා දීලා කරන්න ඕනෙ දේවලුත් කියලා දීලා බෙහෙතුත් දෙන්නම්.**

**ඕනෙ නම් මම යකාට කියන්නම් කියන්න කට්ටඬියෙක් නොවුණත් මාත් මාතර මිනිහෙක් කියලා.”**

වෛද්‍ය අජිත් අමරසිංහ සිනාසෙමින් කීය. කෙසේ හෝ මේ සිදුවීමට දැන් සති කිහිපයක් ගත වී ඇති අතර මේ වනවිට එම වෛද්‍ය ප්‍රතිකාරවලින් කිසිඳු තොවිල් කිරීමකින් තොරව එම බිලිඳු සුවය ලබා ඇතැයි එම පවුලේ ඥාතීහු මා හා කීහ.



මාධ්‍යවේදී
**තිලක් සේනාසිංහ**

# දේවාලේ නැති දෙවියෝ තෙල් පෝලිම්වල වැඩ සිටියෝ

**මට බයික් එක අරන් ෂෙඩ් එක ගාවට එන්න විතරක්වත් තෙල් ටිකක් දෙන්න**



ඒ පසුගිය බදාදා උදෑසනය. ඒ වනවිටත් අතිශය ජනාකීර්ණ බිබිල නගරයේ ප්‍රධාන ඉන්ධන පිරවුම්හලේ තිබුණේ දිගු තෙල් පෝලිමකි. බිබිල නගරයට එය අලුත් අත්දැකීමකුත් නොවේ. මන්ද සෑම දිනකම පාහේ එහි එවන් පෝලිම්ය. පෝලිම්වල සිටි රියැදුරෝ තමන්ගේ වාරය එනතෙක් බලා සිටියහ.

ඔය අතරතුර හිස් බෝතලයක් අතැතිව පිරවුම්හළට ගොඩවුණේ කාන්තාවක්ය. ඒ තමාගේ යතුරුපැදිය අතරමඟ නතරවීම නිසා බෝතලයට පෙට්‍රල් ටිකක් රැගෙන යන්නටයි. එහෙත් බෝතල්, කෑන්, බූලි ආදියට තෙල් ලබා නොදෙන බවට ඒ වනවිටත් අදාළ ඉන්ධන පිරවුම්හල නිවේදනය කර තිබූ බවක් ඇය දැන සිටියේ නැත. එනිසා තෙල් අවශ්‍ය නම් කළ යුතුව තිබූ එකම දේ වූයේ වාහනය රැගෙන තෙල් පෝලිමට එකතුවීමයි. නමුත් ඇගේ යතුරුපැදිය තිබුණේ තල්ලු කරගෙන හෝ පැමිණිය හැකි දුරක නොවේ.

**"දැන් ඔයාට බෝතලේට තෙල් දුන්නොත් අනිත් අයත් එහෙම ඉල්ලයි."**

ඇගේ ආයාචනය හමුවේ ඉන්ධන පිරවුම්හල් සේවකයින්ගෙන් ලැබුණේ එහෙම පිළිතුරකි. කරන්නට කිසිත් නොවූ කල ඇය කළේ වාහන පෝලිම අගින් ප්ලාස්ටික් හිස් බෝතලයක් අතැතිව හිටගැනීමයි. දිගු පෝලිමක තම වාහනය තබාගෙන තම වාරය එනතෙක් බලා සිටි රියැදුරන්ට මේ දසුන වාවන්නට නොහැකි වූ තැන ඔවුන් ඇයට ඉදිරියට පැමිණීමට අවස්ථාව ලබාදුන්හ. නමුත් පිරවුම්හලේ සේවකයින් එවරද බෝතලයට ඉන්ධන ලබාදීම ප්‍රතික්ෂේප කළහ.

**"මට බයික් එක අරන් ෂෙඩ් එක ගාවට එන්න විතරක්වත් තෙල් ටිකක් දෙන්න."**

**පෙර දිනක වරු ගාණක් පෝලිමේ සිට ගසාගස් තෙල් ටික එසේ දන්දෙන්නට තරම් ඔහුගේ පපුව කොතරම් උණුහුම් විය යුතුද? අවසානයේ අපට හිතුණේ එපමණකි**

බැරිම තැන එසේ කීවද ඒ වචනවලටත් පිරවුම්හල් සේවකයින්ගේ හිත් උණුවුණේ නැත. අවසානයේ කුමන මොහොතක හෝ තෙල් ටිකක් ලැබේවි යැයි සිතා ඇය නිහඬ වූවාය.

මේ අතරවාරයේ මේ සිදුවීම දෙස එක්තරා පුද්ගලයෙක් ඉතා ඕනෑකමින් බලා සිටියේය. ඒ QX 11XX ත්‍රීරෝද රථයේ රියැදුරු තරුණයාය. ඔහුට මේ කාන්තාව ගැන ඇතිවූයේ අනුකම්පාවකි. ඒ නිසාම ඔහු රථයෙන් බැස හනි හනිකට කාන්තාව අසළට ගියේය.

**"අම්මේ, කෝ දෙන්න තෙල් අරන් යන්න ගෙනාපු බෝතලේ..."**

කුමක් සිදුවීමට යන්නේද යන වග එතැන සිටි සියල්ලන්ටම ප්‍රශ්නාර්ථයක් විය.

**"අරුන්ට ටෝක් කරලා තෙල් අරන් දෙන්න වගේ හදන්නේ..."**

බොහෝමයක් දෙනා තමන්ට ආ ප්‍රශ්නාර්ථයට පිළිතුරු නිර්මාණය කරගත්තේ එහෙමය. එහෙත් ඔවුන්ගේ සිතුවිල්ල වැරදි කරමින් බෝතලය අතටගත් තරුණයා හනි හනිකට ගියේ තම ත්‍රීරෝද රථය පිටුපසටය. එසේ ගිය ඔහු වැසිය විවෘත කර කෙළින්ම ඉන්ධන බටය ගළවා දැම්මේය. අනතුරුව එය බෝතලයට ඇතුල් කර ත්‍රීරෝද රථයේ වූ පෙට්‍රල්වලින් හිස් බෝතලය පිරෙව්වේය.

**"ආ බෝතලේ ගන්න. ගිහින් බයික් එකට දාගන්න."**

ඔහුට පින් යැයි කියන්නට කටට ආ වචන ගොනු කරගන්නට බැරුව ඇගේ දෑස් දිගේ කඳුළැලි දෝර ගලන්නට විය. අතේ ගුලිකර උන් මුදල් නෝට්ටු කිහිපයක් ඔහුගේ අතේ ගුලිකර ඇය යන්නට හැරුණා පමණි. ත්‍රීරෝද රථ රියැදුරා ඇයව යළිත් නැවතීය.

**"මට සල්ලි එපා."**

එසේ කියමින් ඔහු නැවත තෙල් පෝලිමට එකතු විය. පෙර දිනක වරු ගාණක් පෝලිමේ සිට ගසාගස් තෙල් ටික එසේ දන්දෙන්නට තරම් ඔහුගේ පපුව කොතරම් උණුහුම් විය යුතුද? අවසානයේ අපට හිතුණේ එපමණකි.

**භාතිය වෙඩිවර්ධන**



# ‘ඉන්න බැරිනම් දමලා ගහලා වරෙන්’ කියලා එදා තාත්තා මට කිව්වෙ නෑ



**පුද්ගලික සම්බන්ධතා ගත්තත්, රාජකාරී මට්ටමේ සබඳතා ගත්තත් බොහෝවිට අපි පුරුදුවී සිටින්නේ අගය කිරීමට හෝ ප්‍රශංසා කිරීමට වඩා චෝදනා කිරීමටයි. එසේත් නැතිනම් මැසිවිලි නැගීමටයි. එම සබඳතා නිසා සතුටු වෙන්නට කාරණා සියයක් ඇතත්, පසුතැවෙන්නට ඇති එක් කාරණාවක් හෝ මුල් කරගෙන අපි කරන්නේ සියල්ල අවුල් කරගැනීමයි.**

**සැමියා දහම් සහ දරුවෝ තිදෙනා සමඟ ජපානයේ ජීවත්වන හෂිනි මනමේන්ද්‍ර ඇගේ ජීවිත අත්දැකීම් ඇසුරින් අපිට කියාදෙන්නේ විශේෂයෙන්ම ‘පවුල’ නමැති සම්බන්ධතාවයට මූලිකත්වය දීම සහ එය රැකගැනීමේ ඇති වැදගත්කමයි. එමෙන්ම ඕනෑම හොඳ හෝ නරක සිදුවීමකටම පසු සතුට විය හැකි කාරණා පමණක් ජීවිතයට එක් කරගැනීමෙන්, බලා සිටියදී පවුල් ජීවිතය සතුටින් පිරී ඉතිරී යන අයුරු ඇය කියන්නේ සතුටින් ජීවිතය දරණ ඇගේ ජීවන අත්දැකීම් සමුදාය මුල්කරගෙනය.**

විවාහ ජීවිතෙත් හරියට විශ්වවිද්‍යාලයක් වගේ කියලයි වෙලාවකට මට හිතෙන්නේ. දවස ගානේ ගෙවෙන හැම විනාඩියකම අනිත් කෙනාගෙ සතුට සැනසීම වෙනුවෙන් ජීවත්වෙන්නෙ කොහොමද කියලා අපි අලුතින් ඉගෙනගන්නවා. මහත්තයාගෙ, දරුවන්ගෙ සතුට ගැන හිතනවා වගේම එයාලා නිසා අපි සතුටු වෙන්නත්, එයාලා නිසා හිත රිදෙන තැන්වලදි හිත හයිය කරගෙන ජීවත් වෙන්නත් ඉගෙනගන්නවා.

මම අද විවාහ ජීවිතයේ සතුට, සැනසීම උපරිමයෙන් විඳින කෙනෙක්. **‘ඇත්තටම ඔච්චර සතුටින් ඉන්න පුළුවන්ද?’** කියලා කෙනෙකුට හිතෙන තරමට මං අද ඉන්නේ සතුටින්. හැබැයි කටුක අත්දැකීම් නොතිබුණාම නෙවෙයි. ඒ හැම අමිහිරි අත්දැකීමක්ම ජීවිතේ හරි පාරට ගේන්න වෙස් වලාගෙන ආපු ආශිර්වාද කියලයි අද මට හිතෙන්නේ. මේකත් එහෙම කතාවක්.

> **දෙන්නෙක් කසාද බඳින්නෙ ප්‍රශ්න වුණාම දෙපැත්තට වෙන්නත්, ඒවා විසඳුණාම ආපහු එකට ජීවත් වෙන්නත් නෙවෙයි. මැරෙනකල් එකට ඉන්න**

මේ මැයි මාසේ 13 වෙනිදට අපි විවාහ වෙලා අවුරුදු දහයක්. ඒ වෙනකොට මං හිටියේ කිසිම දෙයක් තනියම කරගන්න බැරි උදව්වට කවුරුම හරි ඕන වුණ කෙනෙක් විදියට. අනිත් එක තමයි මොනා දේ වුණත් අම්මලා ගාවට දුවන්න බලාගෙනයි මම හිටියේ. ඔහොම ඉන්නකොට මගේ 30 වෙනි උපන්දිනේ දවසේ මට අමතක නොවෙන සිද්ධියක් වුණා. ඔවිනයා දූ එයා ඉඳගන්න පුංචි පුටුවේ පොඩි හිඩසක ඔලුව හිරකරගෙන, ගන්න බැරුව ලොකු ප්‍රශ්නයක් වුණා. එදා මෙහේ ඇම්බියුලන්ස්වලින් ඇවිත් තමයි දුවව මුදවාගත්තේ. මොකද එදා දහම් ගෙදර හිටියෙ නෑ. ඉතින් එදා දැනුණු වේදනාවට මං දහම්ට අඬ අඬ කිව්වා **“මාව දරු දෙන්නා එක්ක ලංකාවට යවන්න, එයාලා ඉස්කෝලේ දාන්න ළංවුණාම මං ආයේ එන්නම්. මට තනියෙන් මේ වැඩ කරගන්න බෑ, ඔයත් මාසෙන් බාගයක් විතර ගෙදර නෑ. අද මගේ උපන්දිනේ කියලාවත් හිතුවද? කම්පැනි එකේ ඇනිවසරි එක කියලා ඒකට ගියා. මාවද වටින්නේ ඒකද වටින්නේ? අද ඔයා හිටියා නම් මේ දේ ඔචීට වෙන්නේ නෑ...”** කියලා.

අකමැත්තෙන් වුණත් මගේ පෙරැත්තය නිසා දහම් මාව ලංකාවට යවන්න කැමති වුණා.

මේ විස්තරේ මම මගේ අම්මටයි තාත්තටයිත් කිව්වා. එතකොට තාත්තා කිව්වේ, **“ඔයා මෙහේ එන එක අපිට ප්‍රශ්නයක් නෙවෙයි දුව. ඔයා ආවාම දහම් පුතාට මොකද වෙන්නේ? කසාද බැන්දම ඉන්න ඕන එකට. ප්‍රශ්නවලට මූණදෙන්න ඕන එකට. ඔයාට දහම් පුතා එක්ක හොඳ රටක ජීවත් වෙන්න වාසනාව ලැබිලා තියෙද්දිත් ඔහොම දේවල්වලට අපි ගාවට දුවගෙන එන්න එපා. ඕවා ප්‍රශ්න නෙවෙයි මගේ අම්මා... හොඳ දුව වගේ දහම් පුතා එක්ක ඔහෙට වෙලා ඉන්න. ඔයාට වැඩ කරගන්න අමාරුයි නම් රාණි අම්මා එවන්නම් ටික දවසකට...”** කියලා.

ඉතින් මම ආපස්සට දහම්ට කතා කරලා තාත්තා කියපු ටික කිව්වා. ඒ වෙලේ එයාගේ හිතේ තිබ්බ ලොකු බරක් නිදහස් වුණා වගේ ඒ මුණෙන් මට පෙනුණා.

**“මං ආස ඔයලා මං එක්ක ඉන්නවට. මං කොහේ ගියත් මට මෙහේ ඔයාලාගේ ආරක්ෂාව ගැන බය නෑ. අනික මට ඔයාලා තුන්දෙනාගෙන් ඈත්වෙලා ඉන්න බෑ. මං එහෙම ඉන්න ආස නෑ. අපි කසාද බැන්දේ ප්‍රශ්න වුණාම තැන් දෙකකට වෙලා, ඒවා විසඳුනාම ආපහු එකට ජීවත් වෙන්න නෙවෙයිනේ. මට සතුටුයි ඔයා ගත්ත තීරණේට. ඔයාට පුළුවන් හැමවිදියටම මං උදව් කරන්නම්. අපි රාණි අම්මාවත් ගෙන්න ගමු ටික කාලෙකට. ඔයාට අමාරුයි කියලා මට තේරෙනවා...”** කියලත් කිව්වා.

> **ඉතින් මං දැන් දන්නවා පවුල් ජීවිතේ ඇතුළේ තියෙන්නම ඕනේ දෙන්නාගෙම සහයෝගේ. ‘ඔයා මේක කරාට මාත් මේක කරනවා නෙවෙයි, අපි දෙන්නාම කරමු’ කියන හැඟීම තියෙන්න ඕනේ**

රාණි අම්මා කියන්නේ අපි ඉපදුණ දා ඉඳන් අපිට ළෙංගතු, අම්මා හා සමානව ආදරේ දීපු අපේ ආච්චි කෙනෙක්. ඉතින් දහම් කියපු විදියට අපි රාණි අම්මව ජපානෙට ගෙන්න ගත්තා. එයා අපි ගාව හිටපු කාලෙදි මං තවත් පිළිවෙල, පිරිසිදුකම රාණි අම්මාගෙන් ඉගෙනගත්තා. අයාන් පුතා එතකොට ඉපදිලා නෑ. ඒ කාලෙදිත් මගේ වැඩ ලේසි කරන්න දහම් හැමදේම කළේ පවුලක් විදියට අපි එකට ඉන්න ඕන නිසා. ඒ සිද්ධියෙන් පස්සෙත් වැදගත් දෙයක් වුණා. මගේ උපන්දිනේ වගේ විශේෂ දවස්වල දහම් කල්තියා නිවාඩු අනුමත කරගත්තා.



රාණි අම්මා

ඉතින් මං දැන් දන්නවා පවුල් ජීවිතේ ඇතුළේ දෙන්නාගෙම සහයෝගය තියෙන්නම ඕනේ. ‘ඔයා මේක කරාට මාත් මේක කරනවා නෙවෙයි, අපි දෙන්නාම කරමු’ කියන හැඟීම තියෙන්න ඕනේ. ඕනම දේකට මූණ දෙන්න හිත ශක්තිමත් කරගන්න ඕනේ. ගෙදරින් වෙන්වෙලා වෙනම ජීවත් වෙන කෙනෙක් නම්, කාගෙවත් සහයෝගයක් බලාපොරොත්තු නොවී පුළුවන් තරම් බිරිඳ සැමියාටත් සැමියා බිරිඳටත් සහයෝගය දුන්නාම ආදරෙත් එක්ක ඉස්සරහට යන්න පුළුවන්. අඩුපාඩු වගේම මගහැරෙන තැන් ඒවි. දෙන්නට දෙන්නා සහයෝගෙන් ඉන්නකොට ඒවා දිහා වුණත් පරිණත විදියට බලන්න පුළුවන් වේවි.

අනිත් එක මේකත් කියන්න ඕන. අම්මලා තාත්තලාට මොන වැරැද්ද වුණත් තමන්ගේ දරුවා වටිනවා තමයි. ඒ නිසා දරුවො පවුල් ජීවිත ගත කරන්න ගත්තට පස්සේ තමන්ගේ දුව හෝ පුතා කියන දේ අහලා, සමහරවිට ලේලි හෝ බෑණා එක්ක අමනාප වෙන දෙමව්පියෝ වැඩියි. සමහර වෙලාවට තමන්ගේ මහත්තයා එක්ක පුංචි රණ්ඩුවක් හදාගෙන දුව ගෙදර එන්න හැදුවම **‘උඹව අපිට වැඩි නෑ. ඕක අතෑරලා දාලා වරෙන්’** කියන අම්මලා තාත්තලාත් නැතුවම නෙවෙයි. හැබැයි ඒ වගේ තැන්වලදි දෙමව්පියෝ ටිකක් ඉවසීමෙන්, බුද්ධිමත්ව කටයුතු නොකළොත් දරුවන්ගේ පවුල් ජීවිත අවුල් වෙලාම යන්න පුළුවන්.

මේත් එක්ක තවත් සතුටු දෙයකුත් ලියනවා. **‘ධරණී’** පුවත්පතට ලිපි ලියන්න අරන් අදට අවුරුද්දක්. ඒ ලිපි ආදරෙන් වැළඳගත්ත පාඨක ඔබ සැමට හදවතින්ම ස්තූතිවන්ත වෙනවා. සමාජ මාධ්‍යයේ විතරක් ලිපිවලින් සතුට බෙදපු මට මුද්‍රිත මාධ්‍ය තුළිනුත් ඒ සතුට බෙදන්න අවස්ථාව දුන්නු **‘ධරණී’** පුවත්පතට ගොඩාක් ස්තූතියි.

**හෂිණී මනමේන්ද්‍ර**

සම්බන්ධීකරණය -
ගල්කිස්ස
මහ හෝටලයේ
නිමාකෝ ද සිල්වා

ගල්කිස්ස මහ හෝටලයේ
ආහාර හා ප්‍රවර්ධක අධ්‍යක්ෂ
ආචාර්ය පබ්ලිස් සිල්වා
ඉදිරිපත් කරයි



# නෙළුම් අල කැඳ

## අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| අලුත් නෙළුම් අල | 500g |
| කැකුළු හාල් | 100g |
| ගාගත් පොල් | 50g |
| සුදුලූනු | 10g |
| ඉඟුරු අඟල් | 2 |
| වතුර අඬුකෝප්ප | 8 |
| ලුණු රස අනුව | |

## සාදන ක්‍රමය

- හාල් සෝදා භාජනයකට දමන්න.
- එයට වතුර සමඟ ඉඟුරු සහ සුදුලූනු එකතු කරන්න.
- උතුරන විට ගින්දර අඩු කරන්න.
- නෙළුම් අල සෝදා සිහින්ව කපා වතුර ස්වල්පයක් දමා බ්ලෙන්ඩ් කරගන්න. නැතිනම් කොටාගන්න.
- බ්ලෙන්ඩ් කරගත් පසු ඉස්ම පෙරාගන්න.
- ඉතුරු රොඩු කොටසට පොල් දමා, නැවත වතුර ස්වල්පයක් දමා බ්ලෙන්ඩ් කරන්න.
- බත්වල වතුර පෙරා ඉඟුරු කෑල්ල අස්කර බ්ලෙන්ඩ් කරගෙන හෝ පොඩි කරගන්න.
- බ්ලෙන්ඩ් කරගත් බත්වලට පොල් ද මිරිකාගත් යුෂ දමා බත්වලින් පෙරාගත් කැඳ එක්කර ලිප තබා උතුරන විට ගින්දර අඩුකර උඩට එන පෙණ අස්කරගන්න.
- කැඳවලට ලුණු එකතු කරන්න.
- ඉන්පසු මුලින් මිරිකාගත් යුෂ දමා විනාඩි 2ක් පමණ හැඳිගාමින් ගින්දර නිවන්න.
- ගින්දර නිවා ලිප මතින් භාජනය ඉවත් කරගත් පසු තව විනාඩි 3ක් පමණ හැඳිගාන්න.

# කොස් සුප්



## අවශ්‍ය ද්‍රව්‍ය

- කොස් මදුළු 500g
- කැරට් 30g
- ලීක්ස් (සුදු කොටස) 30g
- සැල්දිරි (දඬු කොටස) 30g
- කරපිංචා මේස හැඳි 1
- කුරුඳු කොළ 1
- කරඳමුංගු 2
- කරාබුනැටි 2
- තෝර පරිප්පු 100g
- වතුර 6L
- බටර් මේස හැඳි 1
- එළකිරි 1/2L
- බිත්තර කහමද 2
- ගම්මිරිස් ඇට තේ හැඳි 1/2
- කොත්තමල්ලි කුඩු තේ හැඳි 1
- සූදුරු කුඩු තේ හැඳි 1/2
- කහ කුඩු තේ හැඳි 1/2
- කොස් ඇට 10
- තෙල් අඬුකෝප්ප 1
- ලුණු රස අනුව

## සාදන ක්‍රමය

- කොස් ඇට සුද්දකර බාගෙට තම්බා හතරට පළා අඟල් 1/4 විෂ්කම්භයට කපා ගැඹුරු තෙලේ බැදගන්න.
- කරපිංචා, කුරුඳුකොළ, කරඳමුංගු, කරාබුනැටි, ගම්මිරිස් ඇට, දුහුල් රෙදි කෑල්ලක පොට්ටනියක් බැදගන්න.
- කැරට්, ලීක්ස්, සැල්දිරි දඬු පොඩියට කපාගන්න.
- කොස් මදුළු සිහින්ව කපාගන්න.
- භාජනයක් ලිප තබා බටර් එක්කර, කපාගත් එළවළු, කොස් දමා තරමක් බැදෙන්න හැර කොත්තමල්ලි කුඩු, සූදුරු කුඩු, කහ කුඩු දමා වතුර සහ සෝදගත් පරිප්පු එකතු කරන්න.
- උතුරන විට ගින්දර අඩු කර සාදගත් පොට්ටනිය දමාගන්න.
- ඉන්පසු හොඳට තම්බාගන්න.
- හොඳින් තැම්බුණාට පසු පොට්ටනිය ඉවත් කර බ්ලෙන්ඩ් කර හෝ පොඩිකර පෙරාගන්න.
- නැවත ලිප තබා උතුරන විට ගින්දර අඩුකර උඩට එන පෙණ ඉවත් කර ලිප නිවාගන්න. ඉන්පසු එම භාජනයටම බිත්තර කහමද දෙක සහ කිරි මිශ්‍ර කර හැඳිගාමින් ලුණු එකතු කරන්න.
- සුප් පිළිගන්වනා අවස්ථාවේදී බැදගත් කොස් ඇට එකතු කරන්න.

dharanee.lk



# අඹ යුෂ සමඟ කරවිල පානය

**අවශ්‍ය ද්‍රව්‍ය**

- අඹ ගෙඩි 4
- උතුරුවා නිවාගත් වතුර අඩුකෝප්ප 4
- කරවිල 100g
- සීනි 50g
- ලුණු තේ හැඳි 1/2

**සාදන ක්‍රමය**

- සෝදා, පොතු සහ ඇට ඉවත් කර අඹ කපාගන්න.
- අඹවලට ලුණු, සීනි, වතුර අඩුකෝප්ප 2ක් එකතු කර බ්ලෙන්ඩ් කරගන්න.
- කරවිල ඇට ඉවත් කර සෝදා ඉතිරි වතුර අඩුකෝප්ප 2 දමා, ලුණු එකතු කර බ්ලෙන්ඩ් කරගන්න.
- වෙන වෙනම ශීතකරණයේ තබන්න.
- වීදුරුවකට 3/4ක ප්‍රමාණයට අඹ යුෂ වත්කරගන්න.
- එම වීදුරුවට කරවිල යුෂ තේ හැඳි 2ක් එකතු කර මිශ්‍ර කරන්න.



# කැරට් සහ පේර බීම

**අවශ්‍ය ද්‍රව්‍ය**

- කැරට් 400g
- උතුරුවා නිවාගත් වතුර අඩුකෝප්ප 4
- පේර 400g
- සීනි 40g
- ලුණු තේ හැඳි 1/2

**සාදන ක්‍රමය**

- කැරට් සුද්දකර, සෝදා, කපා වතුර අඩුකෝප්ප 2ක් එකතු කර බ්ලෙන්ඩ් කර පෙරාගන්න.
- පේර සෝදා, සීනි සහ ඉතිරි වතුර අඩුකෝප්ප 2 එකතු කර බ්ලෙන්ඩ් කර පෙරාගන්න.
- පිළිගැන්වීමේදී වීදුරුවට පේර යුෂ එකතු කර ඊට උඩින් කැරට් යුෂ දමාගන්න.



# දෙහි අච්චාරු

## අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| ලුණුදෙහි (පැණි රස) | 500g |
| විනාකිරි අඩුකෝප්ප | 1 |
| වියළි මුද්දරප්පලම් | 50g |
| සීනි | 100g |
| අඹ චට්නි මේස හැඳි | 4 |
| දෙහි කොළ | 5 |
| ලුණු රස අනුව | |

## සාදන ක්‍රමය

- ලුණුදෙහි පොඩියට කපාගන්න.
- සීනි, අඹ චට්නි, වියළි මුද්දරප්පලම් විනාකිරෙන් බ්ලෙන්ඩ් කරන්න.
- බ්ලෙන්ඩ් කරගත් මිශ්‍රණයට කපාගත් ලුණුදෙහි එකතු කරන්න.
- සෝද පිරිසිදු කරගත් දෙහි කොළ 5ක් එකතු කර දින දෙකකට පසු ප්‍රයෝජනයට ගන්න.
- රස අනුව ලුණු එකතු කරන්න.



# වෙරළු අච්චාරු

## අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| වෙරළු ගෙඩි | 25 |
| විනාකිරි අඩුකෝප්ප | 2 1/2 |
| ගම්මිරිස් ඇට | 10 |
| කුරුඳුපොතු අඟල් | 1 |
| කරාබුනැටි | 3 |
| කරදමුංගු | 3 |
| කහකුඩු තේ හැඳි | 1/2 |
| සීනි තේ හැඳි | 1 |
| ලුණු රස අනුව | |

## සාදන ක්‍රමය

- වෙරළු සෝදගන්න.
- වතුර අඩුකෝප්ප 2කට විනාකිරි අඩුකෝප්ප 1/2ක් එකතු කර භාජනයකට දමා ලිප තබන්න.
- මිශ්‍රණය උතුරන විට වෙරළු එකතු කරන්න.
- ලිපෙහි ගින්දර අඩු කරන්න.
- මදගින්නේ පැය 1/2ක් පමණ තම්බා පෙරාගන්න.
- සීනි සහ වෙරළු හැර අන් සියල්ල ලිප තබා විනාඩි 15ක් පමණ අඩු ගින්දරේ තම්බාගෙන පෙරාගන්න.
- පෙරාගත් වතුරට වෙරළු, සීනි එක්කර නැවත ලිප තබා විනාඩි 10ක් පමණ මද ගින්දරේ උයාගන්න.
- ඉන්පසු භාජනයක දමා තිවුණු පසු ශීතකරණයේ දින 3ක් තබා ප්‍රයෝජනයට ගන්න.

# මෝර මාළු කළු පොලට



## අවශ්‍ය ද්‍රව්‍ය

- මෝර මාළු 250g
- අමුමිරිස් කරල් 2
- සුදුලූනු (කපාගත්) තේ හැඳි 1
- අමුඉඟුරු (කපාගත්) තේ හැඳි 1/2
- කරපිංචා (කපාගත්) මේස හැඳි 1
- කරි කුඩු තේ හැඳි 1
- මිරිස් කුඩු තේ හැඳි 1
- ගම්මිරිස් කුඩු තේ හැඳි 1
- කහ කුඩු තේ හැඳි 1/2
- පොල් (ගාගෙන බැදගත්) මේස හැඳි 1
- පරිප්පු කුඩු (බැදගත්) මේස හැඳි 1/2
- ගොරකා 30g
- මිටිකිරි අඩුකෝප්ප 1/2
- ලුණු රස අනුව

## සාදන ක්‍රමය

- මෝර මාළු, මිටිකිරි, බැදගත් පොල්, පරිප්පු කුඩු හැර අන් සියල්ල එකට අඹරාගන්න.
- බැදගත් පොල්, මිටිකිරි සමඟ බ්ලෙන්ඩ් කරගන්න.
- අඹරාගත් සියලු දේ (බ්ලෙන්ඩ් කරගත්) මිශ්‍ර කර, මිටිකිරි හැර මෝර මාළුවලට දමා වතුර අඩුකෝප්පයක්ද එක්කර ගන්න.
- එයට ලුණු එකතු කර ලිප තබා උතුරන විට ගින්දර අඩු කරන්න.
- මාළු හොඳින් තැම්බුණාට පසු බ්ලෙන්ඩ් කරගත් දෑ සමඟ පරිප්පු කුඩු එකතු කර උතුරනතුරු තබා ලිපෙන් බාගන්න.

# ඉස්සන් කිරි රසට



## අවශ්‍ය ද්‍රව්‍ය

- ඉස්සෝ (ඔලු කඩා, සුද්දකර, සෝදගත්) 250g
- ලූනු (පොඩියට කපාගත්) 30g
- කරපිංචා (ලියාගත්) මේස හැඳි 1
- අමුමිරිස් (කපාගත්) කරල් 3
- රම්පේ අඟල් 1/2
- සුදුලූනු තේ හැඳි 1
- කුරුඳුපොතු අඟල් 1/2
- කරි කුඩු තේ හැඳි 1 1/2
- මිරිස් කුඩු තේ හැඳි 1
- කහ කුඩු තේ හැඳි 1
- අමුඉඟුරු තේ හැඳි 1/2
- දියකිරි අඩුකෝප්ප 1 1/2
- මිටිකිරි අඩුකෝප්ප 1/2
- උලුහාල් (බැදගත්) තේ හැඳි 1/2
- තක්කාලි (පොඩියට කපාගත්) 40g
- මුරුංගා කොළ (සෝදා සූරාගත්) මේස හැඳි 1
- ලුණු රස අනුව

## සාදන ක්‍රමය

- ඉස්සන් සුද්ද කරනවිට ඉවත් කරගත් ඉස්සන් ඔලු සෝදාගන්න.
- කරපිංචා, අමුමිරිස්, සුදුලූනු, අමුඉඟුරු, ඉස්සන් ඔලු සමඟ අඹරාගන්න.
- මිටිකිරි, මුරුංගා කොළ හැර අන් සියල්ල සමඟ අඹරාගත් මිශ්‍රණයට ඉස්සන්ද එකතු කර භාජනයකට දමා ලිප තබා උතුරන තුරු හැළිගාන්න.
- එයට මිටිකිරිද එක්කර තරමක් උතුරන විට ගින්දර නිවා මුරුංගා කොළ දමා හැළිගාගන්න.
- තරමක් නිවෙනතුරු හැළිගාන්න.

# සිංහල වගේම දමිළ රසික පිරිසකුත් ඉන්න එක මට සතුටක්

## හර්ෂි අංජුමාලා




සුරූපී ඉන්දියානු නිළි අයිශ්වර්යා රායිගෙන් නිවේදකයෙක් දවසක් මෙහෙම අහනවා.

**"අයිශ් ඔයාට ඉස්කොලේ යන කාලේ හොඳට ඉගෙනගන්න පුළුවන් කියන්නේ ඇත්තද?"**

**"ඔව්, මම තමයි මගේ පංතියේ හිටි දක්ෂම ශිෂ්‍යාව. ලස්සන අයට වෙනත් හැකියාවන් නැහැ කියලා ගොඩක් අය හිතනවා. එහෙම නැහැ. ලස්සන, බුද්ධිමත්කම, හැකියාවන් මේ සේරම එකම තැනක පිහිටන්න පුළුවන්."**

අද කවරය හැඩ කරන රූබර යුවතියගේ ආගිය තොරතුරු කතා කරද්දි අයිශ් කිව්ව ඒ කතාව මට මතක් වුණා. ලොවෙන් එකෙක් එක් දෙයකට වෙයි සමත කියලා කතාවක් තියෙනවනේ. හැබැයි ඒ කතාව ඇත්තක් නෙමෙයි කියලා ඔප්පු කරපු මිනිස්සු ඕන තරම් මේ ලෝකේ ඉන්නවා. මැයත් ඒ කුලකයේම කෙනෙක්. ලස්සන, හැකියාවන්, දක්ෂතාවයන් එක්ක කලා ලොවේ ලස්සන ගමනක් යන ඇය වෙන කවුරුත් නෙමෙයි, මේ දවස්වල දෙරණ නාළිකාවේ විකාශය වෙන 'රාජිනි' ටෙලි නාට්‍යයේ ආදරණීය 'අභී' නැත්තම් හර්ෂි අංජුමාලා.

**අභී කියන්නද අංජුමාලා කියන්නද?**

**"ඒ දෙකෙන් මොකක් කිව්වත් කමක් නෑ. මේ දවස්වල ගොඩක් අය මට කතා කරන්නේ අභී කියලා. ඒ තරමට ඒ චරිතය ජනප්‍රියයි. මේ ළඟකදි මම ටිකක් දුර බැහැර පළාතක දමිළ කඩයකට ගියා. මම මාස්ක් එක ගැලෙව්වා විතරයි එතැන හිටි දමිළ තරුණයෝ කීපදෙනෙක් ඇවිල්ලා ඔයා අභී නේද කියලා මගෙන් සිංහලෙන්ම ඇහුවා. සිංහල ප්‍රේක්ෂකයෝ විතරක් නෙමේ දමිළ ප්‍රේක්ෂකයිනුත් ඉන්නවනේ කියලා හිතද්දි හරිම සතුටුයි."**

ඇය එහෙම කිව්වේ සුන්දර සිනහවකුත් මුවේ රඳවගෙනමයි. ප්‍රේක්ෂකයන් අංජුමාලව මුලින්ම හඳුනගත්තේ දෙරණ ඩ්‍රීම්ස්ටාර් තරඟයෙන්. එතකොට ඇය අවුරුදු දොළහක පුංචි දියණියක්.

**"නර්තන අංශයෙන් දෙරණ ඩ්‍රීම්ස්ටාර් සීසන් 2 තරඟයට සහභාගී වුණා. එතැනදි මට අවුරුදු 12න් පහළ ජනප්‍රියම තරුව කිරුළ දිනාගන්න ලැබුණා."**

**එතකොට නර්තනය ඉගෙනගත්තේ කොයි කාලෙද?**

**"තුන වසරේ ඉඳලම නැටුම් ඉගෙනගත්තා. මගේ ගම රත්නපුර, නිවිතිගල. ඉතින් මම මුලින්ම නැටුම් ඉගෙනගත්තේ රත්නපුරේ ප්‍රියංගිකා සෝමරත්න මිස්ගෙන්. ඩ්‍රීම්ස්ටාර් ජයග්‍රහණය එක්ක චන්දන සර්, ප්‍රදීපා මිස්, චන්න සර්, රැජිණි සෙල්වනායගම් මිස් වගේ ලංකාවේ ප්‍රසිද්ධම නර්තන ගුරුවරුන්ගෙන් නැටුම් ඉගෙනගන්න අවස්ථාව ලැබුණා."**

මේ වෙනකොට අංජුමාලාව බොහෝදෙනා අඳුරන්නේ රංගන ශිල්පිනියක් විදිහටනේ. ඉතින් ඇයගෙන් කලා ගමනේ ප්‍රවිශ්ඨය ගැන නොඅසා ඉන්න එක අඩුපාඩුවක්.

**"මම කලා ක්ෂෙත්‍රයේ ගමනක් යනවා දකින්න අම්මගේ ලොකු හීනයක් තිබුණා. ඉතින් පුංචි කාලේ ඉඳලම ඇය විවිධ වැඩසටහන්වලට මගේ අයැදුම්පත් යොමු කළා. මම හය වසරේදි මට ඒකාංගික ටෙලිනාට්‍යක රඟපාන්න අවස්ථාවක් ලැබුණා. ඩ්‍රීම්ස්ටාර් තරඟයෙන් කාලයකට පස්සේ මට දෙරණ 'සිදු' ටෙලි නාට්‍යයට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබුණා. ඊටපස්සේත් ටෙලි නාට්‍ය කිහිපයකට වගේම චිත්‍රපටි කිහිපයකටත් මම සම්බන්ධ වුණා. ඇත්තටම රංගන ක්ෂේත්‍රය කියන්නේ හරි සුන්දර ක්ෂේත්‍රයක්. රඟපාන එක හරි ලේසි වැඩක් කියලත් සමහරු කියනවනේ. හැබැයි එහෙම නැහැ. මේ ක්ෂේත්‍රයේදිත් අපිට ගොඩක් කැපකිරීම් කරන්න වෙනවා.**

**එක පාරක් මම රිවස්ටන් කන්දේ රූගතකිරීමකට ගියා. කන්ද උඩ සුළඟ හරි සැරයි. ඉතින් බැලන්ස් නැතුව එකපාර මාව කන්දෙන් වැටෙන්නත් ගියා. එදා නම් මම ගොඩක් බය වුණා. තව දවසක් කැකිරාවේ තිබුණු ශූටින් එකකදි අලි කුලප්පු වෙලා කියලා අපිට ආරංචියක් ආවා. එතැන හිටපු හැමෝම හොඳටම බය වුණා. ඒ පාර රූගතකිරීම් එහෙමත් නවත්තලා ගිනිමැලයක් ගහගෙන කට්ටියම ඒක ළඟට වෙලා හිටියා. ඒ ශූටින් එකේදිම තව දවසක් මාව ලොකු කන්දකින් වැටිලා අතයි ඔලුවයි එහෙමත් තුවාල වුණා. දැන් හිතනකොට ඒවා හරිම සුන්දර අත්දැකීම්. මේක අවදානම් එක්කම දේවල් ඉගෙනගනිමින් යන ගමනක්. ඉතින් ඒක පේන තරම්ම ලේසිත් නැහැ."**

අංජුමාලට තවත් හැකියාවක් කිහිපයක්ම තියෙනවා කියලා කිව්වනේ. ඉතින් මේ වෙනකොටත් ඇය රංගනයට අමතරව නිවේදන සහ හඬකැවීම් කටයුතුත් කරනවා. ඒ වගේම කියන්න ඕනේ ඇය කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරිනියක්.

**"කලා අංශයෙන් තමයි උපාධිය කළේ. එතැනදි මම සිනමා කලාව අධ්‍යක්ෂණය, කැමරා අධ්‍යක්ෂණය, වේශ නිරූපණය වගේ බොහෝ දේ ඉගෙනගත්තා. හැබැයි රංගනය ගැන ලොකුවට හදාරන්න අවස්ථාව ලැබුණේ නැහැ. රංගනය හදාරන්න විදේශගත වෙන්න අදහසක් තියෙනවා. ඉගෙනගන්න දෙයක් කවදාවත් අපතේ යන්නේ නැහැනේ. හොඳ හැදෑරීමක් කරලා කලා ක්ෂේත්‍රයේ දුර ගමනක් යන එක තමයි බලාපොරොත්තුව."**

ඇගේ ගමනට සහාය වුණු පිරිස ගැනත් ඇය අපිත් එක්ක මතක් කළා.

**"මගේ පවුලේ ඉන්නේ අම්මයි, තාත්තයි, අක්කයි. ඒ අයගෙන් ලැබෙන සහාය ගැන කියන්න වචන නැහැ. අම්මා කෙනෙක් තාත්තා කෙනෙක් පුංචි කාලේ ඉඳලම හරි පාර පෙන්නනවා නම් දරුවෙක්ට ජීවිතේ දිනන්න අමාරු නැහැ. හැබැයි සමහර ළමයි ඉන්නවා ගෙදර අයව අමතක කරලා දුරකතනයටම ඇබ්බැහි වෙලා. දෙමව්පියෝ දරුවෙක්ට කවදාවත් වැරදි පාරක් පෙන්නන්නේ නෑ. අනික මොන දේ වුණත් අන්තිමට අපිට ඉතුරු වෙන්නෙත් ඒ අය විතරයි. ඒ නිසා මම මගේ ජීවිතේ පළමු තැන දෙන්නේ ගෙදරට. ඒ අයට අමතරව මම දෙරණ නාළිකාවටත් ස්තූතිවන්ත වෙන්න ඕනේ. වෙනත් නාළිකාවල තරඟ ජයග්‍රාහකයෝ මාසෙන් දෙකෙන් මිනිස්සුන්ට අමතකයි. හැබැයි දෙරණ නාළිකාව කවදාවත් මිනිස්සුන්ට අපිව අමතක වෙන්න දෙන්නේ නෑ. අපිට නිතරම අවස්ථා දෙනවා. ඊට අමතරව මට වචනයකින් හරි උදව් උපකාර කරපු හැමකෙනෙක්ටම ස්තූතිවන්ත වෙන්න මේක අවස්ථාවක් කරගන්නවා.**

**ඒ වගේම අවසාන වශයෙන් මම හැමකෙනාටම කියන්නේ හිත ඇතුළේ හැමවෙලාවෙම හීනයක් තියාගන්න. නිතරම ඒක හැබෑ කරගන්න උත්සාහ කරන්න. හැබැයි කෙටි මාර්ග හොයාගෙන හීනවලට යන්න හදන අයත් ඉන්නවා. හැබැයි ඉක්මන් ගමන් හරිම කෙටියි. හරි වැරදි හඳගෙන ඉගෙනගන්න ගමන් දුර ගමනක් යන්න උත්සාහ කරන්න."**

ඇගේ වයසෙම තරුණ පරපුරට ඇය දුන්නු උපදෙස තමයි ඒ. කලා ක්ෂේත්‍රයෙන් දිගු දුර ගමනක් යන්න මේ සොඳුරු රුවැත්තියට ආසිරි පතන්න **'ධරණී'** අපිත් අමතක කළේ නැහැ.

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**

**ඡායාරූප : සමන් අබේසිරිවර්ධන**

# අතේ සතේ නැතුව ඉඳපු දොස්තර සල්ලිකාරයෙක් වුණු හැටි



නාම හා ශබ්ද ශාස්ත්‍රඥ
නිවංක දිනාරංග රත්නායක

නදීශා නිර්මාණී

**'ඉගෙනීම කටු අත්තකි - එහි ඵලය මල් ඉත්තකි'** කියලා කිව්වට, කොච්චර ඉගෙනගත්තත් උගත්කමට ගැළපෙන රැකියාවක් හොයාගන්න බැරි උදවිය ඉන්නවා. ඒ වගේම උපාධි කිහිපයක් තියාගෙනත් බොහොම අඩු වැටුප් ලැබෙන වෘත්තියක නිරත වෙන අයත් එමටයි. තවත් සමහරු ඉන්නවා සුදුසුකම්වලට සරිලන උසස්ම වෘත්තියක නියැලුණත් අතේ සතේ රැඳෙන්නේ නැතිව කටුක ජීවිත ගතකරන අය.\

ඔය අතරේ අඩු අධ්‍යාපන මට්ටමක් තිබුණත් අත ගහන හැම වැඩේම සාර්ථක වෙලා කිරියෙන් පැණියෙන් උතුරන්න මුදල්, සැපසම්පත් ලබන අයත් නැතුවම නෙමෙයි. මේකට බලපාන ලොකුම හේතුව කෙනෙකුගේ නම කියලයි වෛද්‍ය නිවංක දිනාරංග කියන්නේ.

එවැනි ගැටලුවකින් පීඩා විඳලා නම වෙනස් කළායින් පස්සේ සාර්ථකත්වය උරුම කරගත්තු වෛද්‍යවරයෙක්ව අපිට සම්බන්ධ කරන්නත් ඔහු අමතක කළේ නැහැ. නම් ගම් හෙළිකිරීමට අකමැති වූ නිසා මම ඔහු කිව් කතාව විතරක් මේ විදිහට සටහන් කරන්නම්.

**"මගේ අම්මයි තාත්තයි දෙන්නම වෛද්‍යවරු. ඉතින් පුංචි කාළේ ඉඳලා මාත් දැක්කේ වෛද්‍ය සිහිනය. අම්මටයි තාත්තටයි හොඳහැටි වත්පොහොසත්කම් තිබුණු නිසා මම ගත කලේ බොහොම සැපවත් ජීවිතයක්. හැබැයි මම ඉගෙනගන්න සෑහෙන මහන්සි වුණා.**

**අසනීපයක් නැත්නම් වාහනයක් කැඩිලා හරි තියෙන සල්ලි ටික වියදම් වුණා. අන්තිමට බැඳලා අවුරුදු තුනක් යන්න කලින් අපිව නැත්තටම නැති වුණා**

**වෛද්‍යවරයෙක් වෙන එක ඉතින් ලේසි වැඩක් නෙමෙයිනේ. වෛද්‍යවරයෙක් විදිහට පත්වීම ලැබුණ හැටියෙම මම විවාහ වුණා. බිරිඳ නීතීඥවරියක්. විවාහවෙලා අපි අපේම නිවසක පදිංචියට ගියා. ඊටපස්සේ තමයි හැම ප්‍රශ්නයක්ම ඇති වුණේ.**

**බිරිඳයි මමයි නිතරම මාරුවෙන් මාරුවට අසනීප වෙන්න පටන්ගත්තා. ඒකෙන් බිරිඳට ඇගේ වෘත්තීය කටයුතුවලට හරි අවධානයක් දෙන්න බැරි වුණා. අසනීපයක් නැත්තම් වෙන කරදරයක් හරි එනවා. වාහනයක් කැඩිලා හරි නිස්කාරණේ සල්ලි වියදම් වෙන්න හේතුවක් හැදෙනවා.**

**අපි දෙන්නටම කිසිම ඉතුරුවක් තිබුණේ නැහැ. මුදල් අවශ්‍ය නිසා මම පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කළා. ඒකටත් සෑහෙන මුදලක් යට කළා. හැබැයි හිතුව තරම් සාර්ථක නොවුණු නිසා ඒකත් ටික දවසකින් වහලා දන්න වුණා. ඔය අතරේ අපිට දරුවෙක් ලැබුණා. දරුවටත් නිතරම අසනීප. බැඳලා අවුරුදු තුනක් ගියේ නෑ, ආර්ථික අතින් අපි නැත්තටම නැති වුණා. අම්මලා තාත්තලාගෙන් නිතරම උදපදව් ලැබුණා. ඒත් නිතරම එයාලගෙන් යැපෙන්නත් අපිට හිතක් තිබුණේ නැහැ.**

**මට ඩොක්ටර් නිවංක ගැන කිව්වේ මම දන්න තවත් වෛද්‍යවරයෙක්. මම පුංචි කාලේ ඉඳලම ඔය වගේ දේවල් විශ්වාස කළ කෙනෙක් නම් නෙමෙයි. හැබැයි අර ගිලෙන්න යන මිනිහා පිදුරු ගහෙත් එල්ලෙනවලුනේ.**

**ඉතින් මගේ පෙර වාසනාවක් නිසාදෝ නිකමට ඔහුව මුණගැහෙන්න ඕනේ කියලා මටත් හිතුණා. ඊටපස්සෙ මම බිරිඳත් එක්කම ඔහුව මුණගැහෙන්න ගියා. ඔහු අපි දෙන්නගේ නම් දෙක පරීක්ෂා කරපු හැටියේ බලාගෙන හිටියා වගේ ප්‍රශ්න කරදර ටික සේරම කිව්වම ඇත්තටම මගේ හිතට ලොකු නිදහසක් දැනුණා. මොකවත් නෙමෙයි ප්‍රශ්නෙට විසඳුම එතැනින් ලැබෙයි කියලා හිතුණු නිසා."**

ඒ හිතපු විදියටම ඔහුට නම වෙනස් කරන්න කියලා වෛද්‍ය නිවංකගෙන් උපදෙස් ලැබුණා. ඊටපස්සේ හිතුවා වගේම ඔවුන්ගේ ප්‍රශ්න එකින් එක අඩුවෙලා ආර්ථිකයත් ස්ථාවර වුණාලු. ඔවුන්ගේ නම්වල තිබුණු අයහපත් පිහිටීම් ගැන වෛද්‍ය නිවංක පැහැදිලි කළේ මෙහෙම.

**"සමහර නම්වල ඉගෙනුමට ඉතා හොඳ පිහිටීම් තියෙනවා. එහෙම නමක් ලබන කෙනෙක් අධ්‍යාපනයෙන් ඉහළටම යන එක නවත්තන්න සක්කරයටවත් බැහැ. වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, ගුරුවරුන් ඔය බොහෝදෙනාගේ නම්වල ඔය කිව් පිහිටීම් තියෙනවා. හැබැයි ප්‍රශ්නේ වෙන එකක්.**

**අතේ මුදල් නොරැඳෙන්න යෙදෙන පිහිටීමුත් තියෙනවා. ඉතින් ඉහළටම ඉගෙනගත්තු කෙනෙක්ට වුණත් ඔය වගේ පිහිටීමක් තිබුණොත් විනාශයි. කොච්චර සල්ලි අතපත ගෑවත් වැඩක් නෑ නැති ප්‍රශ්නයක් හරි ඇතිවෙලා සල්ලි ටික වියදම් කරන්න පොටක් පෑදෙනවා. එහෙම නැත්තම් සල්ලි හම්බකරන්න තියෙන මාර්ග ඇහිරෙනවා.**

**ඔය කියන වෛද්‍යවරයගේ නමේ තිබුණොත් එහෙම පිහීටීමක්. ඔහුගේ බිරිඳගේ නමේ නම් එහෙම දෝෂයක් තිබුණේ නැහැ. ඒත් ඇයගේ නමේ සංකලනයෙනුත් වෛද්‍යවරයගේ දෝෂය වැඩි වුණා මිසක අඩුවක් වෙලා නැහැ. ඒ නිසා විවාහ වුණු දවසේ ඉඳලම ඔවුන්ට නොයෙක් දුක් කරදර ඇතිවෙලා.**

ඔවුන්ගේ දරුවගේ නමෙත් ලොකු දෝෂයක් තිබුණේ නැහැ. හැබැයි පියාගේ ගැටලුව ඔහුටත් බලපාලා තියෙනවා.

බිරිඳගෙත් දරුවගෙත් නමට ගැළපෙන විදිහට මම වෛද්‍යවරයාගේ නම වෙනස් කළා. ඔහුත් ඒ අදාළ පිළිවෙත් හරියට පිළිවලට ඉටුකළා. ඒ නිසාම නම වෙනස් කරලා මාසයක් දෙකක් යද්දි ඔවුන්ගේ ආර්ථික තත්ත්වය හොඳ අතට හැරෙන්න පටන්ගත්තා.

ගොඩක් අය ඉන්නවා අධ්‍යාපන සුදුසුකම් තිබ්බට ආර්ථික අතින් ගොඩ ඒමක් නෑ. තව අය ඉන්නවා අධ්‍යාපනය ඉහළ මට්ටමක නැති වුණත් යහමින් අතේ මිටේ මුදල් ගැවසෙන. ඔය හැමදේටම මුල් වෙන්නේ කෙනෙක්ගේ නම බව තමයි ඉතින් මට කියන්න තියෙන්නේ."

# අලි අම්මට නින්ද ගියා අලි පැටියා ගොඩට ගියා



හොඬය ලිඳේ දාගෙනම අලි අම්මාට නින්ද ගිය අයුරු

මොනම ආකාරයක අවදානමක් දරමින් වුව අනතුරකදී අතහැර නොයන කෙනෙකු වේනම් ඒ, අම්මාය. එය සත්ව ලෝකයේද දැකිය හැකි කරුණකි. පශු වෛද්‍ය අකලංක පිනිදිය එවැනි සිදුවීමකට මුහුණ දුන්නේ ගිරාඳුරුකෝට්ටේ ඔරුබැඳිවැව ප්‍රදේශයේදීය.

ඉතා කුඩා ප්‍රමාණයේ ළිඳකට අලි පැටවකු වැටී ඇත. ඒ වටා සිටින අලි නඩය පැටවා ගොඩ ගැනීමේ උත්සාහයකය. එහෙත් එය සාර්ථක නොවේ. ලැබුණු තොරතුරුවලට අනුව වනජීවී නිලධාරීහු එතැනට ළඟා වූහ. පශු වෛද්‍ය අකලංකට එතැනට යාමේ අවශ්‍යතාවක් නොවීය. ඒ, අලි රංචුව පළවා හැරීමෙන් පසු අනතුරට ගොදුරු වූ සතා ගොඩට ගැනීමට හැකි බැවිනි. සියල්ලට පෙර වටේ සිටින අලි එලවා දැමිය යුතුය.

ඒ අනුව අලි වෙඩි දැමීමට පියවර ගැනිණ. අලි නඩය විසිර ගියද අලි අම්මා පියවරක් හෝ පසුපසට ගැනීමට සූදානම් නැත. ඒ මදිවාට කිසිවකුට ළිඳ සමීපයට පැමිණීමට ද ඇය ඉඩ නොදෙයි. ළිඳේ ගැඹුර, අනතුරුට ලක්වූ අලි පැටවාගේ වයස හෝ අනතුරේ ස්වභාවය ආදී කිසිවක් නිශ්චය කිරීමට ඉඩ නැත. ඒ අනුව පශු වෛද්‍ය අකලංක පිනිදියද එම ස්ථානයට ගියේය.

**"මීටර සියයක් තරම්වත් සමීපයට එන්න කිසි කෙනෙකුට අලි අම්මා ඉඩ දෙන්නෙ නෑ. එන කෙනාව පන්නනවා. එයා හිතන්නෙ එයාට පැටියව බේරගන්න පුළුවන් කියලනේ. හොඬේ ළිඳ ඇතුළට දානවා. ආයෙ ගන්නවා. ටික වෙලාවකින් ළිඳ ඇතුළෙන් කෑ ගහනවාත් ඇහුණා. ඒත් අපිට කිසි දෙයක් බලන්න විදියක් නෑ. මොකද අම්මාව මොන විදියකටවත් එලවන්න බෑ. එයාගෙ ආදරේ තරම තමයි ඉතින් ඒක. මමත් ඔය වගේ දේකට මූණ දුන්නමයි. ළිඳ තිබුණෙ කුඹුරු යායක් මැද්දෙ. සම්පූර්ණ විවෘත පැත්තක්. ඒ නිසා අපට රිස්ක් එක වැඩියි. ළඟට ගියොත් අපිටත් මැරුම් කන්නයි වෙන්නෙ."**



තොරතුරු සහ ඡායාරූප - පශු වෛද්‍ය **අකලංක පිනිදිය**



කෙනරගේ හොඬයේ නොවදින සේ ළිඳ කැඩීම

## අලි කතා

අවසානයේ පැටවා බේරාගැනීම වෙනුවෙන් මව නිර්වින්දනය කිරීමට තීරණය කෙරිණ. එයද පහසු නොවේ. ඒ, සතාට සමීප වීම බොහෝ අවදානම් සහගත බැවිනි. එහෙත් අවදානම දරමින් අලි පැටවා මුදා ගැනීමට නිලධාරීහු තීරණය කළහ. බෙහෙත් සූදානම් කරගෙන වාහනයකින් ඔවුහු කෙනෙර වෙත සමීප වූහ.

නිලධාරියෙකු රථයෙන් බැස ඈ වෙත ගිය අතර එවිට කෙනෙර ඔහු පසුපස පැන්නුවාය. වහාම නිලධාරියා රථයට ගොඩ වූ අතර සමීපයට පැමිණි අලි අම්මාට බෙහෙත් විදීමට එහිදී ඉඩ ලැබිණ. බෙහෙත් ලබා දී ඇත්තේ කෙනෙර ඇද වැටෙන මට්ටමට නොවේ. ඇය නිද්‍රාවට පත්වීමට ප්‍රමාණවත් පරිදිය. අවාසනාවක මහත! කෙනෙර ළිඳට හොඬ දමා සිටගෙන නිදන්නට වූවාය.

වැඩේ තවත් අසීරුය. ඇගේ සිරුරේ ගෑවෙන නොගෑවෙන තරම් දුරක සිට පැටවා ගොඩට ගත යුතුය. කෙනෙර සම්පූර්ණයෙන් ඇද වැටුණ අවස්ථාවක අවදානම අඩුය. එහෙත් මෙම තත්ත්වයේදී ඇය ඕනෑම වේලාවක අවදි වීමට ඉඩ තිබේ. ඇය ළිඳ මතට ඇද වැටුණහොත් එයද අතුරුදායකය.

එහෙත් පළපුරුදු නිලධාරීන්ගේද සහාය ඇතිව එම කටයුත්ත සාර්ථක කරගැනීමට හැකි වූ බව පශු වෛද්‍ය අකලංක පිනිදිය පවසයි.


**"පැටියා මාස දෙකක්වත් වයස නැති තරම්. ළිඳේ ඉහළට වතුර තිබුණ එක අපට වාසියක් වුණා. එයා වතුරේ පාවෙමින් හිටියා. එහෙත් ළිං කට බොහෝ කුඩා නිසා පැටවා ගැනීම ගොඩක් අමාරුයි. අපි කොහොම හරි පැටවාගේ අම්මා අසලම සිටියදී ළිං ගැට්ට කුලු ගෙඩියෙන් කඩලා පැටියව එළියට ගත්තා.**

**පස්සෙ එයාට බෙහෙත් දලා අම්මා ගාවට ඇරියා. අම්මාටත් ආයෙ බෙහෙත් දුන්නා ප්‍රකෘති තත්ත්වයට ඒමට. අපි එදා ඒ පැටියව බේරගත්තේ ඒ වැඩේට සහභාගි වුණ හැමෝටම විශාල අවදානමක් තියාගෙන."**

රෂ්නිකා ලියනගේ




# මං ගිනස් වාර්තාවක් තියලා ලැජ්ජාවේ පණ ගියා ඒයි!



**"හෙට මං ගේ ඉස්සරහ බිත්තිය ළඟ පැය දෙකක් ඔලුවෙන් හිටගෙන ගිනස් වාර්තාවක් තියනවා. ඔයා එනවද කෙල්ලේ මට සපෝට් එකට?"**

පිංකි විමසුවේ මේසයට හේත්තු වෙමින්.

**"අනේ කෙල්ලේ! වෙන වෙලාවක නම් මම එනවා. හෙට මට ක්ලිනික් ඩේට් එක."**

කොණ්ඩි කීවා.

**"මොනවා කරන්නද එහෙනම්"**

පිංකි සොවින් පැවසුවේ සිය අසුන වෙත යමින්.

දින දෙකකට පසු පිංකි සේවයට පැමිණියා. ඇගේ මුහුණ බෙරිවෙලා!

**"මොකද කෙල්ලේ? වැඩේ වර්චස් කරගත්තද?"**

කොණ්ඩි විමසුවේ යටි සිතින් සතුටු වෙමින්.

**"නෑ! මං ගිනස් වාර්තාව තිබ්බා! ලැජ්ජාවෙ පණ ගියා ඒයි!"**

පිංකි ලැජ්ජාවෙන් ඇඹරුණා.

**"මොකක්...? ගිනස් වාර්තාව තිබ්බා! එහෙනම් ලැජ්ජා වෙන්නේ මොකටද සතුටු වෙනවා මිසක්? ගිනස් වාර්තාව තියනවා බලන්න මිනිස්සු ආවෙ නැද්ද?"**

කොණ්ඩිගේ දෙනෙත් උඩ!

**"ආවා අයියෝ ආවා! මුලින් එකා දෙන්නා ඇවිල්ලා අන්තිමට මිදුල පිරෙන්න සෙනඟ!"**

**"එහෙනම්?"**

**"කොල්ලෝ කෙල්ලෝ විතරක් නම් මදෑ. හෙට අනිද්දා සමාදානයේ සැතපෙන වයසක කොල්ලෝ නෑ! නෑ! වයසක මිනිස්සුත් ආවා! ඇස් ලොකු කරගෙන, කට ඇරගෙන බොහොම උනන්දුවෙන් බලාගෙන හිටියා. කොල්ලෝ හුරේ දැම්මා. පැය දෙකක් ගත වුණත් කොල්ලෝ මට නැගිටින්න දුන්නේම නෑ. බොහොම උනන්දුවෙන්, තව ටිකක් ඉන්නකෝ ඩාලිං කියලා කෑගැහුවා. මට පැය දෙක හමාරක්ම ඉන්න වුණා... ලැජ්ජයි ඒයි! වස ලැජ්ජයි!"**

**"මට නම් මොන කෙහෙම්මලක්වත් තේරෙන්නේ නෑ පිංකියෝ. වැඩේ මෙච්චර සාර්ථක වෙලත්, ඔයාට ලැජ්ජා ඇයි අනේ?"**

දැන් කොණ්ඩ කිරිල්ලී කරකවා අතහැරපු ගානයි.

**"වාර්තාව තියන දවසේ උදේ ඩුබායි ඉන්න මගේ නංගි කතා කළා. ඒක ඉවර වෙලා වැඩේට ලෑස්ති වුණාම මගේ පුතා, චූටි බට්ටා බඩගිනියි කියලා කෑ ගහපි.**

**දර ලිපෙන් වටිනා පරිප්පු හොද්දක් හදලා පාන් වාටි දෙකක් කන්න දෙනකොට වාර්තාව පටන්ගන්න වෙලාවත් ටිකක් පහුවෙලා. මං දුවගෙන ඇවිත් ගේ ඉස්සරහ බිත්තිය ළඟ ඔලුවෙන් හිටගත්තා! ලැජ්ජයි ඒයි!"**

**"එහෙනම් හරිනේ! ඇයි ලැජ්ජා වෙන්නේ?"**

කොණ්ඩිට කිසිවක් හිතාගන්න බෑ.

**"උඹ නම් කියයි. හදිසියට මං ඔලුවෙන් හිටගෙන තියෙන්නේ ගෙදරට ඇඳගෙන හිටිය බුරුල් සාය පිටින්! මගේ එකී මෙකී නොකී හැමදේම මහජන ප්‍රදර්ශනයට තිබ්බා වගේ!!!"**

පිංකි මේසයේ ඔලුව ඔබාගත්තේ ලැජ්ජාවෙන්!


# කළු සොයා ගැස්

ඒ කාලේ අනුරාධපුරේ රජකම් කරපු **'පුවෝතල'** රජතුමාට **'නීලමදන'** කියලා ඉතාම ජවසම්පන්න පුත් කුමාරයෙක් හිටියලු. ඉතින් පුත් කුමාරයගේ ජවසම්පන්නබව ගැන ආඩම්බරෙන් හිටපු රජතුමා සොලීන් සමඟ සටන් කිරීමේ භාරදූර කාර්යය පවරලා තිබුණොත් මේ කුමාරයාට. මේ යුද්ධය අතුරතුරදී දවසක් නීලමදන කුමාරයාට ඉන්දියාවට යන්න සිද්ධ වෙලා තියෙනවා. ඒ සොලීන් විසින් පැහැරගෙන ගියපු අපේ රටේ තරුණයෝ දෙන්නෙක්ව බේරගෙන එන්න. දැනගෙන ගියොත් කතරගම නොදැන ගියොත් අතරමග කියලා අපි කතාවටත් කියනවනේ. ඉතින් ඉන්දියාවට යන ගමනේදී නීලමදන කුමාරයාටත් ඒ වගේ අකරතැබ්බයක් වෙලා තියෙනවා. පාර නොදැන ගියපු කුමාරයා එකපාරටම ඉන්දියාවේ කාන්තාවෝ විතරක් ජීවත්වෙන ප්‍රදේශයකට ගිහින් අතරමංවෙලා. දෙන දෙයියෝ ගෙටම ගෙනත් දෙනවා කිව්වා වගේ පිරිමි පුළුටක් ඇහැ ගැහෙන්නේ නැතිව ඉඳපු මේ ගෑනු රැලම නීලමදන කුමාරයාව සිපගෙන තමන්ගේ වල්ලභයා කරගන්න පොරකෑවා කියලා තමයි ජනශ්‍රැතියේ සඳහන් වෙන්නේ. කොහොමින් කොහොමහරි මේ ගැහැනුන්ගේ හිංසාවට ලක්වුණ කුමාරයා එතැනදිම මියගිහිල්ලා තියනවා. හැබැයි මැරෙන මොහොතේත් කාන්තාවන් ගැන දැඩි වෛරයකින් මියගිය නීලමදන කුමාරයා **'කළු කුමාරයා'** නමින් භූත ආත්මයක ඉපදිලා ස්ත්‍රීන්ට හිරිහැර කරනවා කියලයි ජනශ්‍රැතියේ වැඩිදුරටත් සඳහන් වෙන්නේ.




ඒ කළු කුමාරයා ගැන කියැවෙන එක කතාවක්. මේ මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන් කළු කුමාරයා ගැන දැරුව තවත් මතයක්.

ක්‍රි.ව.හයවෙනි සියවසේදී රජකම් කරපු බුවනෙකබා චක්‍රවර්ති රජු යටතේ ඉන්දියාවේ විල්ලෝඩි ප්‍රදේශයෙන් ආපු කුමාරයෙක් මානවළු ප්‍රදේශය පාලනය කරලා තියෙනවා. මේ කුමාරයාගේ හම ඉතාමත් කළු පැහැයෙන් යුක්තයිලු. ඉතින් වැඩිකල් නොගිහින් ඔහුව මුළු රටේම 'කළු කුමාරයා' කියන නමින් ප්‍රසිද්ධ වෙලා තියෙනවා. අනිත් කාරණාව තමයි මේ කළු කුමාරයා ඉතා දැඩි ලෙස කාමයට ගිජුවෙලා හිටපු, ස්ත්‍රී පහස ලබපු කෙනෙක්. ඔහුට බිසෝවරු තිස්දෙකකුත් ඉඳලා තියෙනවා. හැබැයි ඉතින් ඒ කොයිතරම් බිසෝවරු හිටියත් මේ කළු කුමරයා විනෝදංශයක් විදියට ප්‍රදේශයේ හිටපු තරුණියන්ට ලිංගික අතවර කළාලු. ඔය විදියට අධික රාගික ජීවිතයක් ගතකරපු කළු කුමාරයා මරණින් පස්සෙත් ස්ත්‍රීන්ට ලොල් කරන යක්ෂ ආත්මයක ඉපදිලා කියලා තමයි එතුමා කියන්නේ. ඒ වගේම මේ පිළිබඳව අනුරාධපුරේ රාජකුලවඩන විහාරයේ සෙල්ලිපිවලත් සඳහන් වෙලා තියෙනවා කියලා මහාචාර්ය සෙනරත් පරණවිතානයන් ඔහුගේ නිබන්ධනවලින් පෙන්නලා දීලා තියෙනවා.


ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය
**ප්‍රණීත් අබේසුන්දර**

{ජනප්‍රවාදයට අනුව නම් කළු කුමාරයාගේ දෝෂයට ලක්වුණු කාන්තාවන්ට නින්දේදී ආහාර කවනවා, ලිංගික ආශ්වාදයත් ලබාදෙනවා. මේ නිසා ආහාර අරුචිය, පිරිමින් නොරුස්සනා ගතිය, උණ විකාරයෙන් කියැවීම සහ අඩනින්දෙන් අවදිව නිවසින් පිටවී යාම වගේ බොහෝ දේ සිද්ධ වෙනවා. ඒ වාගේම මේ කුමාරයා වැහුණට පස්සේ තරුණ කාන්තාවන්ගේ සිරුර කෘෂ වීම, ඔසප් චක්‍රය අක්‍රමවත් වීම, දරුවන් නොලැබීම, මළ දරුවන් ඉපදීම මෙන්ම ගබ්සා වීම ආදී ව්‍යාධීනුත් වෙනවා. ඒ නිසාම මේ සියල්ලම ජ්‍යෝතිෂ්‍යයේදී කෙම්පහන්වලට (දෙහි කැපීම වැනි) ලක්වෙනවා. ඉතින් මෙච්චර හරියක් කරන මේ කළු කුමාරයා කවුද? භූත ආත්මක්ද? නැතිනම් මනඃකල්පිතයක්ද? කියන එක හරියටම දැනගන්න අපි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහතාට කතා කළා.

**"ඔය කළු කුමාරයා ගැන අපේ ආචාර්ය මහාචාර්යවරුන් බොහෝදෙනෙක් නිබන්ධන රාශියක් කරලා තියෙනවා. ආචාර්ය කාලෝ ෆොන්සේකා, මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන්, ලයනල් බෙන්තරගේ සහ ඒ.පී.ද සොයිසා මහත්මයා වගේ අය බොහොමයක් ඒ අතර ඉන්නවා. හැබැයි ඒ හැම අධ්‍යයනයකම අවසානයට මේ කළු කුමාරයා සැබෑවක්ද? මනඃකල්පිතයක්ද කියන මතය ප්‍රශ්නාර්ථයක් බවට පත්වෙලා. ඒ කොහොම වුණත් කළු කුමාරයා කියන්නේ භූත ආත්මයක්ද කියලා කිසිම පරේයේෂකයෙක් තවමත් නිශ්චිතවම හොයාගෙන නෑ."**

කතාව අතරතුර ඔහු විශ්වවිද්‍යාල ජීවිතයේ අත්දැකීමක්ද කියා සිටියේය.

**"දවසක් මගේ ශිෂ්‍යාවකගේ අම්මා කෙනෙක් මාත් එක්ක කතාබහ කරද්දී කියපු දෙයක් තමයි මේ ශිෂ්‍යාව ඉතාමත් අසාමාන්‍ය විදියට ප්‍රේම සබඳතා සහ විවාහ යෝජනා ප්‍රතික්ෂේප කරනවා කියන එක.**

# කුමාරයා දෙන්නෙකුට සිලින්ඩරයක් නොමිලේ

ඉතින් මේක මේ පවුලේ උදවියට හරිම ප්‍රශ්නාර්ථයක් වෙලයි තිබුණේ. ඒ අය ඇගෙන් විවාහය ගැන අහපු හැම වෙලාවකම ඇය කියලා තිබුණේ කසාද බැඳලා අතින් කටින් දරුමල්ලෝ එල්ලගෙන ඉන්න ජීවිතයක් ඇයට එපා කියලා. ඒ වගේම ඇයට මැරෙනකල් නිදහසේ ඉන්න දෙන්න කියලා. අන්තිමේදි කොහොමින් හරි මේ ශිෂ්‍යාවට කසාදයක් කරලා දෙන්න හිතලා මේ අය අර ළමයගේ කේන්දර කොපියක් අරගන දේවාල තුන හතරකටත් ගිහිල්ලා තියෙනවා. ඒ ගියපු එක තැනකින් කියලා තියෙන දෙයක් තමයි මේ දැරිවිට තදබල විදියට කළු කුමාර දෝෂය තියෙන නිසා පිරිමින්ව ප්‍රතික්ෂේප කරනවා කියන එක.

ඒ වගේම තොවිල් පවිල්, ශාන්තිකර්ම කිහිපයක් කළාට පස්සේ මේ කළු කුමාර දෝෂය ශරීරයෙන් පහවෙලා ඇය විවාහයකට කැමති කරගන්න පුළුවන් කියලත් පවසලා තිබුණා. පස්සේ ඉතින් ඒ කියපු විදියටම ඇගේ වැඩිහිටියෝ ඒ අවශ්‍ය තොවිල් වගේම අනිත් ශාන්තිකර්මත් අඩුවක් නැතුව කරලා තිබුණා. ඒ වුණාට ඊටපස්සෙත් ඔය කියන ශිෂ්‍යාව විවාහයකට කැමතිවෙලා තිබුණෙ නෑ. අන්තිමේදී කරන්නම දෙයක් නැතිකමට ඇයගේ අම්මා බොහොම යාප්පුවෙන් රහසිගතව විවාහයට අකැමති වෙන්න වෙනත් මොකක් හරි ගැටලුවක් තියෙනවද කියලා ඇයගෙන් ප්‍රශ්න කරලා තිබුණා. එහෙම ඇහුවම තමයි දැනගන්න ලැබිලා තියෙන්නේ ඇයට අධික ලෙස සුද යාමේ ලිංගාශ්‍රිත රෝගයක් තියෙනවා කියලා. ප්‍රේම සම්බන්ධයක් හරි විවාහයක් හරි කරගත්තොත් පෙම්වතා හෝ සැමියා ඇයව පිළිකුල් කරලා දයි කියන බයෙන් තමයි ඇය පිරිමි සම්බන්ධතා ප්‍රතික්ෂේප කරලා තියෙන්නේ. පසුව ඇයව ලිංගාශ්‍රිත රෝග පිළිබඳ වෛද්‍යවරයෙක් ළඟට එක්කගෙන ගිහිල්ලා සුව කරාට පස්සේ ඇය විවාහ යෝජනාවකට කැමති වෙලා තිබුණා."

ඒ පිළිබඳව විවිධ ප්‍රදේශවල අය දරණ මතවාද, කරන නොයෙකුත් ශාන්තිකර්ම මෙන්ම විවිධ වූ ප්‍රතිකාරයන් ගැනත් ඔහු සඳහන් කළේ මේ ආකාරයට.

"කාන්තා ශරීරය තුළ විවිධ කාලවලදී, හෝර්මෝන ක්‍රියාකාරිත්වයන් වෙනස් වෙනවා කියන එක වෛද්‍ය විද්‍යාවට අනුව සනාථ වුණ දෙයක්. ඉතින් බොහෝ ආචාර්ය, මහාචාර්යවරුන් වගේම මානව විද්‍යාඥයින්ගේ පර්යේෂණවලිනුත් ඔප්පු වෙලා තියෙන කාරණාවලට අනුව නම් මේ කළු කුමාර දෝෂය කියන්නෙත් අන්න ඒ වගේ හෝර්මෝන වෙනස්වීමත් එක්ක ඇතිවෙන මනෝ රෝගයක්.

ඔය ආහාර රුචිය, පිරිමින් නොරුස්සන ගතිය, ඔසප් චක්‍රය අක්‍රමවත් වීම වගේම සිරුර කෘෂ වීමත් ඒ හෝර්මෝන වෙනස්වීම්වල ප්‍රතිඵල කියලයි ඒ අය කියන්නේ.

ඒ වගේම පුරුෂ පාර්ශවයේ බොහෝ අය අපිත් එක්ක කියන කාරණාවක් තමයි තමන්ගේ බිරිඳට ඔසප් දින ළංවුණාම, ඔසප් දිනවලදී සහ ඔසප් වීම අවසන් වෙලා දින දෙක තුනක් යනතුරුත් ස්වාමිපුරුෂයාව පේන්නේ නයාට අඳුකොළ වගේ කියලා.

ඕකටත් මම අත්දැකීමෙන්ම හොඳ කතාවක් කියන්නම්. මගෙන් අධ්‍යාපනය ලබපු නිතරම වගේ මාව බලන්න එන යන ජ්‍යේෂ්ඨ ශිෂ්‍යයෙක් හිටියා ඔහු විශ්වවිද්‍යාලේ අධ්‍යාපන ලබපු කාලෙදිත් ඔහුට තනියම නිරාකරණය කරගන්න බැරිවුණ අතිශය පෞද්ගලික ගැටලු පවා මාත් එක්ක සාකච්ඡා මාර්ගයෙන් විසඳගත්තු කෙනෙක්.

ඉතින් මෙයා දවසක් මාව මුණ ගැහෙන්න ඇවිල්ලා කිව්වා සර් මට අර යක්ෂ ගෑනි එක්ක පවුල් කාලා ඇතිවෙලා තියෙන්නේ මට ඒකිගෙන් දික්කසාද වෙන්න ඕන කියලා. පස්සේ මම ඇහුවා එකපාරටම දික්කසාදෙකට යන්න හේතුව මොකක්ද කියලා. ඒ වෙලාවෙදි ඔහු මට කිව්වේ බිරිඳ මාසෙකට සති එකහමාරක් දෙකක් ඔහු එක්ක කිසිම හේතුවක් නැතුව ගහ මරාගන්නවා කියන එක. ඒ විතරක් නෙවෙයි ඒ සතිය දෙක ඇතුළේ රෑට නිදාගන්නවත් ඔහුට ඇඳට එන්න දෙන්නෙ නැලු, අතපය ඇගේ වදිනකොට අමාරුයි කියලා. ඉතින් අනිවාර්යයෙන්ම මාසෙට සති දෙකක්වත් ඔහුට බිම නිදාගන්නම වෙනවලු. බැරිම තැන ඔහු අමතර මෙට්ටයකුත් ගෙදරට ගිහින් දාගෙන තිබුණා. ඔහු කියපු විදියට නම් ගෙදර වැඩිහිටි උදවියටත් මේ ගැන තේරිලා ඔවුන් පවා මේකට විසඳුම් හොයන්න දේවාලවලට, ජ්‍යෝතිෂ්‍යවේදියෝ ළඟට ගිහිල්ලා තිබුණා. පස්සේ එහෙම ගියපු තැනකින් කියලා තිබුණේ ඔහුගේ බිරිඳගේ ශරීරයට කළු කුමාරයා බැල්ම දානවා කියලා. කළු කුමාරයා ඇගේ ශරීරයට ආසාවෙන් ආදරෙන් ඉන්න නිසා සැමියට ඇගේ ළඟට එන්න දෙන්නෑ කියලා තමයි කියලා තිබුණේ. මේ කළු කුමාර බැල්ම නැති කරන්න තොවිලයක් නටලා තවත් ශාන්තිකර්ම කීපයකුත් කරන්න කිව්වලු. හැබැයි එච්චර කාලෙකට ඔහු කිසිම වෙලාවක තමන්ගේ බිරිඳට සම්පවෙලා මේ ගැන කතාබහ කරලා තිබුණේ නෑ. පස්සේ මම දීපු උපදෙස්වලට අනුව ඔහු මේ ගැන බිරිඳ එක්ක හොඳින් කතාබහ කරලා තිබුණා.

එහෙම කතාබහ කළාට පස්සේ තමයි ඇය කියලා තිබුණේ අගේ මාසික ඔසප් දිනවලදී රුධිර වහනය වෙද්දී ඇයට අධික ලෙස තරහා යනවා කියන එක. ඒ වගේම ඒ දින අවසන් වෙනකම්ම නිදියහනේදී ඇයට ඔහුගේ අතපයක් වදිනවටවත්, වැඩිපුර කතාබහ කරනවටවත් කැමති නෑ කියලා. ඉතින් බලන්න මේ කතාබහ කරලා විසඳගන්න පුළුවන් ප්‍රශ්නනේ කොහෙවත් ඉන්න කළු කුමාරයෙකුට භාරදීලා තියෙන්නේ."

> ඇඟපත හෝදලා පිරිසිදුවට ඉන්නෙ නැති ගෑනු ළඟට ගෙදර මිනිහා තියා කළු කුමාරයාවත් එන්නෙ නෑ

එමෙන්ම පිරිමින්ට බලපාන මෝහිනී සංකල්පයද කාන්තාවන්ගේ මෙම කළු කුමාර දෝෂයටම සමාන එකක් බවයි ඔහු අපට කීවේ. විවිධ පර්යේෂණවල ප්‍රතිඵලවලට අනුව මේවා සංගීතය, නැටුම්, චිත්‍ර, වර්ණ මෙන්ම ශබ්ද චිකිත්සක ප්‍රතිකාර මගින් සුව කළ යුතු මනෝ රෝග ලෙස හඳුනාගෙන තියෙනවා.

"දකුණු පළාතෙත් කළු කුමාර දෝෂය වෙනුවෙන්ම නටන කළු කුමාර සමයම කියලා ශාන්තිකර්මයක් තියෙනවා. ඒ වගේම කළු කුමාර දිෂ්ඨිය කියලා පැරණි පොතකුත් ලියැවිලා තියෙනවා. මේ හැම එකකදිම වගේ කරන්නේ සද්දෙට බෙරයක් ගහලා වන්නමක් නටලා දෙහි ගෙඩියක් කපලා නූල් ටිකක් දන එක. අන්න එතකොට කළු කුමාර දෝෂය සුව අතට හැරෙනවා. නමුත් මේ දේවල් කොයිතරම් දුරට අද සමාජයට ගැලපෙනවද නැද්ද කියලා නම් දන්නේ නෑ. ඒ කොහොම වුණත් මේ දේවල් ගැන දැනුවත් වෙලා ඉන්න එකේ වරදක් නෑ."

ඒ කෙසේ වෙතත් කළු කුමාරයා නිසා එද මෙන්ම අදත් කාන්තාවන්ට සමාජයේදී සිදුවන අතවරවලින් බේරීමට බොහෝදුරට හැකි වී ඇති බවයි මහාචාර්යවරයා පවසන්නේ.

"එද විතරක් නෙවෙයි අදත් සමහර වැඩිහිටියෝ තරුණගෑනු දරුවන්ට ගොම්මන් වෙලාවට තනිපංගලමේ ඇළ දොළවල් ළඟ නාන්න එපා කියන්නේ, දෙට්ට පිලට යන්න එපා කියන්නේ, බෝක්කු තුංමන්හන්දි පහු කරන් ගමන් බිමින් යන්න එපා කියන්නේ කළු කුමරයා බැල්ම දයි කියලා. නමුත් ටිකක් හිතලා බලන්න ඇත්තටම අදත් ඈඳිරි වැටිච්ච වෙලාවට එළිපහළියට ගිය තරුණියන්ට ලිංගික අතවර කරලා මරලා බෝක්කු කාණු පල්ලේ දාලා ගියේ කළු කුමාරයාද නැත්නම් රස්තියාදු ගහන කුමාරවරුද කියලා.

හැබැයි හැන්දෑවෙ හයෙන් පස්සේ එළියට බැස්සොත් කළු කුමාරයාගේ බැල්ම වැටෙනවා කියන බයට ගෑනු දැරිවියෝ තනිපංගලමේ යන්නේ නෑ. එතකොට ඉබේටම ඒ අයගේ ආරක්ෂාව සැලසෙනවා. ස්ත්‍රී දූෂණ අඩු වෙනවා. එහෙම බැලුවම කළු කුමාරයා කාන්තාවන්ට වින කටින්න ආපු යකෙකුට වඩා කාන්තාවන්ව රකින්න ආපු මනඃකල්පිත යකෙක් විදියට සලකන්න පුළුවන්."

> කළු කුමාරයා නිසා මම දන්න තරුණයෙකුට සල්ලි දීලා අලුතින් මෙට්ටයක් අරගන්නත් වුණා

කළු කුමාර දෝෂය දරුඵල අහිමිවීමට බලපාන ආකාරය ගැනත් ඔහු කීවේ මෙවැනි කතාවක්.

"මම හදිසි අවස්ථාවලදී ගමන් බිමන් ගියපු සමීප කුලීරථ රියැදුරෙක් හිටියා. ඔහු ඉතාමත් තරුණ වයසේදී විවාහ වුණත් අවුරුදු තිස්පහකට ආසන්න වෙනකම්ම දරුවෙක් හදාගන්න බැරිවෙලා තිබුණා. ඔවුන් දෙදෙනාව පරීක්ෂා කරලා බලපු හැම වෛද්‍යවරයෙක්ම කියලා තිබුණේ දෙදෙනාමට දරුවෝ හදන්න පුළුවන් යහපත් සෞඛ්‍ය තත්ත්වයක් තියෙනවා කියලා. නමුත් ඉතින් එහෙම වෙලත් දරුවෝ නැති නිසා ඔහුගේ බිරිඳ දන්න දන්න හැම ජ්‍යෝතිර්වේදියා ළඟටම ගිහිල්ලා මේකට පිළියම් හොයලා තියෙනවා.

පස්සේ එක ජ්‍යෝතිර්වේදියෙක් ඇයට කියලා තියෙනවා ඇගේ ශරීරයට කළු කුමාරයා බැල්ම හෙළන නිසා ගර්භාෂය ඇතුළෙදිම කළල විනාශ වෙනවා කියලා. ඕකටත් කලින් සිද්ධිවල වගේම ලොකු ශාන්තිකර්මයක් එහෙමත් කරලා තියෙනවා. නමුත් මේ රියැදුරා මට කිව්වේ වෙනම කතාවක්.

ඔහු කියන විදියට ඔහුගේ බිරිඳ හරිම අපිරිසිදුයි. මුළු දවසම වැඩපල කරලා ඇය අඩුම තරමින් රෑට නින්දට යද්දිවත් ඇඟපත හෝදලා පිරිසුදු වෙන්නේ නෑලු. ඒ ගැන කිව්වම ඇයගේ උත්තරේ වෙලා තියෙන්නේ අවුරුදු ගාණක් එකට නිදාගන්න මිනිහා ළඟට රෑට නිදාගන්න මේකප් දාලා එන්න ඕනද කියන එක. ඉතින් ඇයගේ මේ අපිරිසිදුකම නිසා ඔහු යහපත් මානසිකත්වයකින්, කැමැත්තකින් ලිංගික කාර්යයේ යෙදිලා තිබුණෙ නෑ. නමුත් අර ජ්‍යෝතිෂ්‍යවේදියා කියපු විදියට දවස් විසිඑකක් නාලා පිරිසිදු වෙලා අවශ්‍ය ශාන්තිකර්ම කළාම ඊට මාසෙකට විතර පස්සේ ඇය ගැබිනියක් කියලා දැනගන්න ලැබිලා. මෙතැනත් ගැටලුව වෙලා තියෙන්නේ ඇගේ අපිරිසිදුකම නිසා සැමියා ඇයව ප්‍රතික්ෂේප කිරීම මිසක් කළු කුමරයාගේ දෝෂයක් නෙවෙයි. ඒකනේ පිරිසිදුවට හිටපු කාලය ඇතුළත ඇගේ කුසට දරුවෙක් ආවේ."

ගැහැනුන්ට පිරිමි රුස්සන්නේ නැති එකටයි, දරුවන් නොලැබෙන එකටයි, ඇඟ කෙට්ටු වෙන එකටයි හැමදේටම කළු කුමාරයාට දෙස් කියන්න කලින් ටිකක් බුද්ධිමත් විදියට හිතන්න. ඊටපස්සේ තමන්ගේ ගැටලුව කායික එකක්ද මානසික එකක්ද කියන එක හරියට හඳුනාගෙන කායික හෝ මනෝ වෛද්‍යවරයෙකුගෙන් නිසි ප්‍රතිකාර ගන්න.

මේ කියන විදියට සමහර ගෑනු උදවියට අසනීප, අපිරිසිදුකම් වගේ දේවල් වහන් කරගෙන ඉන්න ලැබිලා තියෙන්නේ ඔය කළු කුමාරයා නිසා. අනික කළු කුමාරයට බයේ හැන්දෑවේ තනියම එළියට නොබහින ගෑනු ළමයි කළු කුමාරයා නිසාම කොච්චර රැකිලා ඇත්ද? කට්ටඩියෝ, ඇදුරෝ, ජ්‍යෝතිෂ්‍යකාරයෝ කොච්චරක් හම්බ කරගෙන ඇත්ද? එහෙම බලද්දී තොවිල් නටලා එළවගන්න නෙවෙයි කළු කුමාරයා ඉන්න තැනක් හොයලා කකුල් දෙක අල්ලලා වැන්දත් පාඩු නෑ.

ලිහිණි මධුෂිකා

**මෙතෙක් කතාව**


විදුහල්පතිවරයෙකු වූ සෙනරත් ඇල්ලේපොලගේත්, සේපාලිකා ඇල්ලෙපොලගේත් වැඩිමල් දියණිය වන අංජනා සරසවි සිසුවියකි. ඇමතිවරයකු වන බණ්ඩාර තෙන්නකෝන්ගේත්, සෙනෙහෙලතා මැණිකේ තෙන්නකෝන්ගේත් බාල පුතා වූ තේනුක ඇය හා පෙමින් බැඳෙන්නේ දුටු සියලු තරුණියන් අතරින් ඈ ළඟ හිත සෙවූ පෙම්වතිය සිටි නිසාය. දේශපාලනය නොරුස්සන ඔහු ගෙදරින් ඈත්ව ඔහුගේම ව්‍යාපාරයක් කරගෙන යන්නේ ජපානයේ සිට පැමිණියාට පසුවය. සෙනෙහෙලතා මැණිකේ දියණියට හා වැඩිමල් පුතුට වඩා තේනුකට ආදරය කළාය. ඒත් ඔහුගේ වැඩිමල් සහෝදරයා වූ මේනක බණ්ඩාර හැමවිටම ඔහු හා තරඟයට ආ අතර මේනක විසින් තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා නිතර රටේ කතාබහට ලක් කරන පුවත් මැව්වේය. සෙනරත් ඇල්ලේපොල හෘදයාබාධයකින් හදිසියේ මියයාමත් සමඟ රැකියාවක් නොකළ සේපාලිකාත්, අංජනා, නංගී සහ මල්ලීත් අසරණ වෙද්දී ඔවුනට පිහිට වූයේද තේනුකය. ඒ වනවිට ඔහු කඩවත පියාගේ නිවසේ පදිංචිව සිටි අතර මේනක, තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා රවටමින් ඒ නිවසේ ගෙවත්ත එළවලු වගාවට ඉල්ලා සිටියේය. ඔහුට ඊට ඉඩදීමේ ප්‍රතිඵලයක් ලෙසින් තේනුකට ඒ නිවසේ සිටින්න බැරි වුණේය. ඒ අවස්ථාවේ කාටත් රහසින් සෙනෙහෙලතා මැණිකේ ඇගේ ගමේ ඉඩමක් සහෝදරයාට විකුණා ගත් මුදල් තේනුකට නිවසක් මිලදී ගන්නට දුන්නාය. ඔහු නිවසක් මිලට ගත්තද එය අංජනාට සැඟවූයේ දිනෙක ඈ පුදුමකරනු සඳහාය. ඒ නිසා ඔහු ඉන්නේ කුලී නිවසක බව කී තේනුක ඒ නිවසේම පහත මහළ අංජනාගේ පවුලේ අයට ලබා දුන්නේය. දරුවන් සම්පූර්ණයෙන් මාතලේ ඉගෙනීම් කටයුතු නැවැත්වූ පසු කොළඹ එන්නට සේපාලිකාගේ බලාපොරොත්තුව විය. මේ අතර තේනුකගේ කේන්දරයේ සිකුරුගේ බලය වැඩිවූවා සේ ඔහු නොදැන මංගල යෝජනා දෙකක් පැමිණ තිබුණි. එකක් බණ්ඩාර තෙන්නකෝන් ඇමතිවරයාගේ සහෝදර ඇමතිවරයෙකුගේ දියණියකි. අනෙක තේනුකගේ මාමාගේ දියණිය චතුමිණිය. ඒ කිසිත් නොදැන තේනුක අංජනාව සමන් දේවාලය වන්දවන්නට කැඳවා ගියේය. විදේශයක සිට ලංකාවට පැමිණ සිටි චතුමිණී දෙමාපියන් සමඟ ඔහු බලන්නට ඒ අතරවාරයේ ඇමති නිල නිවසට පැමිණියාය.

**අද එතැන් සිට**

# ඒ වසරයි

**බියංකා නානායක්කාර ලියයි**

**68 කොටස**



# මමත් පැල් බැඳගෙන ආදරේ කරනවා හැබැයි ඒ ඔයාට නෙවෙයි

තේනුක තෙන්නකෝන් සිටියේ පිවිසුම් දොර සමීපයේම නිසා චතුමිණීගේ ඇස ගැටුණේ නැත. සමහරවිට මේ දකින්නේ වසර ගාණකින් නිසා දුටුවත් එක්වර ඇයට හඳුනාගන්නට නොහැකි වනු ඇතැයිද ඔහුට ඒ තත්පරයේ සිතුණි. තේනුක සාප්පුවට ඇතුළු වූ දොරින්ම ආපසු එළියට බැස්සේ ඔහුව දුටු කමල්ට ද අතින් සංඥාවක් කරමිනි. වෙලාවට කාරය නැවතුවේ සාප්පුව ඉස්සරහින්ම වාගේ පාර අයිනෙනි. වෙනදාට ඔහු වාහනය නවතන තැනත් ත්‍රීවිලරයක් හා බයිසිකලයක් ඔහු එනවිට නවතා තිබුණේය. ඒ ගැන ඔහු තරහක් අමනාපයක් ඇති කර නොගත්තේ ඒ සාප්පුවට ආ ගැනුම්කරුවන් වීම නිසාය. ඔහු පිටව ආ වේගයත් වාහනයට නැග එය පණගන්වාගත් ආකාරයත් ගැන ඔහුටම පුදුමය. ඒ සැනින් ඔහු කමල්ට ඇමතුමක් ගත්තේය. ඔහු කතා කරන්නට පෙර තේනුක කතා කළේය.

**"මං ඇවිත් ගියා කියලා ඔතන ඉන්න කාටවත් ඇහෙන්න කියන්න එපා..."**

**"හා..."**

**"මං එනකොට අර ඔතන සන්ග්ලාස් ඔලුවෙ දන් හිටපු ලේඩි මං ගැන ඇහුවද?"**

කමල්ගේ ඇස් ඇය සෙව්වේය. ඇය මහත් ඕනෑකමකින් පිවිසුම් දොර දෙස බලා සිටිනු පෙනුණි. ඇය ආ සැනින් තේනුක බණ්ඩාර තෙන්නකෝන් ගැන ඇසුවේ වින්දනගෙනි.

**"වින්දනගෙන් ඇහුවා. මහත්තයාගෙ යාළුවෙක් වගේ... එළියට ගිහින් කිව්වම දහක් ප්‍රශ්න..."**

ඒ ඇසුවේ මොනවාදැයි අසන්නට ඔහුට සිත් වුවත් මේ ඊට වෙලාව නොවේ. ඇයව කෙසේ හෝ සාප්පුවෙන් පිට කර මිස එහි නොයන්නට ඔහු සිතාගත්තේය.

**"එහෙනම් තව ටික වෙලාවකින් කියන්න හදිස්සියක් වෙලා නුවර යනවා කිව්වා. අද එන එක ෂුවර් නෑ කියලත් කිව්වා කියලා.."**

**"හා..."**

කමල් කෙටි උත්තරයක්ම දුන්නේ ඇය එවර කවුන්ටරය වෙත ආ නිසාය.

**"මහත්තයා මම තියන්නම්."**

ඇයට ඇසෙන්නටම කී කමල් ඇමතුම විසන්ධි කළේය. ඇය නොදුටුවා සේ ඔහු දුරකතන කවර තෝරන්නිය දෙස බැලුවේය. ඇය අතේ කවර තුනකි. එක එක කවරය දෙස ඇය වෙන් වෙන්ව කීප වතාවක් බලනු පෙනුණි.

**"මේ... ඔයා මේ කඩේ වැඩ කරන කෙනෙක්ද...?"**

සන්ග්ලාස් යුවතිය කමල් ළඟට විත් ඇසුවේ සුහදකමක් නැති ගාම්භීර වූ හඬකිනි.

**"ඔව්..."**

**"තේනුකට පොඩ්ඩක් කෝල් එකක් අරන් දෙන්න බැරිද...?"**

කමල් ඇය දෙස බලා සිටියේ සැබෑවටම ඇගේ රුව දෑසේ ඇඳගනිමිනි. ඈ සුන්දරය. ඒත් කලබලකාරීය.

**"ඇයි නෝනා ළඟ නොම්මරේ නැද්ද?"**

**"තියෙනවා... මගෙ කෝල් එක ගන්නෙ නෑ. ඒකයි..."**

**කරුණාකරලා ගෙදර යන්න. ඔයා කෙල්ලක්. කොල්ලො වගේ හැසිරෙන කෙල්ලන්ට මං කොහොමත් කැමති නෑ**

ඇයගේ කතාවේ මෘදු බවක් නැත. මොකද්දෝ අහංකාරකමක් ඒ වචනවල සේම මුහුණේ වූ පෙනුමේත් කමල් දුටුවේය.

**"දැන් කතා කළේ මහත්තයා. හදිස්සියේ නුවර යන්න වෙලා, යනගමන් කිව්වා. සමහරවිට අද එයිද කියලා ෂුවර් නෑ කිව්වා..."**

අවශ්‍ය තැනට කමල් තේනුක දුන් උපදේශය යෙදුවේය.

**"නුවර...?"**

**"ඔව්..."**

**"එයා නුවර යන්නෙ කොහෙද, අපේ ගෙදරවත්ද?"**

චතුමිණී හා කතාව නවතන්නට වූයේ සාප්පුවට ගණුදෙනුකරුවෙකු ආ නිසාය. වින්දනද කෙනෙකුට දුරකතනයක් ගලවාගෙන පෙන්වමින් සිටි නිසා කමල්ට පැමිණි කෙනා වෙත යොමුවන්නට සිදුවුණේය. චතුමිණීට දැනුණේ ඇය තනිවූවා වැනි හැඟීමකි. හදිසියේ කොළඹ ආ නිශ්ශංක රාජපක්ෂ හා චතුමිණීත් කොළඹ ආවේ ඔහු වැඩ ටික කරගන්නාතුරු තේනුකගේ දුරකතන සාප්පුවේ රැඳෙන බලාපොරොත්තුවෙනි. ඔහු සාප්පුවේ ඇතැයි සිතූ නිශ්ශංක, දියණිය සාප්පුව ළඟින් බස්වා ගියා මිස සාප්පුව තුළට ආවේවත් නැත.

**ඔයා මොන එකකට ලංකාවට ආවද අප්පා. එහෙටම වෙලා ඉන්නෙ නැතුව**

දවසෙන් පැය දෙක තුනක් ගෙවී යද්දී හදිසියේම නිශ්ශංක රාජපක්ෂ කොළඹ ආවේ චතුමිණී නොදන්නා කරුණකටය. ඒ ඇය වෙනුවෙන් ගත් කඩ කාමරයේ හිමිකරුගෙන් ආ ඇමතුමකට. ඔහු නිශ්ශංකව කඩ කාමරයේදීම හමුවන්නට කැමති වුවත් නිශ්ශංක ඊට කැමතිවූයේ නැත. ඔහු හමුවන්නට නිශ්ශංක කැමතිවූයේ පිට තැනකය. ඒ නිසා අවසානයේ ගොඩනැගිල්ල හිමිකරුගේ නිවසේදී ඒ හමුව යොදා ගැනුණේය. ඒ මුදල් ගෙවීම් සහ ගිවිසුම්පත් අත්සන් කිරීමෙන් පසු ගොඩනැගිල්ල හිමිකරු අදාළ කඩ කාමරය වෙත ආවේ බාර දී තිබූ අලුත්වැඩියා කිරීම් නිසි ලෙස වන්නේ දැයි බැලීමටය.

කමල් දුරකතන ඇමතුම ගෙන නොදුන් නිසා නැවත වරක් චතුමිණී තේනුක බණ්ඩාර තෙන්නකෝන්ට ඇමතුමක් ගත්තේය. ඇය කළ දේ ගැන අපැහැදීමෙන් සිටි තේනුක ඇගේ ඇමතුම ගත්තේ කිසිසේත් පාලනය කරගත නොහැකි තරහක් ද සමඟිනි.

**"අප්පා ඇති."**

ඔහුගේ හඬ ඇසුන සැනින් ඇය කීවාය.

**"ඇයි මොකද?"**

කිසිම දෙයක් නොදන්නා ලෙස ඔහු ඇසුවේය.

**"ඔයා කොහෙද ඉන්නෙ...?"**

**"ඇයි අහන්නේ...?"**

ඔහු ඇසුවේ ඇගේ ප්‍රශ්න කිරීම පමණක් නොව ඇය මතක් වෙද්දී ද කේන්තිය වැපිරී ගිය හිත සන්සුන් කරගනිමිනි.

**"මං ඉන්නෙ කොහෙද දන්නවද?"**

**"දන්නෙ නෑ. ඊටත් එහෙම දැනගන්න ඕනකමකුත් නෑ."**

**"අනේ අයියා... ඔයා හරි නරකයි..."**

**"ඕන දෙයක් හිතාගන්න. ඔයා මොන එකකට ලංකාවට ආවද අප්පා. එහෙටම වෙලා ඉන්නෙ නැතුව..."**

තේනුක කීවේ අමනාප හඬිනි. ඔහු සිටියේ දිප්පිටිගොඩ පාරේ ගෙදර මිදුලේය. සාප්පුවෙන් පිටවූ ඔහු ගෙදර ආවත් තාමත් ගෙතුළට යන්නට බැරිවිය. වාහනයේ සිටම අංජනාටද කතා කළේය. එය අමතක වී නම් ඇය ගින්නේ පිච්චෙයි. ජීවිතේට වගකීම් වැඩිවනවා කියන්නේ නිදහස සීමාවෙනවා කියන එකයි.

**"මං දැන් ඉන්නෙ ඔයාගෙ සාප්පුවේ ඔයා එනකල් මේ."**

ඔහු කියන දේවල් කනකට ගත් බවක් නොපෙන්වමින් ඇය කීවාය.

ඇය සාප්පුවේ ඉන්නා බව ඔහු දැන සිටියත් ඇයම ඒ බැව් කියද්දී ඔහුට ආයෙත් චතුමිණී කෙරේ කේන්තිය අලුත් වුණේය.

**"චතුමිණී, මේක ලංකාව. පිටරට නෙවේ. ඔයා මොනවටද ඔතෙන්ට ගියේ? මෙච්චරකල් නැතුව මාව හොයාගෙන ගෑනියෙක් ඔතෙන්ට ගියාම මගේ වැඩ කරන අය මං ගැන මොකද හිතන්නේ?"**

ඔහු කීවේ වචන බර කර තදිනි.

**"මං ගෑනියෙක් යෑ. ඊටත් මට මෙතෙන්ට එන්න අයිතියක් තියෙනවනේ."**

තේනුක තෙන්නකෝන්ගේ හිත වහා අතීතයට දිව්වේය. ඇය ළමා කාලයේද එහෙමය. වචනවලින් එල්ලි එල්ලී රණ්ඩු කරන්නට එදවසද හපනියකි. ඒත් ඔහු හැඟීම්බර වෙන්නට ගියේ නැත.

**"ඔයාට මං එදත් කිව්වා, අද කියන්නෙත් හෙට කියන්නෙත් ඒක. මං බඳින්නෙ ඔයා නෙවේ, ඔයාගෙ හිත රිදෙයි. ඒත් බොරුවට ජීවිතේ අවුල්කරගන්න එපා චතුමිණී. ආදරේ බලෙන් හිතකට රිංගවන්න බෑ. ඒක කෙනෙක්ගෙ හිතේ බොහොම සුන්දරව පහළවෙන දෙයක්. හරියට හරියන ආදරේ හම්බවුණාම මමත් පැල් බැඳගෙන ආදරේ කරන කෙනෙක්. හැබැයි ඒ ඔයා නෙවේ."**

හිතේ තිබ්බ ලොකු කතාවක් කෙටි කර තේනුක කියුවේ නොකිව්වොත් ඉදිරියට මීට වඩා ඇගෙන් බලපෑම් ඇතිවෙතැයි සිතාය.

**"ඔයා එනකම් මං මෙතන ඉන්නවා..."**

කතා කළ වචන අපරාදේ කියා සිතුණේ ඇගේ නොහික්මුණු වචන හමුවේය.

**"ඉන්න, හෙට නෙවේ අනිද්දා වෙනකල්. මං මේ යාළුවෙක්ගෙ වැඩකට නුවර යන ගමන්."**

**"නුවර. ඒ කොහාටද?"**

**"මං මොකටද මං යන තැන් ඔයාට කියන්නේ?"**

ඔහු ඇයට කීවේ තරහෙනි.

**"කරුණාකරලා ගෙදර යන්න. ඔයා කෙල්ලක්. කොල්ලො වගේ හැසිරෙන කෙල්ලන්ට මං කොහොමත් කැමති නෑ. දැන් ආව විදිහකට ගෙදර යන්න. තව ටිකකින් සාප්පුව වහයි."**

**"කමක් නෑ. මං අප්පච්චි එනකල් පාරෙ හරි හිටගෙන ඉන්නම්."**

ඇය කියද්දී ඔහුගෙ හිතේ වූ කේන්තිය සේදී ගියේය.

**ලබන සතියට...**

## තෙල් ගහන්න ෂෙඩ් එකට ගිහින් බලනකොට සල්ලි ටික නැතිලු

# මගේ මිනිහගෙන් මම හොරකම් කළාම කාටවත් ඇති රැදාව මොකක්ද?

ජම්මෙට වඩා පුරුද්ද ලොකුයි කියලා කතාවටත් කියනවනේ. කොච්චර මිල මුදල්, බලය, සතුට තිබ්බත් සමහර අසික්ෂිත පුරුදු නිසා සමහරු ජීවිතේට කළු පැල්ලම් ඇති කරගන්නවා. ඉස්සර ඉඳපු මේරි කියන රැජිණත් ඒ වගේ කෙනෙක්. මේරි කියන්නේ වර්තමාන එළිසෙබත් රැජිණියගේ මිත්තණිය. මේ රැජිණ කොහේ ගියත් එතැනින් එනකොට මොනවාහරි දෙයක් සොරකම් කරනවලු. අඩුතරමේ හැන්දක් හරි. ඉතින් මේ වැඩේ නිසා වැඩිපුරම අපහසුතාවයට පත්වෙලා තියෙන්නේ ඇගේ සැමියා ජෝර්ජ් රජුලු.

මේ මෑතකදි මගේ උපදේශන සේවයට ආපු සැමියෙක් ඔහුගේ කතාව කියන්න පටන්ගත්තෙම ඔය මේරි රැජිණගේ කතාවෙන්. බිරින්දෑ නිසා ඔහුත් ජෝර්ජ් රජුගේ තත්ත්වයටම පත්වෙලා කියලයි ඔහු කිව්වේ. ඒ නිසා ඔහුගේ කතාව ඔබත් එක්ක බෙදාගන්න තරම් වටින කතාවක් කියලා මට හිතුණා.

මම කියන මේ සැමියා අවුරුදු පනහකට නම් කිට්ටු ඇති. බිරිඳත් ටිකක් මැදි වයසක කෙනෙක්. මේ දෙපළට පුතෙක් සහ දුවෙක් ඉන්නවා. සැමියා වගේම බිරිඳත් රැකියාවක් කළ නිසා මේ පවුලට ආර්ථික අහේනියක් තිබිලා නැහැ.

මේ සැමියා ගෙදරට අවශ්‍ය බඩු මුට්ටු ආදිය මිලදී ගන්න කියලා මාසිකව සැලකිය යුතු මුදලක් බිරිඳගේ අතට දෙනවලු. හැබැයි ඒ කෙසේ වෙතත් බිරිඳ තමන්ගේ පසුම්බියෙන් මුදල් සොරකම් කරන බව විවාහ වෙලා අවුරුද්දක් දෙකක් යද්දි සැමියාට තේරිලා. මොනවා වුණත් ඉතින් බිරිඳනේ කියලා හිතපු නිසා ඔහු ඇයට මුකුත් කියන්න ගිහිල්ලත් නැහැ. අනික ඇය සොරකම් කරලා තියෙන්නෙත් වටිනාකමෙන් අඩු මුදල් නෝට්ටුලු.

දවසක් මේ සැමියා රැකියා ස්ථානයේ මුදල් වගයක් ගෙදර ගෙනල්ලා තියෙනවා. පහුවෙනිදා ඒ මුදල් බැංකුවේ තැන්පත් කරන්න හිතාගෙනයි ඔහු ඒ මුදල් ගෙදර ගෙනල්ලා තියෙන්නේ. පහුවදා උදේ බැංකුවට ගිහින් බලද්දී ඒ මුදලෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අඩුයිලු.

ඉතින් නිසි වෙලාවට ඔහුට ඒ මුදල් තැන්පත් කරන්න බැරිවෙලා. රාජකාරී මුදල් නිවසට රැගෙනයාම සහ ඒවා නියමිත වෙලාවට තැන්පත් නොකිරීම නිසා ඔහුව රැකියාවෙන් ඉවත් කරන්න හදලා. ඒත් දක්ෂතාවය සහ පළපුරුද්ද නිසා ඔහු වෙනුවෙන් ඔෆිස් එකේ කීපදෙනෙක්ම කතා කරපු හින්දා කොහොමින් කොහොමහරි රස්සාව බේරිලා.

ඒ මුදල් ගැන බිරිඳගෙන් ඇහුවම ඇය ඒ ගැන දන්නේ නැහැ කියලා අඬ අඬා දහඅතේ දිවුරුවලු. මේ සැමියා ඒ වෙලාවෙත් ඇයව විශ්වාස කරලා. තව දවසක් වාහනේට තෙල් ගහන්න ගියාම තෙල් ගහන්න කියලා අයින් කරපු සල්ලි ටික පසුම්බියේ තිබිලා නැහැ. ඒ වෙලාවෙත් මේ සැමියා සෑහෙන අපහසුතාවයට පත්වෙලා. මුදල් සොරකම් කරන්නේ බිරිඳ කියන එක ඒ වෙලාවේ ඔහු තහවුරු කරගෙන.

ඉතින් ඔහොම ඉන්නකොට මේ මෑතකදි අසල්වැසි කාන්තාවක් මේ උදවියගේ ගේ ඉස්සරහටම ඇවිල්ලා දෙස් දෙවොල් තිය තියා මහ හයියෙන් කෑගහනවලු. බලනකොට මේ බිරිඳ ඒ ගෙදර පුංචි දරුවගේ කරේ තිබුණු පංචායුධය ගලවගෙන. ඒ ගෙදර කෙනෙක් ඒක ඇහැටම දැකලත් තියෙනවලු. ඔය ප්‍රශ්නේ නිසා ඒ සැමියට පොලිසි ගානේ පවා රස්තියාදු වෙන්න වෙලා. සිද්ධ වුණු ලෝක අපවාදේ ඊට උස නිසා ඒ ගෙවල් හරියෙන් යද්දි මූණ හංගගෙන යන බවත් මේ සැමියා මට කිව්වා.



**තව පොඩ්ඩෙන් රස්සාවත් නැතිවෙනවා**

තමන් කොච්චර කිව්වත් බිරිඳ කනකට ගන්නේ නැති නිසා ඔහු ඇයව මනෝඋපදේශනයට යොමු කරන්න හිතුවලු. කරුණු කාරණා පහක් සම්පූර්ණ වෙන තැනදි සොරකමක් සිද්ධවෙනවා කියලා බුදුන් දේශනා කරලා තියෙනවා. සොරකම් කරන දේ අනුන්ට අයත් වස්තුවක් වීම, ඒක අනුන්ගේ බව දැන සිටීම, ගැනීමේ සිත පහළ වීම, ඒ සඳහා උපක්‍රම යෙදීම, සොරකම් කිරීම තමයි ඒ කරුණු පහ.

නැතිබැරිකම නිසා සොරකම් කරන අය ඉන්නවා. එතකොට නොසන්සිඳෙන වස්තු තන්හාසේ නිසා අනුන්ගේ දේ සොරකම් කරන අයත් ඉන්නවා. ඒ විතරක් නෙමේ අනුන්ගේ දේ සොරකම් කරලා ඒකෙන් මානසික සතුටක් භුක්ති විඳින අයත් ඉන්නවා. හේතුව මොකක් වුණත් අර කිව් කරුණු පහ සම්පූර්ණ වෙනවා නම් ඒක සොරකමක්.

මේ කියන බිරිඳට තිබුණොත් ඔය තුන්වෙනි ගැටලුව. සුමඟින් ලැබෙන දේට වඩා නොමඟින් ලැබෙන දේට ඇය ප්‍රිය බවයි මට තේරුණේ. හැබැයි ඇය පොඩිවට මුදල් සොරකම් කරනකොටම ඇයට ඒ ගැන පැහැදිලි කළා නම් ඇය සොරකමට බිය වෙන්නත් ඉඩ තිබුණා. මුදල් අඩුයි කියලා සැමියගෙන් ගැටලුවක් වුණේ නැති තැන ඇගේ මනස තව තවත් එයට ඇබ්බැහි වෙලා තියෙනවා. නමුත් සැසි වාර දෙක තුනකින්ම මේ බිරිඳගේ මේ හැසිරීම යටපත් කරන්න මට පුළුවන් වුණා.

විවාහයෙන් පස්සේ මුදල් සම්බන්ධයෙන් දෙන්නා අතරේ පංගුපේරුවක් තියාගන්න ඕනේ නැහැ. ඒත් මොන හේතුවක් නිසාදෝ සැමියගේ මුදල් පසුම්බියෙන් මුදල් සොරකම් කරන්න ගොඩක් බිරින්දෑවරු හරි දක්ෂයි. **"මම හොරකම් කරන්නේ මගේ මිනිහගේ සල්ලිනේ"** කියලා කෙනෙක්ට හිතෙන්න පුළුවන්. ඉතින් සැමියගේ මුදල් තමන්ගේම සල්ලි කියලා හිතන කෙනෙක් නම් හොර චේතනාවක් නැතිව සැමියගෙන් මුදල් ඉල්ලගන්න පුළුවන්නේ. මොකද මුදල් සොරකම් කරන බව දැනගත්තම සැමියගේ හිතේ වුණත් බිරිඳ ගැන වැරදි චිත්‍රයක් ඇතිවෙන්න බැරි නැහැ.

අනික අම්මා, තාත්තගේ මුදල් සොරකම් කරනවා දැක්කොත් ගෙදර දරුවන් පවා ඒ දේවලට යොමු වෙන්න පුළුවන්. සමහර අම්මලා ඉන්නවා දරුවන් ලවා තාත්තගේ පසුම්බියෙන් මුදල් සොරකම් කරවනවා. නැත්තම් සොරකම කරනකල් තාත්තා එනවද කියලා දරුවන්ට ඔත්තු බලන්න උගන්වන අම්මලත් ඉන්නවා. ඉතින් නොදැනුවත්වම අර හය හතර නොතේරෙන දරුවත් ඒ හොරකමේම කොටස්කාරයෙක් වෙලා. මේවා සෙල්ලම් නෙමෙයි. ඔවැනි දේ නිසා දරුවෙක්ගේ මුළු ජීවිතේම විනාශ වෙන්න බැරි නැහැ. දෙමව්පියන්ගේ වැරදි නිසා හොරකමට යොමුවුණු දරුවෝ ඕනතරම් මේ සමාජයේ ඉන්නවා.

සල්ලි විතරක් නෙමේ අනුන්ගේ වත්තක මල් පැළයක්, ගඩා ගෙඩියක්වත් හොරෙන් කඩන්න එපා. හැබැයි තව දෙයක් කියන්න ඕනේ. බිරිඳට අවශ්‍ය දේවල් හැකි විදිහට අරගෙන දෙන්න සැමියටත් යුතුකමක් තියෙනවා. ඔය විවිධ පන්නයේ සුකුරුත්තම්වලට ගෑනු හරි ආසයිනේ.


බිරිඳට රන් ආදියෙන් සලකන එක සැමියෙක්ගේ යුතුකමක් කියලයි සිඟාලෝවාද සූත්‍රයෙත් දැක්වෙන්නේ. රත්තරන් නැතත් ඉඳලා හිටලා පුංචි දෙයක් හරි බිරිඳට ගිහින් දෙන්න. සමහර සැමියන් ඉන්නවා හම්බකරන හැම සතේම බීමට වියදම් කරන. එහෙම තැන්වලදිත් බිරින්දෑවරු සැමියගේ මුදල් සොරකම් කරනවා. ඉතින් එහෙම සැමියෙක් ඉන්නවා නම් නැත්තම් සොරකම් කරන බිරිඳක් ඉන්නවා නම් හොඳම දේ උපදේශනයට යොමු කරන එකයි.



මානව හැකියා ප්‍රවර්ධන විශේෂඥ හා ජ්‍යෙෂ්ඨ මනෝවිද්‍යා උපදේශිකා
**රත්නා පුෂ්ප කුමාරි**

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**

පුංචි කෙල්ලක් වෙලා ඉන්න කාලෙට වඩා මල්වර නැකතින් එළියට එන දැරිවියක්ගෙ හිතේ උපදින හිතුවිලි දිගෑරෙන්නෙ හරිම සිනිඳුවට. ඒත් ගෑනු හිතක හැඟීම් කියන්නෙ ඒ සිනිඳු හැඟීම්වලට විතරක්ම නෙමෙයි කියලා අපිට තේරුම්යන්නේ පවුල, ගෙදර, ගම අතහැරලා විවාහයකින් පස්සෙ නන්නාඳුනන තැනක, නන්නාඳුනන මිනිස්සු අතරේ නුහුරු ගෙදරක තනිවෙන්න වුණාම. එහෙම පසුබිමක තවන, දවන, රිදවන හැඟීම් හා අත්දැකීම් අතරේ නොවැටී ඉන්න උත්සාහ කරපු එවන් ගැහැනු හිතක දිගහැරුම තමයි මේ...



අහල පහල අය, "මොනවද කන්න ආසද?" කියල අහලා සැරින් සැරේ මම කැමති දේවල් හදලා එවන්න තරම් කාරුණික වුණත් "කෝ දරුවෙක්, කෝ දරුවෙක්" ඇසූ නැන්දම්මා ඇතුළු නෑසියන්ට මාව අමතක වෙලාම ගිහින් තිබුණා

# බලපල්ලකෝ තොපිටත් ළමයි හම්බවෙන කාලෙක මේවා තේරෙයි

කාලය ගලාගෙන ගියා. හිත ඉල්ලපු ලොකුම බලාපොරොත්තුව හරි ගියත් ඒකත් එක්ක ඉස්සරහට යන්න මට දැනීමක් තිබුණෙ නෑ. දැනීමක් තියෙන කෙනෙක් ළඟ හිටියෙත් නෑ. මට ඒ දෙකටම තිබ්බෙ හිතේ දහිරියයි සතුටයි විතරයි. හැම අම්මා කෙනෙකුටම වගේ මටද, මවක වීමේ පෙර ලකුණු පහල වෙන්නට පටන්ගත්තේ ස්වාමියා හා මා ස්වාමියාගෙ ළඟම නෑදෑයන් විසින් ඔවුන්ගේ සමාගමෙන් අපිව බොහොම ඈතක තියලා තිබුණු වෙලාවක.

අපිට කලින් අම්මලා වෙන්නට සූදානම් වෙච්චි අපෙ යාළුවෝ, ගමේ අහල පහල අය, සහෝදරියෝ අඹ ගැට, දෙහි ගැට, සියඹලා, අඹරැල්ලා ගැට කටේ දමාගෙන වගේ වගක් නැතිවම කන හැටි අපි බලාන හිටියේ,

**"මේ මොන ආසාවක්ද අප්ප මේක?"**

කියන හිතුවිල්ලෙන්. ඒත් ඒ අත්දැකීම මට ආවම හිතුණේ ඒ කාලෙට දරන්න අමාරුම දෙයක් තියෙනවනම් ඒ තමයි එක එක දේවල් කන්න ආසා හිතෙන එක කියලා.

අපි ගෙදර ඉන්නකොට අම්මා නිවාඩු පාඩුවෙ ඉන්න සමහර වෙලාවට පරණ දේවල් මතක් කරනවා. ඔය එක දවසක කිව්වා ලොකු අක්කා හම්බවෙන්න ඉන්නකොට කන්න හිතුණ දේවල්. හිතුණ දේ කොහොමහරි කන්නත් ඕනමයි කියලලු එතකොට හිතෙන්නෙ. අම්මටනම් අම්මගෙ අම්මා, අක්කා, නංගී ඔය ඔක්කොම ගෙදර හිටියලු ඒව හදල දෙන්න. ඒ ඇරෙන්න ගමේ අහල පහල උදවිය යාළුවො එයාලත් එහෙමලු. ගම්වලනම් තවම තියෙන සිරිතක් තමා බබෙක් හම්බවෙන්න කවුරු හරි ඉන්නවනම් රසට බත් එකක් උයලා ගිහින් දෙන එක. නැත්නම් කන්න ආසා මොනවද කියල අහලා ඒ දේ හදලා ගිහින් දෙන එක. ආයෙ ඉතිං දනයක් දෙනවා වගේ තමයි. සැදැහැ සිතින් සැලකිල්ලෙන් ආදරෙන් ඕක කරන්නෙ. අන්න එහෙම අපෙ අම්මට ලොකු අක්කා හම්බවෙන්න ඉද්දි ලැවරිය කන්න ආසාවක් ආවා කිවවම ලලිතගෙ ආච්චි පන් කොළ පෙට්ටියක් පුරෝලා ලැවරියා තම්බගෙන, සුදු රෙද්දකින් වහගෙන, ඔලුවෙත් තියාගෙන ආවා කියල තමයි එද අපෙ අම්මා කිව්වෙ.

ඉතිං එතකොට ඒ කාලෙ අපි කසාද බඳින්න හිතලවත් නෑ. අපිටත් නිකන් ඉන්න බැරිවටද මන්ද දරුවො හතක් වැදුව අපෙ අම්මා එක්ක අපි ඒ දවස්වල හරි හරියට තර්ක කරනවා ඔය දෙල දුක ගැන.

මට දරුවො නැති කාලේ අපෙ මහත්තයා හරියට ඉවසුවා. මගෙත් එක්ක දුක් වින්දා. මට මොනවහරි කවුරුත් කිව්වොත් ඒ අයත් එක්ක රංඩුවුණා. ඉතිං මං හිතාගත්ත එයා ඇති කියනකන් එයාට දරුවො දෙන්න

**"ඇත්තටම එහෙම දරාගන්න බැරි ආසාවල් එනවද...?"**

**"මං නම් ආස දේ නැති වුණොත් නිකන් ඉන්නවා."**

**"දැනුත් එහෙනම් ඔය අපිටත් එක එක දේ කන්න හිතෙන්නෙ."**

**"හැමකෙනාටම එහෙම හිතෙන්නෙ නැතිව ඇති."**

**"ඒ දවස්වලට උයන්න කම්මැලි හින්ද එහෙම ආසයි කියනවා ඇති. එතකොට කවුරු හරි ගෙනත් දෙනවනේ."**

අපි එක එක්කෙනා ඉතිං ඔය මොන දේ කිව්වත් අනේ අපෙ අම්මා හිනාවෙලා නිකන් හිටියා. සමහරවෙලාවට,

**"බලපල්ලකො උඹලටත් කවදහරි බබෙක් හම්බු වෙන්න ඉන්න කාලෙක ඕව ඇත්තද බොරුද කියලා."**

ඒක බොරුවක් නෙමේ කියලා හයියෙන් කෑ ගහන්න හිතුණෙ මට ඉස් ඉස්සර වෙලාම අම්මා හදන විදිහට බොම්බිලි බැදුමක් කන්න හිතුණ දවසෙ. හැතැම්ම සිය ගාණක් ඈතින් ඉන්න අම්මට කියපු සැනින් දුවගෙන එන්නත් බෑ කියල මං දැනන් හිටියා. ඒත් තාත්තා හදන කලටි පොල් සම්බෝලෙ ඕන කියපු දවසෙ එයාලගෙ වයසට ඔරොත්තු නොදෙන දුරක් ආව හැටි මතක් වෙනකොට දරුවෙකුට අම්මෙක් තාත්තෙක් කොයිතරම් නම් ආදරේද කියල අමුතුවෙන් කියන්න දෙයක් නෑ. ඒ තරම් ආදරේ තමන්ගෙ දරුවගෙ හිත අලුත් නෑයො රිදවනවා කියල දැනගත්තොත් එහෙම කොච්චර දුක හිතෙයිද? ඒකත් හරියට අර විශ්වවිද්‍යාලයේ නවක වදේ වගේ තමා. තමනුත් ඒ විදිහටම පීඩාවට පත්වෙලා දුක් වින්ද බව අමතක කරලා ඊළඟට එන කෙනාටත් රිදවන එක.

අහල පහල අය, **"මොනවද කන්න ආසද?"** කියල අහලා සැරින් සැරේ මම කැමති දේවල් හදලා එවන්න තරම් කාරුණික වුණත් **"කෝ දරුවෙක්, කෝ දරුවෙක්"** ඇසූ නැන්දම්මා ඇතුළු නෑසියන්ට මාව අමතක වෙලාම ගිහින් තිබුණා.

මම ඇඳ පාමුල බිත්තියෙත්, අල්මාරි දොරෙත් ලස්සන බබාලා දෙන්නෙක්ගෙ පිංතූර දෙකක් අලවා ගත්තා. නිදියනකොටත්, නැගිටිනකොටත් මට හැමමොහොතෙම ඇහැට පෙනුණේ මේ පුංචි බබාලා දෙන්නව. අල්මාරියේ දොරේ ඉන්න බබාට මම ගොඩාක් ආදරේ කෙරුවා. ඒ ඇස්වලට මමත්, ඒ ඇස් මටත් හැමවෙලේම කතා කෙරුවා. නූපන් පුංචි පුතා මට හිතුණෙම ඒ විදිහටම ඉඳියි කියලා. ඒ වගේ හුරතල් විදිහට මා එක්ක හිනාවෙයි කියලා.

විශේෂයක් නැති වුණත් මට හිතුණෙම මට ඉන්නෙ පුතෙක් වෙන්න ඇති කියලා. ඒ ඇයි කියන හැඟීම ගැන කියන්න තේරෙන්නේ නැහැ.

සායනවලට යනකොට අඳුරගත්ත අම්මලා සමහරක් එයාලගෙ අලුත් බබාගෙ කතාව කිව්වා. එක අම්මෙක් ආදරෙන් කුස පිරිමැද මැද කිව්වේ, **"කැඩෙන්න ගිය පවුල ආයෙ එකතු කෙරුවෙ මෙයා"** කියලා. තව අම්මෙක් කිව්වෙ දරුවො නැතිව අවුරුදු හයක් ඉන්නකොට පළවෙනි දරුව ලැබුණා කියලා. ඇය ඇවිත් හිටියෙ දෙවෙනි දරුවා ලැබෙන්න. ඒක නෙමේ හොඳම කතාව.

**"මට දරුවො නැති කාලේ අපෙ මහත්තයා හරියට ඉවසුවා. මගෙත් එක්ක දුක් වින්ද. මට මොනවහරි කවුරුත් කිව්වොත් ඒ අයත් එක්ක රංඩුවුණා. ඉතිං මං හිතාගත්ත එයා ඇති කියනකන් එයාට දරුවො දෙන්න. අර ඉන්නෙ මගෙ මහත්තයා."**

ඇයව පෙනෙන තැනක හිටගෙන ඉන්න කළු උස මහත දේහදාරී පුද්ගලයෙක් ඇය මට පෙන්නුවා. තමන්ගෙ ජීවිතේ සහකාරියට සතුට සහ රැකවරණය දෙන ස්වාමියෙක්. ඇත්තට හැම ගැහැනියකටම ඒ වගේ ආදරණීය පිරිමි ලැබෙන්නෙ නෑනෙ. ඒත් ලැබෙන්න ඕන එහෙම අයම තමයි. ඒ අතින් ඇය වාසනාවන්ත ගැහැනියක් කියලා මට අදටත් හිතෙනවා. තව කෙනෙක් කිව්වෙ බබෙක් එයි කියලා බලන් ඉඳලා ඉඳලා බැරිම තැන නංගිගෙ දුව ගෙදර ගෙනාවා කියලා. ඒ වෙනකොට එයා අවුරුදු දෙළහක් වෙනවලු කසාද බැඳලා. එයාගෙ දුව වගේ එයාව බලාගන්න පටන් අරන් මාස හයක් යනකොට මේ බබා ආව කියලා.

අපිටනම් ඒව පුදුමසහගත වුණාට වෛද්‍යවරුනම් කියන්නේ හිතේ පහලවෙන හැඟීම් හින්ද වෙනස්වෙන හෝමෝනවලට සමහර විට මේ වගේ දේවල් වෙන්න පුළුවන් කියලා.

කාසල් රෝහලේදී මම දෙවෙනි සැරේටත් ස්කෑන් පරීක්ෂාවකට ලක්වුණා. වැඩී ඉන්න පුංචි දරුවා දුවෙක්ද පුතෙක්ද කියලා මේ සැරේ කියන්න පුළුවන් කියල ඊට ඉස්සෙල්ලා මාසෙ මාව බලපු වෛද්‍යතුමා මට කීව්ව කියල මතක් වුණා.

**"ඩොක්ටර්..."**

ඉක්මනටම මට ඒක අහන්න ඕන වුණා. හරියට නිකන් අමතක වෙන්න ඉස්සර වෙලා වගේ ඒ අකුරු හතරට නොඉවසිල්ල කැටිවෙලා තිබුණද මන්ද. උපැස් යුවළ යට තිබ්බ්ව හීන් ඇස් තියුණු විදිහට මයෙ දිහාට හැරුණා. වචනයෙන් ඇහුවෙ නැතත් නිකන් ඇයි කියන්න වගේ බැල්මක්. කාසල් රෝහලේ මට මුණගැහුණු ඔක්කොම වෛද්‍යවරු හරිම කරුණාවන්තයි කියලා නොකියම බෑ. ඔවුන් බොහොම ඉවසීමෙන් හැම අම්මා කෙනෙකුටම ඇහුන්කන් දුන්නා.

**"මට ඉන්නෙ දුවෙක්ද, පුතෙක්ද...?"**

**ප්‍රියංකා නානායක්කාර**

එල්.ටී.ටී.ඊ. සංවිධානයට සම්බන්ධව සිට පුනරුත්ථාපනය වූ කතුන්ගේ සුඛිත මුදිත ජීවිත කතා පෙළ - 08 වැනි කොටස



එල්.ටී.ටී.ඊ සාමාජිකයන් පිරිසකට දේශනයක් පවත්වන තමිලිනී

# එක සිංහල පවුලක් හරි ආශ්‍රය කරලා තිබුණානම් කොටින්ට එකතු වෙන්නෙ නෑ කියලා තමිලිනී කිව්වා



සංගීත ගුරුවරියක් මෙන්ම ක්‍රීඩිකාවක ලෙසද දස්කම් දක්වා ඇති කපිතාන් ජයනි හේරත් කලක් අධ්‍යාපන අමාත්‍යංශයේ ක්‍රීඩා සංවිතයේත් රාජකාරි කර ඇත. 1996දී දෙවන ලුතිනන්වරියක ලෙස ජාතික ශිෂ්‍ය භට බළකායට එක්වූ ඇය 2006 වසරේදී සක්‍රිය හමුදා සේවයට එක්වී ඇත.

පසුව ඇය යුද සමයේ අවසාන කාලයේදී හමුදා භාරයට පත්වූ එල්.ටී.ටී.ඊ. සාමාජිකාවන්ගේ පුනරුත්ථාපන රාජකාරියටද එක්වූ අතර එලෙස පුනරුත්ථාපනය වූ කොටි සාමාජිකාවන් ගැන කපිතාන් ජයනි හේරත් කියන කතා පෙළයි මේ.

එල්.ටී.ටී.ඊ. ඊළාම් අරගලයේදී කොටි කාන්තා බළකාය විසින් ඉටුකළ කාර්යයභාරයද සුළුපටු නැත. ඔවුන් ආරක්ෂක අංශ ඉලක්ක කරගෙන එල්ල කරන ලද ප්‍රහාර මෙන්ම ප්‍රභූන් ඉලක්ක කරගෙන එල්ල කරන ලද මරාගෙන මැරෙන ප්‍රහාරද රජයට එකල ඉමහත් තර්ජනයක් විය. මෙම ප්‍රහාර සඳහා නායකත්වය දුන් ප්‍රධාන පෙළේ කොටි කාන්තාවන් වූයේ විදූෂා, දුර්ගා, මනිමේඛලා වැනි කාන්තාවන්ය. නමුත් මේ කොටි ප්‍රබලයින් රටේ සාමාන්‍ය ජනතාව අතර ප්‍රසිද්ධ චරිත නොවූහ. විශේෂයෙන් සිංහල ජනතාව අතර ප්‍රසිද්ධ එල්.ටී.ටී.ඊ. කාන්තා නායිකාව වූයේ **'තමිලිනී'** ය. තමිලිනී මට මුලින්ම හමුවූයේ 2002 පෙබරවාරි මස අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස A-09 මාර්ගය විවෘත කළ දිනයේදීය. කොටි කාන්තා දේශපාලන අංශයේ ප්‍රධානියා ලෙස තවත් කොටි සාමාජිකාවන් රැසක් පිරිවරාගෙන ඇය පැමිණ සිටියාය. ඉන් අනතුරුව කොටි පාලන ප්‍රදේශයේදී හා යාපනයේදී ඇයව හමුවූ අතර මාධ්‍යවේදියෙකු ලෙස මා ඇය සමඟ කතාබහ කළෙමි.

යුද්ධය අවසන් වීමෙන් පසුව ඇය ත්‍රස්ත විමර්ශන ඒකකයේ අත්අඩංගුවට පත්වූ බවට මාධ්‍ය වාර්තා පලවිය. එයිනුත් වසර කීපයකට පසුව තමිලිනී වව්නියාව පූන්තෝට්ටම් පුනරුත්ථාපන කඳවුරේ සිටින බවට තොරතුරක් ලැබිණි. අනතුරුව එහි ගිය මා කඳවුර භාර ප්‍රධානියෙකු හමුවී තමිලිනී සමඟ මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීම සඳහා අවසර පැතීය.

**"තරහා වෙන්න එපා මිස්ටර්, අපට විශේෂ නියෝගයක් ලැබිලා තියෙනවා ආරක්ෂක අමාත්‍යංශයේ විශේෂ අවසරයක් නැතිව කිසිම මාධ්‍යවේදියෙකුට තමිලිනීව හමුවෙන්න දෙන්න එපා කියලා. ඒක තමිලිනීගේ ඉල්ලීමක්."** එහි සිටි නිලධාරියාගෙන් පිළිතුරු ලැබිණි.

තවත් වසරක් පමණ ගිය විට තමිලිනී නිදහස් වූ බවද, එයිනුත් ටික කලකට පසුව තමිලිනී මියගිය බවටද මාධ්‍ය වාර්තා පළවිය. තමිලිනීගේ මරණයෙන් පසු වසර කීපයකට පෙර ඇය පිළිබඳව විශේෂාංග ලිපියක් සකස් කිරීමට මා හට පැවරිණි. මියගිය තමිලිනී පිළිබඳව තොරතුරු දන්නා අයෙකු සොයමින් සිටියදී **'කපිතාන් ජයනි හේරත්'**ගේ නම කියැවිණි. ඒ අනුව කපිතාන්වරිය හමුවී තොරතුරු ලබාගතිමි.

තමිලිනී මිය යාමට පෙර ඇගේ ජීවිත කතාව හා අත්දැකීම් අලලා **'තියුණු අසිපතක සෙවණ යට'** නමින් කෘතියක් ලියා තිබූ අතර ඇගේ මරණයෙන් පසුව එම කෘතිය සිංහල භාෂාවෙන්ද ප්‍රකාශයට පත්විය. එම කෘතිය මගින් **'ඊළාම් අරගලයේ'** සත්‍ය තොරතුරු හෙළිකර තිබිණි. එනිසා විශේෂයෙන් දකුණේ සිංහල ජනතාවට ඊළාම් අරගලයේ මෙන්ම එල්.ටී.ටී.ඊ. අභ්‍යන්තරය පිළිබඳව සැබෑ තොරතුරු දැනගැනීමට අවස්ථාව ලැබිණි. තමිලිනී හමුවීම පිළිබඳව වසර කීපයකට පසුව සිය මතකයන් අවදිකළ කපිතාන් ජයනි හේරත් මෙසේ පැවසීය.

> **තමිලිනී කියන්නෙ ජාත්‍යන්තරය පවා දන්න කොටි නායිකාවක්**

**"මගේ මතකයේ හැටියට තමිලිනී පූන්තෝට්ටම් පුනරුත්ථාපන මධ්‍යස්ථානයට ආවේ 2012 ජූලි 26 වෙනිදා. අධිකරණයෙන් ඇයට අවුරුද්දක පුනරුත්ථාන කාලයක් නියම කරලා තිබුණා. තමිලිනී එන්න කලින් පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ අණදෙන නිලධාරීතුමා අපේ නිලධාරීන්ට එන්න කියලා කීවා,**

**'තමිලිනී මේ මධ්‍යස්ථානයේ පුනරුත්ථාපනයට යොමු කරලා තියෙනවා. එයා දැනට මෙහෙට ආපු අභ්‍යාසලාභීන්ට (හිටපු එල්.ටී.ටී.ඊ. සාමජිකයන්) වඩා වෙනස්. තමිලිනී කියන්නේ ලංකාවේ විතරක් නෙමෙයි ජාත්‍යන්තරයම දන්න කෙනෙක්. ඒ නිසා එයාගේ ආරක්ෂාව ගැන සැලකිලිමත් වෙන්න ඕන. අවසරයක් නැතිව අනවශ්‍ය පුද්ගලයන්ට එයා එක්ක කතා කරන්න දෙන්න එපා.' පුනරුත්ථාන මධ්‍යස්ථානය භාර අණදෙන නිලධාරිවරයාගෙන් පිරිසට උපදෙස් ලැබිණි.**

**තමිලිනීව නවත්තන නේවාසිකාගාරය කඳවුර ඇතුළෙම තිබුණා වුණාට ඒක වෙනම වටකරලා තහඩු ගහලා ආවරණය කරලා වෙන් කළා. තමිලිනී එද්දි අපිටත් පොඩි ආසාවක් තිබුණා එයාව දැකලා කතා කරන්න. කොහොමහරි නියමිත දිනයේදී තමිලිනී අපේ මධ්‍යස්ථානයට ආවා. තමිලිනී කියලා ප්‍රසිද්ධ වුණාට එයාගෙ ඇත්ත නම ශිවකාමි. තමිලිනී කියන්නේ එයාට එල්.ටී.ටී.ඊ. සංවිධානයෙන් දාපු නම. අපේ මධ්‍යස්ථානයේ අපි කතා කරන්නේ උප්පැන්න සහතිකයේ තියෙන නමට. ඒ නිසා තමිලිනීට කතා කළෙත් ශිවකාමි කියලා. එයාත් සංවිධානයෙන් දුන්නු නමට වඩා දෙමාපියන් දාපු නමින් කතා කරනවට කැමති වුණා."**

**"ශිවකාමි (තමිලිනී) යුද හමුදාව ගැන දක්වපු ආකල්පය කොහොමද?"**

**පුනරුත්ථාපනයට යොමුකරන ගොඩක් එල්.ටී.ටී.ඊ. සාමාජිකයෝ අපි ළඟට එද්දි යුද හමුදාව ගැන එයාලගෙ තිබුණ වැරදි ආකල්ප නැතිව සහෝදරයෝ විදියට සලකගෙන තමයි එන්නේ. නමුත් කලාතුරකින් අපට හමුවෙනවා කොටි සංවිධානයේදී තිබුණ සතුරු ආකල්ප තියාගෙනම ඉන්න අය. එහෙම වුණහම අපි උත්සාහ කරන්නේ අපි ළඟ ඉන්න අවුරුද්දක කාලය තුළ එයාලගේ තියෙන වැරදි ආකල්ප නිවැරදි කරන්න. ශිවකාමි (තමිලිනී) එල්.ටී.ටී.ඊ. නායිකාවක් නිසා මම හිතුවේ රජය, යුද හමුදාව සතුරන් කියලා හිතාගෙන ඊළාම් රාජ්‍යය කවදාහරි ගන්න ඕනෙ වගේ අදහස් හිතේ තියාගෙන ඇති කියලා. ඒ නිසා මම මුලින්ම කතා කළේ හිතේ චකිතයකින්.**

**'කොහොමද ශිවකාමි?'**

**'හොඳින් ඉන්නවා මැඩම්' කියලා සිංහලෙන්ම උත්තර දුන්නා.**

**එතැනින් පස්සේ අපි දෙන්නා ගොඩක් හිතවත් වුණා. එතැන නේවාසිකාගාරයේ ඉඳපු අනෙක් අයත් ශිවකාමිට සැලකුවා. මධ්‍යස්ථානය ඇතුළේදි එයාගෙ නායකත්වයේ ලක්ෂණ පෙන්නුම් කළා. ඒක මටත් លොකු පහසුවක් වුණා.**

**'ශිවකාමි පාන්දර 5.00 වෙද්දි කට්ටියව පෝලිම් කරලා තියන්න.'**

**'ශිවකාමි අනිත් ළමයි ටික දාලා බිලට් (නේවාසිකාගාරය) වටේ වැවිලා තියෙන තණකොළ කපලා දාන්න.'**

**වගේ දේවල් කීවම මගේ ඉල්ලීම හොඳටම ඉෂ්ට කළා. ඒ අතර අපි දෙන්නා ගොඩක් දේවල් කතා කළා. පෞද්ගලික දේවල් පවා මාත් එක්ක කීවා.**

**'ශිවකාමි ඇයි එල්.ටී.ටී.ඊ. එකට බැඳෙන්න තීරණය කළේ?' කියලා මම ඇහුවා.**

**'මැඩම් පොඩි කාලේ ඉඳලා තිබුණ මගේ එකම අරමුණ මගේ පවුලට සලකන එක. ඒ නිසා හොඳට ඉගෙනගෙන යාපනය විශ්වවිද්‍යාලයට යනවා කියලා හිතාගෙන හිටියා. උපාධිය අරගෙන හොඳ රස්සාවක් කරලා ගෙදරට සලකනවා කියලා හිතුවා. ඉස්කෝලෙ (පරන්තන් හින්දු විදුහල) ගුරුවරු හිතාගෙන හිටියෙත් මම විශ්වවිද්‍යාලයට යාවි කියලා. එහෙම ඉද්දි අපි පදිංචි වෙලා ඉඳපු පරන්තන් අවට නිතරම ගැටුම් සිදුවුණා. අලිමංකඩ යුද හමුදා කඳවුර, කිළිනොච්චිය කඳවුර තිබීම ප්‍රධාන හේතුවක් වුණා. මේ ගැටුම්වලට මැදිවුණ අපි වගේම දෙමළ ජනතාව ගොඩක් දුක් වින්දා. එල්.ටී.ටී.ඊ. එකෙන් නිතරම කීව දේ තමයි ආක්‍රමණික සිංහල හමුදාව කවදාහරි උඹලව මරදාවි.**

**මේ ප්‍රශ්නවලින් බේරෙන්න තියෙන එකම විසඳුම හමුදාවට එරෙහිව සටන් කරලා ඊළාම් රාජ්‍ය දිනාගන්න එක කියලා. ඒ නිසා උසස්පෙළ පංතිවල ඉද්දිම මමත් කොටි සංවිධානයට බැඳුණා' කියලා තමිලිනීගෙන් පිළිතුරු ලැබුණා.**

**තමිලිනී මාත් එක්ක මෙහෙම කතාවක් කීවා. එල්.ටී.ටී.ඊ. එකට බැඳෙන්න කලින් එක සිංහල පවුලක් හරි ආශ්‍රය කරන්න ලැබුණානම් එයා එල්.ටී.ටී.ඊ. එකට බැඳෙන්නෙ නැතිවෙයි කියලා. මොකද සිංහල අය එක්ක තියෙන තරහට බැඳුණ බවත්, සිංහල අය ආශ්‍රය කරන්න ලැබුණානම් සිංහල අයගේ හොඳ ගතිගුණ දැනගෙන අදහස වෙනස් වේවි කියලාත් කිව්වා. අත්අඩංගුවට පත්වුණාට පස්සේ සිංහල අය ආශ්‍රය කරද්දි එල්.ටී.ටී.ඊ. එකෙන් කියපු දේවල් බොරු කියලත් සිංහල අය හොඳ මිනිස්සු කියලත් තේරුම් ගත්තා කියලා කීවා.**

**'කොටි නායක ප්‍රභාකරන් ගැන ඔයාගෙ අදහස මොකක්ද?' කියලා මම ඇහුවා.**

**'ප්‍රභාකරන් කියන්නේ හොඳ නායකයෙක්. එයාගෙ සමහර ප්‍රතිපත්තිවලට අදටත් මම ගරු කරනවා. හැබැයි එයා කරපු වැරදි වැඩේ තමයි සිංහල ජනතාව ගැන බොරු කියලා සංවිධානයේ සාමාජිකයෝ සිංහල ජනතාවට එරෙහිව පෙළගස්වපු එක. ඒ වැඩේ වැරදියි.' එහෙම තමයි ශිවකාමිගෙන් මට උත්තර ලැබුණේ."**



තමිලිනී

සනත් ප්‍රියන්ත



අපේ නෝනා එයාගෙ කිරි නොපෙව්වා විතරයි. එයා ඒ තරමට අපෙන් සැළකුම් ගන්න මේ අත්වල හුරතල් වුණා. වැඩ ඇරිලා ආවම දුවව හුරතල් කරන්න ළඟට ගන්නෙ අත, පය, මූණ හෝදගෙන. ඒත් එතකම් සූකිරිට ඉවසන්න බෑ. වඩාගන්නම ඕන. වඩාගත්තම නැළවෙන්නම ඕන

# දරුවෙක් වගේ හදලා ලොකු වුණාම දන් දෙන්න මං වෙස්සන්තර නෙවෙයි මචං

ලසන්ත රත්නවීරගේ හා නිමේෂා දිල්හානිගේ ජීවිතවලත් පාට පාට හීන පිරී තිබුණෝය. ඒ හීන හැබෑ කරගන්නට දහතුන් හැවිරිදි දියණිය වූ කනීෂා මව්පියන් ළඟ තබා දෙදෙනාම ඇඟලුම් ක්ෂේත්‍රයේ රැකියාව කළෝය. ඒ නිසා දෙදෙනාම ගලෙන් බිඳුණුවැව නිකවැව පිහිටි ගෙදරට ආවේ බොහෝ රෑ බෝ වීය. ඒ ද ආයතනයේ ප්‍රවාහන සේවයෙනි. ඔවුන්ගේ මහ ගේ තිබුණේ කිලෝමීටර් කීපයක් දුරින් ගම ඇතුළේය. ඒ නිසා බොහෝ කාලයක සිට හිතමින් සිටි පරිදි පසුගිය අප්‍රේල් මාසයේ රැකියා ස්ථානයේ ප්‍රවාහන සේවයට පහසුවන පරිද්දෙන් ඔවුන් පාරට ආසන්නයේ නිවසක් කුලියට ගෙන පදිංචියට ගියහ. ඒ නිවස වූයේ ඔවුන් එතෙක් කලක් විසූ නිමේෂාගේ මහගෙදරට කිලෝමීටර් දෙකක් පමණ දුරකිනි. ඒ එනවිට එහි දමා එන්නට අමාරුම එක් දෙයක් ලසන්තටත් නිමේෂාටත් තිබුණි. ඒ ඔවුන් ඉහේ මුණෝ තබාගෙන හැදූ සූකිරි, ටුටූ, කිටී හා කළුච්චි ඇතුළත් පූස් පවුලයි. එතැනින්ද ලසන්ත හා නිමේෂා වැඩිපුර බැඳී සිටියේ ‘සූකිරි’ට හා ‘ටුටූ’ටය.

**“සූකිරිට රෑට අපි නැතුව නින්ද යන්නෙ නෑ වගේම අපි දෙන්නටත් සූකිරි නැතුව රෑට නින්ද යන්නෙ නෑ. එයා ඇස් අරින්නත් කලින් ඉඳලා තමයි අපේ නෝනා එයාව ඇඳට පුරුදු කළේ. එද ඉඳලා මගේ මූණෙ රැවුල ගෑවි ගෑවි හරි කකුල් දෙක මැදින් සරමෙ තොටිල්ලට වගේ බැහැලා නිදි නොගත්ත එකම දවසක්වත් තිබ්බෙ නෑ.”**

සූකිරියා ජීවිතයට බද්ධ වූ හැටි ලසන්ත කීවේ එහෙමය. ඒ හැම වචනයකම වූයේ සූකිරිට සැබෑවටම හදවතේ බැඳි ස්නේහයයි.

**“අපේ නෝනා එයාගෙ කිරි නොපෙව්වා විතරයි. එයා ඒ තරමට අපෙන් සැළකුම් ගන්න මේ අත්වල හුරතල් වුණා. වැඩ ඇරිලා ආවම දුවව හුරතල් කරන්න ළඟට ගන්නෙ අත, පය, මූණ හෝදගෙන. ඒත් එතකම් සූකිරිට ඉවසන්න බෑ. වඩාගන්නම ඕන. වඩාගත්තම නැළවෙන්නම ඕන. එහෙම කළාම දුවගෙන් නෝක්කාඩු මහ ගොඩයි. තාත්තිට මාව තමයි ආව ගමන් ළඟට ගන්න බැරි කියලා. ඉතින් එහෙම හිටපු එයාලව මහගෙදර දාලා එන්න පුදුම විදිහට හිතලා හිතලයි හිත හදාගත්තේ.”**

එසේ පසුගිය අප්‍රේල් 15 වැනිදා ඔවුන් හිත හදාගෙන නව නිවසක පදිංචියට ගියද සූකිරිට මෙන්ම ටුටූටත් එසේ හිත හදාගෙන නිමේෂාගේ මහගෙදර සිටින්නට බැරිවිය. ඒ දෙදෙනා නොකා නොබී, දිනක් දෙකක් අඬමින් ලසන්ත හා නිමේෂා සොයා හර්තාල් කරන්නට වූහ.

**“ඇත්තටම එයාලා නොගෙනාවෙ ඒ දෙන්නගෙ ආරක්ෂාව ගැන හිතලා. මොකද අපි උදේ වැඩට ගිහින් පැය අට වැඩ කරලා හවස එන අය නෙවෙයි. අපේ වැඩ මුර රෑත් තියෙනවා. එතකොට වැඩ ඇරිලා එනකොට රෑ නවය දහයත් වෙනවා. දුවත් අපි මහගෙදර තියන්නෙ ඒකයි. ඒත් අපි නැතුව දුකෙන් සාංකාවෙන් හිටපු හින්දා අප්‍රේල් 17 වැනිදා අපි මේ ගෙදරට ඒ දෙන්නව ගෙනාවා.”**

සූකිරිගේ වයස මාස දහයකි. ටුටූට තවමත් මාස දෙකකි. සූකිරි, සූකිරි කැටයක් තරම් සුදු ලස්සනම ලස්සන පූසෙකි. දකින ඕනෑම කෙනෙකුට වඩාගන්නට හිතෙන සූකිරි ඕනම කෙනෙකුට වඩාගෙන හුරතල් කරන්නට පුළුවන් හීලෑ කෙනෙකි. ලසන්තලාගේ අලුත් ගෙදර අවට අයත් ඉතා ඉක්මනින් දැන හඳුනාගත් සූකිරි එහි පැමිණ දිනක් දෙකක් යද්දී ගෙදරට යාව ඇති පන්සල් තාප්පයට වී වටපිට බලමින් ඉන්නට හුරුවුණෝය. ඒ නිසා දහම් පාසලේ ළමයින් සේම පන්සලේ හාමුදුරුවන්ද සූකිරිගේ යාළුවෝ වූහ. සමහර විටෙක දහම්පාසලේ දරුවන්ගේ අතට වී හුරතල්ද වුණෝය.



මට දැනෙනවා, මම දන්නවා එයා ජීවතුන් අතර ඉන්නවා කියලා. එයා මගෙ ඇඟේම කොටසක් වගේ. අපිට එයා නැතුව පපුව කකියනවා වගේ එයාටත් එහෙම ඇති. සූකිරිට කන්න බොන්න දුන්නට, සැපට ජීවත්වෙන්න ලැබුණට ආදරෙන් සැළකුවට වැඩක් නෑ. මං නැතුව නින්ද යන්නෙ නෑ

දින දින ගෙවුණි. සූකිරිලා ලසන්තලාගේ අලුත් ගෙදරට පැමිණ දින අටක් ගෙවී ගියේය. එදා අප්‍රේල් 28 වැනිදාය. එදා දවල් කාලයේ නිමේෂා ගෙදර සිටියාය. ඇය ඒ ළඟ කඩයට යද්දී සූකිරි සිටියේ පන්සලේ තාප්පෙ උඩය. ඇය කඩයේ සිට එද්දී වෙනදා නොදුටු පිරිමි ළමුන් කීපදෙනෙක් අතේ සූකිරි හුරතල්වෙනුත්, ඔවුන් සූකිරි වඩාගෙන ෆොටෝ ගන්නා අයුරුත් දුටුවාය. කිසිවක්ම නොකියා ඇය එතැනින් ආවේ සූකිරි දකින ඕනම කෙනෙක් වඩාගන්නා නිසාය. ඒ ළමයින් ගිය පසුත් එදා සූකිරි ගෙදර සිටියේය. එදා රෑද පාන්දර දෙක තුන වනතුරුත් සූකිරි සිටියේ ලසන්තගේ ඇඳේ නිදාගෙනයි. ඒත් ඊට පසුදා උදේ ඔවුන් දෙදෙනා වැඩට යන්නට සූදානම් වී සූකිරිට කතා කළත් ආවේ නැත.

**“කොහෙට හරි වෙලා නිදි ඇති කියලා හිතලා අපි වැඩට ගියා. හවස අපි හිතාගෙන ආවේ සූකිරි ඇවිත් ඇති කියලා. ඒත් එයා ඇවිත් හිටියෙ නෑ. ඒ වෙලේ ඉඳලා තාම අපි සූකිරි හොයනවා...”**

පැත්ත පළාතටම ඇසෙන්න සූකිරිගේ නම අඬ ගැසූවත් ලසන්තගේ ඒ හඬ සුළඟේ පාව ගියා පමණි. එතෙකින් නොනැවතුණ ඔවුන් දෙදෙනා ඊට පසුදා ඒ අවට ළිංවල, වළවල් ඇතුළු අනතුරුදායක තැන්වල සූකිරියා සොයා ඇවිද්දහ. ඒත් කෙනෙක් දැක්ක බවටවත් කිසිඳු හෝඩුවාවක් නොවීය. ලසන්තගේත් නිමේෂාගේත් හිත විතරක් නොව ගෙදරද ඔවුන් නිදන ඇඳද පාළු විය.

**“අර ළමයි පිට ගමකින් ආව කට්ටියක් කියලයි තොරතුරු ලැබුණේ. එක්කෝ ඒ අය උදේ පාන්දර එළියෙ ඉන්නැද්දී සූකිරි අරන් ගියා වෙන්න පුළුවන්. එයා මේ ගමේ ඉන්නවනම් මේ වෙනකොට ඇවිල්ලා. මට දැනෙනවා, මම දන්නවා එයා ජීවතුන් අතර ඉන්නවා කියලා. එයා මගෙ ඇඟේම කොටසක් වගේ. අපිට එයා නැතුව පපුව කකියනවා වගේ එයාටත් එහෙම ඇති. සූකිරිට කන්න බොන්න දුන්නට, සැපට ජීවත්වෙන්න ලැබුණට ආදරෙන් සැළකුවට වැඩක් නෑ. මං නැතුව නින්ද යන්නෙ නෑ. ටුටූත් එහෙම හුරතලේට හැදුනට මේ තරම්ම එයා බැඳිලා නෑ. අනික ටුටූ පුංචි වුණාට ඕන තැනකින් බේරෙන්න දන්නවා. එත් සූකිරි හරි මෝඩයා. පොඩ්ඩ ඇත්තන් බයවෙනවා.”**

මේ සා සත්තුන්ට මිනිස්සු ආදරය කරනවාදැයි කෙනෙකුට සිතෙන්නට පුළුවන. පුදුම විය යුතු නැත. එය ඇත්තය. මේ ලසන්ත සූකිරි වෙනුවෙන් මුහුණුපොතට එක්කළ සටහනයි.

**“මං වෙස්සන්තර නෙවෙයි මචං.**

**ඉපදුණ දවසෙ ඉඳලා දරුවෙක් වගේ හැදුවෙ ලොකු වුණාම දන් දෙන්න නෙවේ. පෙනුමට හැඩට ඉන්න නිසා ආසාවට උස්සන් ගියාට කමක් නෑ. එයා සාංකාවෙන් නොකා නොබී ඉන්නවනම් ආයෙත් ගෙනත් දාපන් මචං. නෝනා තාමත් උදේ හවා සූකිරි කියලා කතා කර කර හොයනවා.”**

බියංකා නානායක්කාර

## පාඩම් අංක 19

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා. ඉතින් අද පාඩම විජලිත කොස් හදන හැටි.**

## ස්වයං රැකියා

# ලක්ෂෙට කොඩි දාන්න බත් ගහෙන් තල්ලුවක්




**"ගසට නමකි මල පිපුණම වෙන නමකී**

**ගැටයට නමකි ලොකු වෙනකොට වෙන නමකී**

**ගෙඩියට නමකි ගෙඩි ඉදුණම වෙන නමකී**

**මෙතුන් පදේ තෝරාලා කියන් සකී"**

තේරවිලි පද ටික කියවනකොටම උත්තරේ මතක් වුණා නේද? කමක් නෑ. කෝකටත් මම උත්තරෙත් මේ විදියට සටහන් කරන්නම්කෝ.

**"ගසට කොස් කියයි මල නම් පනා නොවේදෝ**

**ගැටයට පොළොස් ලොකු වෙනකොට නිකිණි නොවේදෝ**

**ගෙඩියට කොස් ඉදුණම වරකා නොවේදෝ**

**මෙතුන් පදේ තේරුවේ මෙලෙස නොවේදෝ"**

ඉතිහාසයේ ඉඳලම ආහාර හිඟ කාලෙට කාට කාටත් මුලින්ම මතක් වෙලා තියෙන්නේ කොස්. ඒකනේ කොස් ගහට **'බත් ගහ'** කියලා කියන්නේ. කොස්වල ඛනිජ ලවණ, පොටෑසියම්, මැග්නීසියම් ඇතුළු පෝෂණ සංඝටක රාශියක්ම අන්තර්ගතයි.

හැබැයි ඒ මොන සංඝටකය අන්තර්ගත වුණත් ගොඩක් අයට තවමත් කොස්වල වටිනාකම ගැන වැටහීමක් නෑ. ලංකාවේ වාර්ෂිකව කොස් ගෙඩි කෝටි විසි නවයක් විතර හැදෙනවලු.

හැබැයි අපි එයින් ප්‍රයෝජනයට ගන්නේ කොස් ගෙඩි කෝටි නවයක් විතරයි කියලා ගණන් බලලා තියෙනවා.

ඉතින් නිස්කාරණේ පොළොවට යට වෙලායන ධන නිධානයෙන් ජීවිතය එළිය කරගන්න පුළුවන් බිස්නස් එකක් ගැන තමයි අපි කියලා දෙන්න හදන්නේ. මීට කලින් දවසකත් අපි පොළොස්වලින් කරගන්න පුළුවන් හොඳ ව්‍යාපාරයක් ගැන කතා කළා මතක ඇති.

ඉතින් අදත් කියන්න යන්නේ ඒ වගේම කොස් වැඩක් කරගන්න හැටි.

වියළන ලද කොස් නැත්නම් විජලිත කොස්වලට අපේ රටේ අයගෙන් විතරක් නෙමෙයි පිටරටවල ජීවත් වෙන ලාංකිකයන්ගෙනුත් විදේශිකයන්ගෙනුත් හොඳ ඉල්ලුමක් තියෙනවා.

කොස් හැදෙන්නෙත් එක වාරයකට විතරයිනේ. ඉතින් අවාරයේ කොස් කන්නත් මේක හොඳ විදියක්.

විජලිත කොස් හදන්න අපිට අවශ්‍ය වෙන්නේ හොඳින් පැසුණු කොස් ගෙඩියක්, වතුර 1L සහ සිට්‍රික් ඇසිඩ් 1gක් පමණයි. ඇසුරුම් කිරීම සඳහා පොලිපොප්ලීන් (PP) ගේජ් 300 පොලිතින් බෑග් ටිකකුත් අවශ්‍ය වෙනවා.
















### පියවර 1

**කොස් ගෙඩිය කපලා මදුළු වෙන් කරගෙන සමාන තීරු හැඩයට හෝ කොටු හැඩයට කපාගන්න.**

### පියවර 2

**වතුර ලීටරයට සිට්‍රික් ඇසිඩ් 1g මිශ්‍ර කරන්න. හැමදාමත් කියනවා වගේ සිට්‍රික් ඇසිඩ් කියන්නේ ආහාර කල්තබාගැනීමේ ද්‍රව්‍යක්. අවම ප්‍රමාණ යටතේ භාවිතා කිරීම ශරීරයට අහිතකර නැති නිසා ඒ ගැන බයක් ඇති කරගන්න එපා.**

### පියවර 3

**කොස් ටික මේ සිට්‍රික් ඇසිඩ් මිශ්‍රිත වතුරේ දාලා විනාඩි දහයක් විතර තියන්න.**

### පියවර 4

**විනාඩි දහයකට පස්සේ කොස් ටික අරගෙන රෙදි කෑල්ලක පොට්ටනියක් වගේ බඳින්න. මේක ටිකක් විශාල දැල් පෙනේරයකට බස්සලා උතුරන වතුර භාජනයකට දාගන්න. විනාඩි දෙකක් විතර තියලා ක්ෂණිකව සීතල වතුර එකකට දාලා විනාඩි 15ක් විතර තියන්න.**

### පියවර 5

**ඊටපස්සේ විජලන යන්ත්‍රයක ආධාරයෙන් මේ කොස් ටික සෙන්ටිග්‍රේඩ් 55-60ක විතර උෂ්ණත්වයෙන් වියළා ගන්න ඕනේ.**

විජලන යන්ත්‍රයක් නැත්නම් කොස් ටික සුදු යකඩ පෘෂ්ඨයක අතුරලා දිනකට පැය 8 බැගින් දවස් 4-5ක් හොඳින් අව්ව වැටෙන තැනක තියලා වේලගන්න. අපද්‍රව්‍ය වැටෙන්න ඉඩ තියෙන නිසා කොස් ටිකට අඩි 2ක් විතර උඩින් දැල් ආවරණයක් බැඳගන්න.

කොස් කෑල්ලක් අතට අරගෙන දෙකට කඩනකොට පහසුවෙන් කැඩෙනවා නම් කොස් ටික හොඳින් විජලනය වෙලා කියලා හොයාගන්න පුළුවන්.

කොස් අසුරණකොට සුළං නොයන සේ අහුරගන්න එක හරිම වැදගත්. මෙහෙම හදගන්න කොස් මාස හයක් විතර තියාගන්න පුවන්. ඒ වගේම විජලිත කොස්වලට 100g රුපියල් 300 ඉඳලා මිල නියම කරන්නත් පුළුවන්.

**මෙහෙම හදාගන්න කොස් මාස හයක් විතර තියාගන්න පුවන්. ඒ වගේම විජලිත කොස්වලට 100g රුපියල් 300 ඉඳලා මිල නියම කරන්නත් පුළුවන්**

අවශ්‍ය නම් 0714766819 මේ අංකයට කතා කරලා තව විස්තර දැනගන්න පුළුවන්.



**සීතා පොන්නම්පෙරුම**
**ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා**

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**

## උකස් රත්තරං

ඔබ උකස් කළ
ආයතනයට පැමිණ
බේරාදී වැඩි මිලට
මිලදී ගනු ලැබේ
රන්
පවුමකට 175000/=

0773109112

## උකස් රන් භාණ්ඩ

බේරාදී වැඩිම මිලට
මිලදී ගනු ලැබේ.
කැරට් 24 - 190,000/-
කැරට් 22 - 170,000/-
කැරට් 21 - 150,000/-
කැරට් 20, 18,14, 09. රජයේ ලියාපදිංචි ආයතනයකි.

SL PROMO

074 281 93 70

## ඔබගේ සින්න වීමට යන රන් භාණ්ඩ බේරාදී

# වැඩිම මුදලක්

## එවලේම ඔබගේ අතට

## පවුම - 195000

[කැරට් 24]

076 682 1972 / 070 434 6076

## සංවර්ධිත බැංකු ඇබෑර්තු

★ දිවයිනපුරාම බැංකු කිහිපයක පවතින පුරප්පාඩු සඳහා ප්‍රාදේශීය මට්ටමින් අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.

දීමනා 35,000/-
18/40 ගැ/පි
(මැන් පවර් නොවේ)

0702 231 694 | 0702 725 731
0718 853 997 | 0712 564 715
0742 916 140 | 0761 125 624

# උකසට තබා ඇති රන් භාණ්ඩ

ඔබ විසින් උකසට තබා ඇති රන් භාණ්ඩ සින්න වීමට නොදී පැමිණ බේරා දී වැඩිම මිලට ගනු ලැබේ.
ඔබගේ වටිනා රන් භාණ්ඩ සින්න වීමෙන් පසු ඔබගේ අතට මුදල් නොලැබේ.

**මේ අනගි අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න**

හිරුෂිනි

අමතන්න: 076 706 27 10 / 071 497 74 43

## ගුරුගේ එල්ඩස් කෙයා ප්‍රයිවට් ලිමිටඩ්

රෝගී හා නිරෝගී වැඩිහිටියන් සඳහා දීර්ඝකාලීන හා කෙටිකාලීන ආරක්ෂිත නවාතැන්, කාරුණික, පිරිසිදු, වගකීම් සහගත හොඳ සේවාව. හදිසි අසනීප, රෝහල් ගත කිරීම් වෛද්‍ය සායන ආදී සියලු කටයුතු, භාරකරුවන් බරක් නොමැත. යාබද නාන කාමර සහිත තනි කාමර හුවමාරු කාමර හා ශාලා ලෙස ඔබට ගැලපෙන ගෙවීම් ක්‍රම. රජයේ ලියාපදිංචි නිදහස් නිස්කලංක ශාඛා ජාලය

0704 414 444 / 0765 560 608
0767 144 449 / 0761 160 888

## සමීර ගජකේෂරී කරල්

**තාරුණ්‍යයේ චමත්කාරය**

ලිංගික ශක්තිය වර්ධනයට
සහ ස්නායු දුබලතාවයට
ස්ත්‍රී/පුරුෂ
දෙපක්ෂයටම සුදුසුයි




**ලිංගික රෝග පිළිබඳ සායන**
බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා
(පෙ.ව. 9.00 - ප.ව. 3.00)

නොමිලේ පැවැත්වේ.

දින වෙන්කරගෙන පැමිණෙන්න.

සුගත රසායානාගාරය (පුද්) සමාගම
E-Mail: suensuherbals@gmail.com
138/6, අඟුරුවාතොට පාර, හොරණ
034-22 61 306

## ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ

සේවය කිරීමට සාත්තු සේවිකාවන් බඳවා ගැනේ අවුරුදු 35 අඩු කාන්තාවන් සඳහා අවස්ථාව ඇත.
නවාතැන් පහසුකම් ඇත.
ඉහළ වැටුප් ලබා ගත හැක.

සුව අරණ - වාද්දුව

038 - 2 283 024 / 070 - 3 333 760

## මෙවර සාමාන්‍ය පෙළ / උසස් පෙළ / ශිෂ්‍යත්වය ඇතුළු සියලුම විභාගවලින්

**විශිෂ්ට ජයග්‍රහණ ලබා ගැනීම සඳහා පැමිණ හමුවන්න.**

නැතහොත් ලිපියක් මගින් විමසන්න.
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුයි.)

## ප්‍රේම සබඳතා බිඳවැටෙන්නේ ඇයි?
## ව්‍යාපාර/ගේ දොර පාළු වී යන්නේ ඇයි?
## අයුතු සම්බන්ධතා නිසා පවුල් අවුල් වන්නේ ඇයි?

# මෙන්න!

එයින් මිදෙන්න නිසි මඟක්...

අයුතු සම්බන්ධතා නැවතීම

* නිවාස ආරක්ෂා
* නඩුහබ දිනීමට
* දරුඵල ලබීමට

මත්කුඩු සහ සුරාව

* රැකියා ලබා ගැනීමට
* සියලු විභාය සඳහා
* නොවිකිනෙන ඉඩම් විකිණීමට

*විවාහ පමා අයට
*නැරගිය අය ගෙන්වීම
*අසාර්ථක ව්‍යාපාර දියුණුවට

# මාතර වෙද හාමුදුරුවෝ

## ඔබ කුමන හෝ මත්ද්‍රව්‍යකට

# ඇබ්බැහි වූ අයෙක් ද?

## එසේ නම් ඉන් මිදීමට අමතන්න.

වරු තුනෙන් ප්‍රතිඵල පැමිණ හමුවන්න

## අමතන්න 077 362 77 14

හමුවීම
බදාදා, සෙනසුරාදා
පෙ.ව. 8.00 සිට
ප.ව. 3.00 දක්වා

කුරුණෑගල, පොතුහැර
චන්ද්‍රසේල පිරිවෙන්
පුරාණ විහාරයේදී

ශාස්ත්‍රවේදී පණ්ඩිත **මාතර වෙද හාමුදුරුවෝ**

භාරකාරතුමා, ජනසෙත වෙද මැදුර, චන්ද්‍රසේල පිරිවෙන් විහාරය, කොළඹ පාර, පොතුහැර, කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී

## රැකීම හා සුරැකීම

චන්ද කින්නරී මේ අසන්
නුඹේ රැගුමන් හරි හැඩයි
ගැයුමන් ද හරි මිහිරි වෙයි
නමුදු විඳිනට මා බියයි
චන්ද කින්නරී මේ අසන්
ඉන්නේ අප සඳගිරි පව්වේ නොවෙයි

ඔටුනු නැති පරපුරේ බඹදත්
කුමාර තෙද දසත අදටත්
විස පෙවූ හී සරය නැතිවත්
උන්ගේ නෙත් සර ඊට බලවත්

වරක් නොව ඇස දකින සැරයක්
විදී රාගික සිතින් සරයක්
ඉන් මත්ව කැස කවන විලසක්
වැටහීම සත්තකින් අසීරුම කරුණක්

ඇසී උණුවෙන නැතිද දසුනක්
වැලපුණ ද නුඹ නොවෙයි එලයක්
රැකී නුඹව ද දකින එඩියක්
ඇති හදින් ඉමි සැම මොහොතක්

● මහේෂ් සමන් පුෂ්පකුමාර
දැඩිගමුව

## පන්තිය

උතුරා යන යොවුන් වියේ
සමනල පාසල් සමයේ
බාලිකාවේ අපි හිටියේ
එක පන්තියේ එක පේළියේ

සුන්දර සිතුවිලි මැද්දේ
දෙඩමලු රස තෙපුල් අතර
ගෙවුණා ඒ කාලය
දිවියේ මිහිරිම යුගයයි

අප විලසම අපෙ දරුවන්
ගෙවනා පාසල් කාලය
දකිනා විට නෙත් තෙත් වෙයි
සිහි වී මතකේ අතීත

වසර ගණන් ගෙවී ගිහින්
ආයෙත් හමුවෙයි යෙහෙළියෝ
එක බංකුවේ එකම ළඟින්
හිඳ දෙඩමලු වෙමි සතුටින්

ජීවිතයම හරි පුදුමයි
යොවුන් වියේ මතක දිගේ
ආයිත් අපි එක බංකුවේ
ෂුගර් ප්‍රෙෂර් සායනයේ

● නාලනී උයන්වත්ත
ගම්පල

## උදෑසන

මේ
උදෑසන
සිහින
මිහිදන් කළ
උදෑසන

● චමින්ද රොෂාන්

# කවි යාය

ඔබේ කවි නිර්මාණ පහත
ලිපිනයට එවන්න.

"කවි යාය"
'ධරණී' කර්තෘ මණ්ඩලය,
අංක 91,
විජේරාම මාවත,
කොළඹ 07
නැතිනම්
dharanee.editor@liberty.lk
ලිපිනයට ඊමේල් කරන්න

සංස්කරණය - මනෝරා ප්‍රේමතිලක

## අවසානය

ලියනෙමි පුතුට පතමින් සැම දෙවි පිහිට
ආසයි පුතේ නුඹලගෙ තතු දැනගන්ට
හමුවුණේ මහලු මඩමකි පූරුවෙ පවට
කවද හැකිවේද කෙළවර දකින්නට

දුවේ පුතේ නුඹලව දැඩි කරන්නට
කුලී වැඩ කළේ මුළු ගම හතර වට
එවන් මවක් අද ගෙදරින් ඇත් කොට
සතුටක් ලබනවද සෙනෙහස තුරන් කොට

පොඩි අවදියේ නුඹලව කරගන තුරුලු
හිටියේ පැටව් ලෙසටයි කුඩුවෙ කුරුලු
ඒ මවහට දී නෙතගට දුක් කඳුළු
ඇයි තනිකළේ වැඩිහිටි මඩමක මහලු

දහදුක් විඳ දරුවන් ඇති දැඩි කෙරුවා
සිප් සතදී දරුවන් උගතුන් කෙරුවා
මහලුව වියපත්ව මා අසරණ වුවා
අද දින මහලු මඩමක මා තනි කෙරුවා

● ඇග්නස් වෙරෝනිකා අල්විස්
කඳන

## සුන්දර බිරිඳ

උදයම නැගිට දැක්කොතින් හරිම අගේ
සුන්දර සුකොමලයි ඇය නළඟනක් වගේ
පුන්සඳ පැයුවා වාගෙයි මූණ ඇගේ
වෙන කවුරුන්ද ඒ සුන්දර බිරිඳ මගේ

ඇඟිබැමි අඩකවය වාගේ සකස් කර
නාදළු වාගේ තොල්පෙති දෙක පාට කර
නළලේ තිලකේ ඒ ලස්සන දෙගුණ කර
මේ සුන්දරි බැඳගත්තේ රණ්ඩු කර

ඔපාදුපා කේලම් නෑ කියන්නේ
නැති බැරි අයට අතදෙන්නට බලන්නේ
පවුලේ දියුණුවට කටයුතු කරන්නේ
අනුනගෙ වැරදි නෑ කිසිදින සොයන්නේ

ඇස් දෙක මැණික් ගල් වාගේ දිලිසෙනවා
යන එන විටදි ළැම පෙදෙසම ගැස්සෙනවා
දික් වූ කොණ්ඩෙ යටිපතුලේ ගැවෙනවා
ඉටි රූපයක් දෝ සමහරු රැවටෙනවා

සමහර කතුන් දෙඩවනවා පල් හැලි
නෑ කයිවාරු පුරසාරම් මගෙ මාලි
නිතරම රකියි ඇය පන්සිල් පද පේලි
පෙර පිනකටයි මට ලැබුණේ මනමාලි

සතුටින් ඉන්නේ ඇය නිතරම ගීත ගයා
කටහඬ මිහිරි ඒ තරමට බොළඳ ලියා
දිය ගෙන එන්න යයි කළයක් උකුලෙ තියා
දැක්කොත් කෙනෙක් කියනවා ඒ ටිකිරි ලියා

● නන්දසිරි මුරුතලාව
පේරාදෙණිය

## මට ඉතින් මියැදෙන්න බැරුවා

ගෙලේ වැලඳ ගන්න හිතුණා
වසක් බී නිදියන්න හිතුණා
ගිනන්කට බිලිවෙන්න හිතුණා
ජීවිතේ කළකිරිල ගෙවුණා

නියගලා අල කන්න හිතුණා
මුහුදෙ පැන නිමවෙන්න හිතුණා
කෝච්චියෙකුට පණ දෙන්න හිතුණා
අරමුණක් නැති දිවිය ගෙවුණා

කන්දකින් පැන ගන්න හිතුණා
ඇල්ලකින් සැඟවෙන්න හිතුණා
හාමතේ මියයන්න හිතුණා
හුදකලාවෙන් දිවිය ගෙවුණා

ඉකි ගසා වැලපෙන්න හිතුණා
හැංගිලා නිදියන්න හිතුණා
පිස්සු ඇද්දැයි වරෙක හිතුණා
ජීවිතේ නැවතිලා තිබුණා

ඊර්ෂ්‍යාවෙන් දවස ගෙවුණා
වෛරයක් හද ඇද්ද හිතුණා
ක්‍රෝධයෙන් ගිනි අරන් තිබුණා
එකම තැන ජීවිතේ රැඳුණා

ජීවිතේ හැටි පසක් වුවා
අගතියෙන් දැන් උඩට ආවා
නිකරුණේ මම කාලෙ කෑවා
ජීවිතේ හරි මඟට වුවා

හැම දෙයම පිළිවෙලක් වුවා
මට ඉතින් මියැදෙන්න බැරුවා
එපිත ඇය හට අයිති වෙවා
ඇය නිසා පෙම්වතෙක් වුවා

● අනුර විජේසෝම
දූනගහ

## මලක් බඳු ළඳ

නිල් මහනෙල් මල් ඕලු නෙළුම් මල
පිපිලා ඇත මේ විල් ගැඹරේ
මල් නෙලමින් ඔරුවේ සැරිසරනා
ඇය කුසුමක් බඳු ළඳකි ලොවේ

පැන් ඉසලා මල් දෝතට අරගෙන
විහාර මග ඈ රැඳී හිඳී
මල් මිටි විකුණා ලබනා උවමින්
සොඳුරු අනාවක් ඇයද යදී

දහසක් බැතිබර හදවත් අවුදින්
ඇයගෙන් මල් ගෙන බුදුන් වඳී
ඇයගේ කඳුළැල් ඇයගේ ළතැවුල්
සැඟවී ඇත මුළු ලොවෙන් මිදී

● මනෝන්දිකා විජේගුණවර්ධන
පානදුර



## සීමාරහිත

ගසේ තිබුණ ද පැණි දෙඩම් බොහෝ
එද කැඩුවේ ගෙඩි දෙකයි අපි
අයියේ මතකද ඒ අතීතය...?

සුපිරි කඩපිළ ඇතුළේ ඔබ මොබ
ඇවිද ඔබ අද නොඉවසිල්ලෙන්
එකම වර්ගයේ අඩුම කුඩුමය
කුඩ දෙක තුන පුරව ගන්නේ

වැඩිය කඩනා නරක ළමයින්
නොම වුණේ අපි එද විතරද...?

● මාලතී රූපිකා පුංචිහේවා

## දෙවැනි ගමන

සුදු වලා අතරින් පාවෙමින් එබී බලා
සුමුදු සඳ කැන් පතුරා සිනාසී
එබී බලන සඳවතියේ
ළඳ බොළඳියන්ගේ සිනා හඬ
දසත පැතිරෙද්දී
තරු කුමරියන් වටකර
ඔබද ආසිරි පතන්නේ
රන්වන් සේද සලු අන්දවා පලන්ද
කුමරෙක්, කුමරියක් කැන්ද එන නිසාදෝ
අහස්කුසින් බට දෙව්ලියන්
සිනාසී බලා සිටින්නා සේ
කඩුපුල් මල් පිපී සුවඳ හමා යද්දී
සේපාලිකා කැකුලු පෙති විද සැරසෙද්දී
නෑ සිය මිතුරන් පිරිවරාගෙන
පුංචි කැදැල්ලට ගොඩවුණේ
විරාත් කාලයක් සතුටෙන් සාමයෙන්
දිවි ගමන එක්ව යන්නට
එකම අදිටනින් තිර බැඳීමෙන්
සසරේ පතා ආ ලෙසින්ම නේදෝ

● පුෂ්පා නන්දනී
කහවත්ත

## රැකවරණ

මත් වූ බඹරු සරනා විට ගේ අවට
මගෙ නොදරුවෝ බියෙන් දිව එති මා ළඟට
මුර බල්ලෝ තිදෙන බුරමින් ගේ වටට
මා රකිනා අරුමය පවසනු කුමට

ඇසුණි ද හඬන හඬ විසිවසරක් ම පුරා
දැනුණි ද ඉහිලු දුක් කඳ හදවතේ දරා
කුමට ද පැමිණියේ යළි මගෙ ගෙය ම කරා
සිතුණි ද බිඳින්නට මගෙ සිත තිබෙන වෙරා

පෙම් බැඳි සතුට උදුරා ගත් සළෙල හිමි
සිව් දියණියන් හැර ගිය ඔහු නපුරු හිමි
මව් රැකවරණ පමණක් උන්ට කර හිමි
පවිකාරයා පිළි ගම් යළි ලෙස මහිමි

● මියුරින් සොයිසා
රක්වාන




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.